

පළමු කාණ්ඩය
දෙවන කලාපය

2013 -මැයි



ආසියානු මානව හිමිකම් කොමිසමේ ප්‍රකාශනයක්


# ශ්‍රී ලංකාවේ මානව හිමිකම්




**ආසියානු මානව හිමිකම් කොමිසමේ වෙසක් ප්‍රාර්ථනාව** 3
**මාතලේ සමූහ සුසානය පිළිබඳ වෙසක් දින ආවර්ජනා** 4

**ශ්‍රී ලංකාවේ ඩී ෆැක්ටෝ අග විනිසුරුගේ පළමු කැකිල්ලේ තීන්දුව - ගොඩින් බේරා ගන්න!!!** 5



***දණ බිම ගසනු!* නෝනාවරුනි - මහත්වරුනි, *දණ බිම ගසනු!*** 11

***'ආඩම්බරකාර තාත්තා'* ගේ රටේ දරුවන් මියෙන හැටි** 13

**අපි සහ අද කාලේ රාක්ෂයෝ** 17

**සා ර ධ ර් ම කෝ...?** 20

**අයියෝ නීතිපති.... ! අයියෝ නීතිපති.... !** 22

**රාජදාසලාගේ මෙහෙව් රටේ** 24

EXCLUSIVE INTERVIEW with BASIL FERNANDO

පො ලී සි ය ව ධ කා ගා ර ය ක් 27



පොලීසියට මරන්නට බැරි වූ ජෙරාඩ් පෙරේරා 31

**අපි ඔහු පුදමු හිමිකම් ගැන බලවේගෙන්...** 37

**1978 ආණ්ඩුක්‍රමය හෙවත් නෛතික විප්‍රකාරය** 39

**ශ්‍රී ලංකාවේ අධිකරණ ස්වාධීනත්වය පිළිබඳ අර්බුදය- ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් වාර්තාව** 44

**නීතිය නිවාඩුවේ** 50



*සංස්කරණ උපදේශකත්වය*



බැසිල් ප්‍රනාන්දු



Asian Human Rights Commission Ltd.
Unit 701A, Westley Square
48 Hoi Yuen Road
Kwan Tong, KLN
Hong Kong, China
Tel: +(852) 2698 6339
Fax: + (852) 26986367
Web: humanrights.asia


**ගොඩින් බේරා ගන්න!!!**

පිටුව 5











# ආසියානු මානව හිමිකම් කොමිසමේ
# වෙසක් ප්‍රාර්ථනාව

සකල ශ්‍රී ලාංකික බෞද්ධයන් මහත් බැතියෙන්/උත්සව ශ්‍රීයෙන් සහ රාජ්‍ය අනුග්‍රහ ඇතිව සමරන මෙවර වෙසක් පුන් පොහෝ දිනය වෙනුවෙන් ආසියානු මානව හිමිකම් කොමිසම මෙසේ සිය පැතුම් ගෙන එයි.




## පංච සීලය (පන් සිල්)

මේ මූලික විනය රීති පහ බුදු දහම අනුගමනය කරන සෑම බෞද්ධයෙකු විසින්ම පිළිපදියි. බුද්ධ, ධම්ම සහ සංඝ යන තිසරණයේ සරණ යාමෙන් පසුව මෙම පංච සීලය සමාදන්වීම සිදුකරයි.

### 1. පාණාතිපාතා වේරමණී සික්ඛා පදං සමාදියාමි


*පණ ඇති සතුන් මැරීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.*

බලහත්කාරයෙන් සිදුකරන අතුරුදන්වීම් සහ අධිකරණයෙන් පිටත සිදුකරන ඝාතන සහ රැකවරණ ඝාතන සිදුකිරීමේ පුළුල් ලෙස පැතිරී තිබෙන භාවිතය නතර කළ යුතුය. සෑම තැන්හිම මිනීමැරුම් සිදුවන බවට වාර්තා ඇති අතර රාජ්‍ය යාන්ත්‍රණය නීතිය බලාත්මක කිරීමට අපොහොසත් ව තිබේ. මෙමගින් මිනීමැරුම් සහ සෙසු බිහිසුණු අපරාධ දිරිමත් කරයි. මේ මූලික ශීලය සමාදන් වීමට නම් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් එවැනි ඝාතන හැකි කරවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා බාධක ඇතුළු සියලු බාධක ජයගත යුතුය. ශ්‍රී ලංකාවේ කිසිවෙකුත් මේ සිල් පදය කැඩීමේ ගොදුරු බවට පත් නොවේවා...!

### 2. අදින්නාදානා වේරමණී සික්ඛා පදං සමාදියාමි

*නුදුන් දෙය ගැනීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.*

රට පුරා දූෂණය ඉහවහා ගොස් ඇති අතර අන් අයට හිමි දේ ගැනීම අති දැවැන්ත පරිමාණයකින් සිදුවෙමින් පවතියි. රට පුරා, විශේෂයෙන්ම උතුරු නැගෙනහිර ඉඩම් බලයෙන් අල්ලාගැනීම සිදුවෙයි. ගෞතම බුදුන් වහන්සේ විසින් වදාළ දෙවන සිල් පදය දැවැන්ත ලෙස උල්ලංඝනය වීම නතර වේවා...! අන් අයට හිමි දේ ගැනීමේ සියලු ආකාරයන් නතර වේවා... !




**3. කාමේසු මිච්චාචාරා වේරමණී සික්ඛා පදං සමාදියාමි**
*කාමයේ වරදවා හැසිරීමෙන් මිදීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.*

දූෂණ සහ කුඩා දරුවන් ලිංගිකව අපයෝජනය කිරීම් පිළිබඳ වාර්තා දිනපතාම අසන්නට ලැබේ. ලිංගික අපයෝජනයන් වැළැක්වීමට නීති සාධන යාන්ත්‍රණ අපොහොසත් ව ඇති අතර නඩු කීමට සහ විනිශ්චය ලබාදීමට ද එය අසමර්ථ වී සිටියි. තුන්වන සිල්පදය නිර්ලජ්ජිත ලෙස කැඩීමේ අවසන් වේවා.. ! සියලු කාන්තාවන් ළමුන් සහ අන් සියලු තැනැත්තන් ආරක්ෂා වේවා... !

**4. මුසාවාදා වේරමණී සික්ඛා පදං සමාදියාමි.**
*මුසා බස් දෙඩීමෙන් වැළකී සිටීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.*

සෑම ආකාරයකින් ම භාෂණය අපයෝජනයට ලක්කිරීම රාජ්‍ය මාධ්‍ය වලින් සිදුවන අතර නිදහසේ ජීවත් වීමට බලාපොරොත්තු වන සියල්ලන් වෙත තර්ජනය කිරීමටත් ගැරහීමටත් එය යොදාගැනේ. අනෙක් අතට සද්භාවයෙන් සහ ජනතාව වෙත දයානුකම්පාවෙන් පණිවුඩයක් ලබාදීමට උත්සාහ කරන මාධ්‍යවේදීන් සහ සෙසු අය හට පීඩාකිරීම මගින් භාෂණයේ නිදහස මර්දනය කෙරේ. සිව්වැනි සිල්පදයේ මෙවැනි සියලු අපයෝජනයන් සහ උල්ලංඝනයන් අවසන් වේවා... ! මව්බිම පුරා යහපත් භාෂණ පැතිරේවා... !

**5. සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛා පදං සමාදියාමි**
*රහ මෙර පානය කිරීමෙන් වැළකී සිටීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.*

ඉහළ තිලයන් දරන පුද්ගලයන් විසින් මත්ද්‍රව්‍ය භාවිතයට අනුග්‍රහය දක්වයි. මත් වෙළෙන්දන්ට රජයේ උපකාර ලැබෙයි. මත් ද්‍රව්‍ය භාවිතය විශේෂයෙන්ම තරුණ ජීවිත වනසා දමයි. මත්පැන් භාවිතය බොහෝ පවුල් වනසා දමන්නක් බවට පත්ව ඇත. පස්වන සිල්පදය කැඩීමේ මෙබඳු සියලු දේ නිමා වේවා...! ඒවායින් දුක්විඳින බොහෝ දනන් ගේ විඳවීම අවසන් වේවා...!

නොමිලේ වෛද්‍ය පහසුකම් ලබාගැනීමේ අයිතිය අහිමි කිරීම අකල් මරණවලට සහ පවුල්වල අපමණ විඳවීම්වලට හේතු වේ.

**සියලු සත්වයෝ සතුටින් සිටිත්වා..**
**නිරෝගී කම භුක්ති විඳිත්වා... !**

## මාතලේ සමූහ සුසානය පිළිබඳ
## ආසියානු මානව හිමිකම් කොමිසමේ වෙසක් දින ආවර්ජනා



මාතලේ සමූහ මිනී වළේ වැතිර සිටින පුද්ගලයන් 156 දෙනාගේ අවශේෂයන් ශ්‍රී ලංකාවේ තිබෙන අංගුලිමාල සංකීර්ණය නමැති තත්වය විදහා දක්වන්නක් ලෙස සැලකිය හැකිය. මාතලේ සමූහ මිනී වළ ශ්‍රී ලංකාවේ රහසිගතව මරා දැමූ සහ රහසිගතව වළ දැමූ දස දහස් සංඛ්‍යාත මිනිසුන් පිළිබඳ සංකේතයකි.

වෙසක් සමරන සියල්ලන්ටම මෙම සමූහ මිනී වළ සහ වෙනත් එබඳු සෙසු ඝාතන, මේ රටේ මිනිසුන් පළමු ශික්ෂා පදය වන 'පාණාතිපාතා වේරමණී සික්ඛා පදං සමාදියාමි' වෙතින් කොතරම් ඈත් වී ඇත්ද යන්න පිළිබඳ ප්‍රබල සිහිකැඳවීමක් වනු ඇත.

අංගුලිමාල කතාන්දරය අපට සිහිපත් කර දෙන්නේ පුද්ගලයෙකු දාම මිනීමරුවෙකු විය හැක්කේ කෙසේද යන්නයි. අපේ මෑතකාලීන ඉතිහාසයේ දාම මිනීමරුවන් රාශියක් බිහිවී ඇති අතර ඔවුන්ගෙන් සමහරක් ශ්‍රී ලංකා පොලීසියේ සහ හමුදාවේ උදය වෙත්. තමන් දාම මිනීමරුවන් බවට පත්වීමේ කාරණය සාධාරණීකරණය කිරීමට කැරළිකරුවන් පවා උත්සාහ ගෙන තිබෙන අතර මොවුන් ද එබඳු ය.

මේ සියලු දෑ යුක්ති සහගත සමාජයක ඉතාම ප්‍රාථමික සදාචාරාත්මක පදනම් සමාජයීය වශයෙන් අත්හැර දමා තිබෙන බව විදහාදැක්වීම් ය.

මේ වෙසක් දිනයේ සෑම කෙනෙකුගේම පැතුම විය යුත්තේ අංගුලිමාල සංකීර්ණය හෙළාදැකීම හා එය අත්හැරීමත් පංචසීලයේ පළමු ප්‍රතිපදාවට ගරු කිරීමත් ය.

## ශ්‍රී ලංකාවේ ඩී ෆැක්ටෝ අග විනිසුරුගේ පළමු කැකිල්ලේ තීන්දුව

# ගොඩින් බේරා ගන්න!!!



- ආසියානු මානව හිමිකම් කොමිසම විසිනි

**විධායකය විසින් තනි කැමැත්තට පත් කළ ශ්‍රී ලංකාවේ ඩී ෆැක්ටෝ අගවිනිසුරුවරයා කැකිල්ලේ නඩු තීන්දු දීම ආරම්භ කළේය. ඒ අනුව ශ්‍රී ලංකාවේ අලුත්ම නෛතික ප්‍රවණතාවය වන්නේ ගැටලුව ඇති කළ පුද්ගලයා වෙතම ගොස් ගැටලුව ගොඩින් බේරාගැනීමයි. එවිට වරදකරුවාම තීන්දුකරු බවට පත්වෙයි.**

**එසේනම් ලංකාවට අධිකරණ, විනිසුරුවරුන් හෝ නීතිඥවරුන් කුමටද? මේ සම්බන්ධයෙන් ආසියානු මානව හිමිකම් කොමිසම "ශ්‍රී ලංකාව: අධිකරණයේ අධිකාරිය රැඩිකල් ලෙස අත්හැරීම-බලතල බෙදීමට එල්ල කළ ප්‍රහාරයක්" යන මැයෙන් ඉදිරිපත් කළ විමසුමයි, මේ.**

අග විනිසුරු මොහාන් පීරිස්, මෙයට දින කිහිපයකට ඉහතදී මූලික අයිතිවාසිකම් අයදුම්පතක් තවදුරටත් සලකා බැලීම නතර කර දැමුවේ, නඩුවට අදාළ ගැටලුවල අභ්‍යන්තරට යාම සඳහා අවශ්‍ය තාක්ෂණික නිපුණත්වය අධිකරණයට නොමැති බව සඳහන් කරමිනි. මෙම තීරණය දෙනු ලැබුවේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවට එරෙහිව ගොනු කර තිබූ මූලික අයිතිවාසිකම් නඩුවකදී ය. බීබීසී සිංහල සේවය වාර්තා කළේ, නීතීඥවරුන් ශ්‍රී ලංකාවේ තිබෙන හැම ප්‍රශ්නයක් ගැනම නඩු ගොනු නොකළ යුතු යැයි ද අගවිනිසුරුවරයා

තවදුරටත් සඳහන් කළ බවයි.



අදාළ ආණ්ඩුවේ ආයතන සමග මෙකී ගැටලු විසඳාගැනීම සඳහා කතාබස් කරන ලෙසට නීතීඥයන් විසින් ස්වකීය සේවාදායකයන් හට උපදෙස් දිය යුතු යැයි ද ඔහු සඳහන් කළේය. ඔහු නැවත නැවතත් කියා සිටියේ මෙකී නඩුවලදී උද්ගත වන තාක්ෂණික ගැටලු බොහොමයක් විමසා බැලීම සඳහා අධිකරණයට ශක්නුවත් බවක් නොමැති බවයි.

තාක්ෂණික නොහැකියාව මත මූලික අයිතිවාසිකම් අයදුම්පතක් විභාග කිරීම අත්හිටුවීමේ මෙම ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණ විසින් මෙබඳු තීන්දුවක් ප්‍රකාශයට පත් කළ ප්‍රථම අවස්ථාවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කරන පරිදි, මූලික අතියිවාසිකම් අයදුම්පතක් ගොනු කළ වහා, අධිකරණය එහි හරය විමසා බැලිය යුතු වන අතර, එහි විභාගකිරීමට කරුණක් තිබේ නම් අධිකරණය විසින් එහි වගඋත්තරකරුවන්ට නොතීසි නිකුත්කර නඩු විභාගය සඳහා නියම කළ යුතුය. මෙම අවසන්න අදියරේදී නීතීඥවරුන් විසින් සිය ලියකියවිලි සම්පූර්ණ කර සිය කරුණු කියාපෑම් ඉදිරිපත් කළ විට අධිකරණය විසින් ගැටලුව පිළිබඳ තීන්දුවක් ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. නඩුව විමසා බැලීම සඳහා තාක්ෂණික නිපුණතාවක් නොමැති වීමේ පදනම මත අධිකරණය විසින් ආණ්ඩුක්‍රම ව්‍යස්ථාමය විධිවිධාන අනුගමනය කිරීම ප්‍රතික්ෂේප කළ ප්‍රථම අවස්ථාව මෙයයි.

අගවිනිසුරුගේ මෙම තීරණය ශ්‍රේෂ්ඨාධිකරණයේ තත්වයට බරපතළ ලෙස හානි සිදුකරනු ඇත. ශ්‍රී ලංකාවේ නීතියේ පදනම මත තමන් ඉදිරියේ තබන සියලු ගැටලු විනිශ්චය කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය ශක්නුවත් යැයි බලාපොරොත්තු වේ. වාර්තා වූ පරිදි අගවිනිසුරු කියා තිබෙන්නේ අදාළ මහජන ආයතන වලට සම්බන්ධ ගැටලු විසඳීම නීතීඥවරුන් විසින් භාරගත යුතු බව සහ එහිදී ඒවාට මැදිහත් වී ඒවා සමථයකට පත් කළ යුතු බව ය.

## නඩු මාර්ගය සහ ගොඩින් බේරාගැනීම අතර වෙනස

ඔහුගේ/ඇයගේ අයිතිවාසිකම් ආණ්ඩුවේ අධිකාරියක් මගින් උල්ලංඝනය වී ඇති බව සහ ඔහු/ඇය එකී උල්ලංඝනය සඳහා හානිපූරණයක් සිදුකරගැනීම සඳහා නීතියේ පිහිට තිබිය යුතු බවට සිතන පාර්ශවයක් සමග නඩු කීමේ ක්‍රියාවලිය ආරම්භ වේ. එබඳු ගැටලුවක් නැවත සාකච්ඡා මේසයට යොමුකිරීම වනාහී සමස්ත ගැටලුවම අධිකරණයෙන් පිටත තැබීමකි. අධිකරණයේ අධිකරණ බලය මගින් නඩුකියන්නාට නීතියෙන් හිමිවන දෑ සොයාබැලීමක් සිදුකරයි. ඔහු/ඇය අධිකරණයට එන්නේ අධිකරණය සිය නීතිමය හිමිකම් සාක්ෂාත් කරනු ඇතැයි සහ ඒවාට අදාළ මහජන අධිකාරිය ගරුකරනු ඇතැයි යන පදනමෙනි. ඔහු සිය ගැටලුව යොමුකරන්නේ අධිකරණමය තීන්දුවක් සඳහා මිස මුල්

අගවිනිසුරුගේ මෙම තීරණය ශ්‍රේෂ්ඨාධිකරණයේ තත්වයට බරපතළ ලෙස හානි සිදුකරනු ඇත.

ශ්‍රී ලංකාවේ නීතියේ පදනම මත තමන් ඉදිරියේ තබන සියලු ගැටලු විනිශ්චය කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය ශක්නුවත් යැයි බලාපොරොත්තු වේ.

වාර්තා වූ පරිදි අගවිනිසුරු කියා තිබෙන්නේ අදාළ මහජන ආයතන වලට සම්බන්ධ ගැටලු විසඳීම නීතීඥවරුන් විසින් භාරගත යුතු බව සහ එහිදී ඒවාට මැදිහත් වී ඒවා සමථයකට පත් කළ යුතු බව ය.

අවස්ථාවේදීම සිය අයිතීන් උල්ලංඝනය කර තිබෙන මහජන අධිකාරියේ තීරණයක් සඳහා නොවේ.

අධිකරණය ඉදිරියේ සිය ගැටලු විභාග කිරීමෙන් නඩු කියන්නන් නෙරපා හැරීම මගින් නඩු කියන්නන්ගේ අයිතිවාසිකම් බරපතළ ආකාරයට උල්ලංඝනය වෙයි. අධිකරණය යම් ගැටලුවක් තුළට ගමන් නොකරන බව සහ සාමාන්‍ය නෛතික ක්‍රියාදාමයට ඉඩ නොදෙන බවට තීරණය කරන විට පුරවැසියා නීතියේ නිසි ක්‍රියාදාමයෙන් පිටත තැබෙයි.

| තීන්දුවේ බලපෑම | |
|---|---|
| 1 | **පාර්ශවයන් දෙකක් සිටින නඩුවල-උදාහරණයක් වශයෙන්, මහජන අධිකාරියක් එ. පුරවැසියෙක් හෝ පුරවැසි කණ්ඩායමක් සිටින නඩුවලදී ආරාවුල කථිකාවක් හෝ කතාබහ කිරීමක්** (negotiation) **මගින් විසඳාගත යුතු නම්, එම මහජන අධිකාරියම එම ආරවුලේ අවසන් තීරකයා බවට පත්වෙයි.** |
| 2 | **නීතිය මගින් සංස්ථාපනය කර තිබෙන කාර්යපටිපාටියේ පදනම අනුව අධිකරණ විසින් නඩු තීන්දු කරනු ඇතැයි කල්පනා කෙරේ. අනාගතයේදී නීතිය මගින් සංස්ථාපනය කළ කාර්යපටිපාටියට ලැබෙනු ඇත්තේ අඩු අදාළත්වයකි. නැතිනම් එහි කිසිදු අදාළත්වයක් නැති වනු ඇත්තේ කතා බහ කිරීම් මගින් අදාළ ආරවුල එම පාර්ශවයන්ටම විසඳාගැනීමට සිදුවන නිසා ය.** |
| 3 | **නෛතික ප්‍රතිකර්මය පිළිබඳ සංකල්පය නැති වී යනු ඇත.** |
| 4 | **මහජනයාගේ අවබෝධය වනු ඇත්තේ තාක්ෂණික ගැටලුවලට සම්බන්ධිත සංකීර්ණ නඩුවල තීන්දු ලබාදීම සඳහා අධිකරණවලට නිපුණතාවක් නැති බව ය. එහි ප්‍රතිඵලයක් ලෙස අධිකරණ සහ විනිසුරන් පිළිබඳ මහජන මතය ඉතාම නරක අතට එනම්, රැඩිකල් වෙනසකට ගමන් කරනු ඇත.** |
| 5 | **නීතිඥයන්ගේ කාර්යභාරය, දැන් තිබෙන අධිකරණයේ නිලධාරීන් ලෙස කටයුතු කිරීමේ සිට පුද්ගලික අතරමැදියන් හෝ කතා බහ කරන්නන් දක්වා ඌනනය වනු ඇත.** |
| 6 | **මහජන අධිකාරීන් සහ පුරවැසියන් අතර පවතින බල තුලනය මහජන අධිකාරීන්ට වාසිදායක ලෙස විශාල වශයෙන් වෙනස් වනු ඇත.** |
| 7 | **දූෂණය ඉහළ යනු ඇත.** |
| 8 | **මහජන අධිකාරීන් සහ පුරවැසියන් අතර පවතින සියලු ආරාවුල් දේශපාලනීකරණය වනු ඇත. බලයේ සිටිනා පාලන තන්ත්‍රයේ දේශපාලන සහයෝගය ලබන පුරවැසියන්ට පමණක් මෙකී කථිකාවන්වලින් යම්කිසි වාසියක් ලැබෙනු ඇත.** |
| 9 | **දේශපාලන වශයෙන් වින්දිතයන් හෝ ගොදුරු බවට පත්ව සිටින පුරවැසියන් හට නීතියෙන් කිසිදු පිහිටක් නොලැබෙනු ඇත.** |
| 10 | **විධායකයේ බලය තවදුරටත් වැඩි වනු ඇත. බලතල බෙදාහැරීම හීනවනු ඇත.** |

එහි ප්‍රතිඵලය වන්නේ, නඩු කියන්නා ව මහජන අධිකාරියේ හොඳහිතට භාජනය කරවීම සහ තමන් විසින් කරන ලද වැරැද්ද නිවැරදි කර ගැනීමට මහජන ආයතනය අකමැති වන්නේ නම්, ගැටලුව එතැනින් නිම වීමයි. මේ අනුව තමන් විසින් සිදුකරන ලද උල්ලංඝනයන් ට අදාළ මූලික අයිතිවාසිකම් අයදුම්පත් සලකා බැලීම සඳහා අධිකරණවලට තාක්ෂණික ශක්නුතාවක් නොමැතිවීම යන පදනම මත අධිකරණ විසින් එකී අයදුම්පත් සලකා නොබලන බව දැනගන්නා නිසා, මහජන අධිකාරීන් ට පුරවැසි අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සඳහා අතිවිශාල බලයක් සැපයෙනු ඇත. මේ අනුව පුරුවැසියන්ගේ අයිතිවාසිකම් වඩාත් නිහීන ලෙස උල්ලංඝනය කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ගනු ලැබූ මේ තීරණය නිසා උද්ගත විය හැකි ප්‍රතිඵලයක් සේ පෙනේ.

## නීතීඥවරුන්ගේ භූමිකාව ට හානි කිරීම

නීතීඥවරුන්ගේ භූමිකාව වන්නේ සිය සේවාදායකයන් විසින් නගනු ලබන නීතියට අදාළ ගැටලුවල වෘත්තීය සේවාව සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම සහ සේවාදායකයන් විසින් එකී ගැටලු අධිකරණය වෙත ගෙන යන්නැයි ඉල්ලා සිටින විට එම ක්‍රියාවලිය සඳහා ඔවුන්ට උපකාර කිරීමයි. අධිකරණයෙන් ප්‍රතිකර්මය නොසොයා ඒ වෙනුවට මහජන අධිකාරීන් සමග පුද්ගලික සමථකරණයන්ට යන්නැයි සිය සේවාදායකයන්ට පවසනු ඇතැයි නීතීඥවරුන්ගෙන් අපේක්ෂා කිරීම ඔවුන්ගේ භූමිකාවට බරපතළ ලෙස හානි පැමිණවීමකි. නීතීඥවරයෙක් යනු හුදු මැදිහත්කරුවෙක් නොවේ.

> **සියලු රටවල නීති මගින් මේ ගැටලුවට විසඳුමක් සොයාගෙන තිබේ. එම විසඳුම වන්නේ අධිකරණය ඉදිරියට කැඳවන විශේෂඥ මත මාර්ගයෙන් එය සිදුකිරීමයි. අධිකරණයට සාක්ෂි කැඳවීමේ මාර්ගය හරහා විශේෂඥ මත ඉල්ලා සිටීමට පුළුවන් අතර එසේ ඉදිරිපත් වන විශේෂඥ මතයන් මත පදනම් ව අධිකරණයට සිය තීන්දු ලබාදීමට පුළුවන.**

සිය අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇතැයි සිතන හෝ සිය හිමිකම් වලට ගරු කර නැතැයි සිතන පුද්ගලයන් වෙත ලබාදිය හැකි ප්‍රතිකර්ම අනුව සහ නෛතික ක්‍රියාදාමය අනුව නීතීඥවරයාගේ භූමිකාව නිශ්චය වේ. නීතිඥවරයා සහ ඔහුගේ/ඇයගේ සේවාදායකයා අතර පවතින සම්බන්ධතාවය පදනම් වන්නේ සේවාදායකයන්ගේ ගැටලුව පිළිබඳ අවබෝධය මත ය. එම අවබෝධය අනුව සේවාදායකයාගේ ගැටලුව සම්බන්ධයෙන් අධිකරණයක් ඉදිරියේ නෛතික ප්‍රතිකර්මයක් තිබේද නොතිබේද යන්න පිළිබඳ උපදෙස් ලබාදීම නීතීඥවරයාගේ රාජකාරියයි. නීතියේ නිසි අවබෝධය මත සේවාදායකයා අධිකරණයට සිය ගැටලුව ගෙන යාමට අදහස් කරයි නම්, නීතීඥවරයා ඔහුට/ඇයට සහයෝගය ලබාදීමට බැඳී සිටියි. නීතීඥවරයාගේ කාර්යභාරය වන්නේ සේවාදායකයන්ට ඔවුන්ගේ නෛතික හිමිකම් අත්නොහරින ලෙසට උපදෙස් ලබාදීමයි. එසේ අත්හරින ලෙසත්, මහජන අධිකාරීන් සමග සමගි සමාදානයකට යන ලෙසත් සේවාදායකන්ට උපදෙස් ලබාදීම දක්වා නීතීඥවරයාගේ භූමිකාව හීන වේ නම්, එය නීතීඥවරයාගේ භූමිකාවේ සිදුවන මූලිකම රූපාන්තරණයකි. විපරීතයකි. මේ මාර්ගයෙන් නීතීඥවරු, මහජන අධිකාරීන් සහ ඔහුගේ/ඇයගේ සේවාදායකන් අතරට යන අතරමැදියන් බවට පත්වෙති. මේ අතර තමන්ට ඔවුන් ඉදිරියට පැමිණීමට හේතුවක් නැතැයි පවා මහජන අධිකාරීන් විසින් නීතීඥවරුන්ට පැවසීමට ඉඩ තිබේ.

## තාක්ෂණික ගැටලු සඳහා නිපුණතාව සම්බන්ධයෙන් වන ප්‍රශ්නය

අධිකරණය ඉදිරියට එන බොහෝ ගැටලු, ඒවා මූලික අයිතිවාසිකම් මත පදනම් වූ ඒවා වේවා නැතිනම් සිවිල් නඩු පැවරීම හෝ අපරාධ නඩුවිධානය පිළිබඳ හෝ වේවා, ඒවායේදී පැන නගින ගැටලු සම්බන්ධයෙන්

අධිකරණයට සම්පූර්ණ දැනුමක් නොමැති ප්‍රශ්න රාශියක් තිබෙන්නට පුළුවන. සියලු රටවල නීති මගින් මේ ගැටලුවට විසඳුමක් සොයාගෙන තිබේ. එම විසඳුම වන්නේ අධිකරණය ඉදිරියට කැඳවන විශේෂඥ මත මාර්ගයෙන් එය සිදුකිරීමයි. අධිකරණයට සාක්ෂි කැඳවීමේ මාර්ගය හරහා විශේෂඥ මත ඉල්ලා සිටීමට පුළුවන් අතර එසේ ඉදිරිපත් වන විශේෂඥ මතයන් මත පදනම් ව අධිකරණයට සිය තීන්දු ලබාදීමට පුළුවන. යම්කිසි විශේෂිත විෂයයක් සම්බන්ධයෙන් අධිකරණයට තාක්ෂණික දැනුමක් නොමැති වන විටදී අධිකරණය විසින් බුද්ධිමතුන්ගේ දැනුම ලබාගැනීමේ හැකියාවෙන් යුතු යැයි සහ නීතිය පිළිබඳ දැනුමෙන් යුක්ත යැයි අපේක්ෂා කරන අතර මේ අනුව තමන් ඉදිරියේ පළ කෙරෙන විශේෂඥ මත අනුව තීන්දුවක් ලබාදෙනු ඇතැයි අපේක්ෂා කරයි.

අග විනිසුරු මොහාන් පීරිස්ගේ ස්ථාවරය වන්නේ, අධිකරණයට බුද්ධිමතුන්ගේ මතයන් ලබාගැනිමේ හැකියාව සහ තාක්ෂණික ගැටලු සම්බන්ධයෙන් තමන් ඉදිරියේ තැබෙන විශේෂඥයන්ගේ මත සමග ගනුදෙනු කිරීමේ නෛතික දැනුම නොමැති බව නම්, එවිට ප්‍රශ්නය වන්නේ තාක්ෂණික ගැටලු සම්බන්ධයෙන් දැනුම නොමැති වීම නොව අධිකරණවලට නිපුණතාවයක් නැති බව කියාපෑමට නොහැකි ගැටලු පිළිබඳ ව නිපුණතාවක් නොමැති වීමයි. තමන් වෙත සාක්ෂි සමග ඉදිරිපත් වන බුද්ධිමතුන්ගේ දැනුම සම්බන්ධයෙන් නිපුණතාවක් නොමැති යැයි කියාසිටීමට හෝ තමන් ඉදිරියට එන ගැටලු සම්බන්ධයෙන් විශේෂඥයන් නගන ප්‍රශ්න සමග ගනුදෙනු කිරීම සඳහා සුදුසු නීතිමය දැනුමක් නැතැයි කියාසිටීමට අධිකරණයට අයිතියක් නොමැත.

## අධිකරණයේ ක්‍රියාකාරිත්වය අත්හැර දැමීම

තමන් නිපුණත්වයෙන් හීන බව සහ ඒ අනුව සිය ගැටලුවලට නෛතික ප්‍රතිකර්ම සොයන පුරවැසියන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් විමසා නොබලන්නේ යැයි අධිකරණ තීන්දු කරයි නම්, එය පැහැදිලිවම අධිකරණ නියැළිය යුතු වන අධිකරණ ක්‍රියාවන් ඒවා විසින්ම අත්හැර දැමීමකි.

විනිසුරුවරුන් ශ්‍රේෂ්ඨාධිකරණයට පත්කරන විට සිදුකරන එක් උපකල්පනයක් වන්නේ විශේෂඥයන් විසින් ඉදිරිපත් කරනු ලබන සාක්ෂි ද ඇතුළත්ව තමන් ඉදිරියේ තබන සියලු සාක්ෂි විමසා බැලීමේ බුද්ධිමය හැකියාව සහ නෛතික පසුබිම ඔවුන් සතු බවයි. තාක්ෂණික ගැටලු සම්බන්ධයෙන් එබඳු සාක්ෂි ඉදිරිපත් වන විට අත්‍යවශ්‍ය ප්‍රශ්න එකී විශේෂඥයන්ගෙන් විමසීමටත්, එකී ගැටලු සඳහා තීන්දුවක් ලබාදීමට අදාළ වන අත්‍යවශ්‍ය පැහැදිලිකිරීම් ඔවුන්ගෙන් ලබාගැනීමටත් අධිකරණයට අයිතිය තිබේ. විශේෂඥ උපදෙස් ලබාගැනීම හැරුණු විට, අධිකරණය විමසා බලන ගැටලුවට අදාළ විය හැකි පැහැදිලිකිරීම් අධිකරණය ඉදිරියේ තබන ලෙස නීතිඥවරුන්ගෙන් ඉල්ලා සිටීමට ද අධිකරණයට අයිතිය තිබේ. අධිකරණය ඉදිරියේ පැන නගින අදාළ ගැටලු සම්බන්ධයෙන් මගපෙන්වීම සැපයීමට නීතිඥවරු ද සිය වෘත්තියෙන්ම බැඳී සිටිති.

## ශ්‍රී ලංකා නීතිඥද සංගමය සලකා බැලිය යුතු ප්‍රශ්නයක්

නීතිඥවරුන් අධිකරණයට පැමිණීම වෙනුවට මහජන අධිකාරීන් වෙතට යා යුතු බව අගවිනිසුරු විසින් සඳහන් කිරීමේ ගැටලුව නීතිඥ සංගමය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය සමග බරපතළ ලෙස ගණන් ගත යුතු ප්‍රශ්නයකි. නීතියේ පදනම අනුව සිය ස්ථාවරය ඉදිරිපත් කිරීම මගින් නීතිඥ සංගමය මේ ගැටලුව සම්බන්ධයෙන් වන නෛතික තත්වය පැහැදිලි කර ගත යුතු වේ. ශ්‍රේෂ්ඨාධිකරණය මේ ගැටලුව සම්බන්ධයෙන් ගනු ලබන තීන්දුව කුමක් වුවත් එය නීතිය මත පදනම් විය යුතුය. අධිකරණය නීතිය මත පදනම් නොවී තීන්දු ලබාදෙයි නම් එය, අධිකරණ විසින්ම නීතියේ ආධිපත්‍යය උල්ලංඝනය කිරීමකි. මෙය, නීතිය මගින් නියම කර තිබෙන කාර්ය පටිපාටියට මෙන්ම අධිකරණය ඉදිරියේ සහ සිය සේවාදායකයන් ඉදිරියේ ඔවුන්ගේ නෛතික ස්ථාවරත්වයටද බලපෑම් කරන්නක් වන හෙයින් නීතිඥ සංගමය මෙම ගැටලුව සලකා බැලිය යුතු වේ. එසේ කිරීමේදී, මහජන අධිකාරීන් නඩුවල අවසන් බේරුම්කරු වූ අතීත නඩු පරිශීලනයට ගනිමින් මෙම තීරණය මගින් දූෂණය වැඩිදියුණු වියහැක්කේ කෙසේදැයි සැලකිල්ලට ගත යුතු ය.



අධිකරණවල තාක්ෂණික නිපුණතාවය පිළිබඳ නෛතික තත්වය නීතීඥ සංගමය විසින් පැහැදිලි කර ගත යුතු වේ. සමහර සුවිශේෂී විෂයයන්හිදී අධිකරණ විසින් සිය තාක්ෂණික නිපුණතාවය පිළිබඳ ගැටලුව සමග කටයුතු කළේ කෙසේද යන්නට ලෝකයෙන් ඇති තරම් ප්‍රායෝගික දැනුම ලබාගත හැකිය. මෙම ගැටලුව ශ්‍රේෂ්ඨාධිකරණ වෙත ඉදිරිපත් කර ඒ මාර්ගයෙන් විසඳාගත යුතු වේ.

නඩු ගොනු කරන විට මහජන අධිකාරිය එක් පාර්ශවයක් විය හැකිය. පුරවැසියා අනෙක් පාර්ශවයයි. මේ පාර්ශවයන් දෙක අතර තරගයක් තිබේ. අගවිනිසුරුගේ තීන්දුවෙන් අදහස් කරන දෙය නම්, එම පාර්ශවයන්ගේ දෙකෙන් එකකට එකී ගැටලුව සම්බන්ධයෙන් අවසන් බේරුම්කරු බවට පත්වීම සඳහා බලය ලබාදෙන බවයි.

අධිකරණවල තාක්ෂණික නිපුණතාවය පිළිබඳ නෛතික තත්වය නීතීඥ සංගමය විසින් පැහැදිලි කර ගත යුතු වේ. සමහර සුවිශේෂී විෂයයන්හිදී අධිකරණ විසින් සිය තාක්ෂණික නිපුණතාවය පිළිබඳ ගැටලුව සමග කටයුතු කළේ කෙසේද යන්නට ලෝකයෙන් ඇති තරම් ප්‍රායෝගික දැනුම ලබාගත හැකිය. මෙම ගැටලුව ශ්‍රේෂ්ඨාධිකරණ වෙත ඉදිරිපත් කර ඒ මාර්ගයෙන් විසඳාගත යුතු වේ.

ඇත්ත වශයෙන්ම, මේ ගැටලුව ශ්‍රේෂ්ඨාධිකරණය සමග බේරුම්කර ගැනීම සඳහා පමණක් නොව අධිකරණ තුළ නඩු පැවරීම මගින් ද විසඳාගැනීමට නීතීඥ සංගමයට අයිතිය තිබේ. මෙය, නීතිය මගින් සංස්ථාපනය කළ නිසි කාර්ය පටිපාටිය සමග දැවැන්ත නෛතික වැදගත්කමකින් යුතු නිසා අවශ්‍ය නම් නඩු පැවරීම මගින් හෝ නීතීඥ සංගමය අවසානාත්මක ලෙස ගැටලුව විසඳාගත යුතු ව තිබේ.

ශ්‍රී ලංකාව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ වෛකල්පික ප්‍රොටෝකෝලයේ පාර්ශවයක් වන හෙයින් මේ අනුව නඩු පැවරීමට මෙන්ම මේ ගැටලුව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව වෙත ගෙන යාමට ද නීතීඥ සංගමයට හැකියාව තිබේ.

## එක රටක් - අගවිනිසුරු දෙදෙනෙක්





## ආසියාවේ ආශ්චර්යය

# දණ බිම ගසනු! නෝනාවරුනි - මහත්වරුනි, දණ බිම ගසනු!

- බැසිල් ප්‍රනාන්දු විසිනි



ශ්‍රී ලංකාවේ යථාර්ථය කාටුන් ශිල්පියාගේ නිර්මාණශීලී චින්තනය සමග මුසුකොට ඩේලි මිරර් පුවත්පතේ කතුවැකිය සමග පසුගිය දිනෙක පළ වූ මේ කාටූනය, විමසුමට භාජනය විය යුත්තකි.



කාටුන් ශිල්පියා විසින් මෙම කාටූනය නිර්මාණය කිරීමට සම්බන්ධිත ඡායරූපය ද ඩේලි මිරර් පුවත්පතේම පළවිය. එහි දැක්වුණේ මතභේදයට තුඩු දී සිටින එක්සත් ජනතා නිදහස් සන්ධාන පාර්ලිමේන්තු මන්ත්‍රී දුමින්ද සිල්වා හට පොලිස් නිලධාරියෙකු විසින් ආචාර කරන අන්දමයි. කාටුන් ශිල්පියා සිය චින්තනය විශේෂිත සිද්ධියක සිට සාමාන්‍යකරණට ලක්කරන අතර එමගින් සෑම ශ්‍රී ලාංකිකයෙකුම දන්නා ශ්‍රී ලංකා පොලිස් සේවය තුළ සිදුව තිබෙන පරිවර්තනය විස්තර කරයි.

විද්‍යුත් මාධ්‍ය මේ වන විට ශ්‍රී ලංකාවේ යථාර්ථය පිළිබඳ අවබෝධය ලබාගැනීම සහ එම සැබෑ යථාර්ථය පිළිබිඹු කිරීම දිරිගන්වනසුලු ප්‍රවණතාවකි. ඇත්ත වශයෙන්ම මේ ආකාරයට ''හතර ගාතෙන් දණින් වැටීම'' අලුත් දෙයක් නොවේ. දැන් වසර ගණනක සිට මෙම පරිවර්තනය සිදුවෙමින් පවතින නමුත් දේශීය මාධ්‍ය මේ තත්වය මහජනයා ඉදිරියට ගෙනයාමට එක්කෝ අපොහොසත් විය. නැතිනම් අකමැති වූහ.

**සෑම දේශපාලනඥයෙකු ඉදිරියේම දණ නැමීම ඕනෑම නිලයක සිටින සෑම පොලිස් නිලධාරියෙකුගේම බැඳීමයි. ඔවුන් ජාතික ධජයට පමණක් සැලියුට් ගැසූ දිනයන් අයිති අතීතයට ය.**

නේපාල රජ පවුල විසින් එරට පාලනය කරන සමයේ කාන්තාවන්ට රජු පය සේදූ ජලය පානය කිරීමට සිදුවීමේ සම්ප්‍රදායක් විය. දෙවියන්ටත් වඩා වැදගත් ලෙස ඔවුන්ට පෙනී යන දේශපාලකයන් සඳහා ද වත්මන් ශ්‍රී ලංකා පොලීසිය නිසැක වශයෙන්ම එය පවා කරනු ඇත.

නේපාල රජ පවුල විසින්
එරට පාලනය කරන සමයේ
කාන්තාවන්ට රජු පය සේදූ
ජලය පානය කිරීමට
සිදුවීමේ සම්ප්‍රදායක් විය.
දෙවියන්ටත් වඩා වැදගත්
ලෙස ඔවුන්ට පෙනී යන
දේශපාලකයන් සඳහා ද
වත්මන් ශ්‍රී ලංකා පොලීසිය
නිසැක වශයෙන්ම එය පවා
කරනු ඇත.



දැන්, සැබෑ තත්වය විචිත්‍ර ලෙස සහ සහතික වශයෙන්ම නිරූපණය කර තිබෙන අතර, පාලිත දේශපාලකයන් වෙත පළ කෙරෙන පොලීසියේ මේ අලුත් දාසකමේ සෑම අංගයක්ම හෙළිදරව් කිරීම නිසැක වශයෙන්ම මාධ්‍යයේ වගකීම වේ. මාධ්‍ය මෙසේ කරනු ඇත්ද යන්න බොහෝ වශයෙන්ම රඳාපවතින්නේ පොලිස් නිලධාරීන් මෙන් දණින් වැටීමට මාධ්‍ය ආයතන ප්‍රතික්ෂේප කරන්නේද යන්න මත ය.

නිර්මාණශීලී කාටුන් ශිල්පියෙකු විසින් සිදුකර තිබෙන්නේ ඕනෑම පොලිස් නිලධාරියෙකු තමන් දෙස කැඩපතින් බැලූ විට දිස්වන පෙනෙන පරිදි පොලීසියේ ප්‍රතිරූපය පෙන්වා දීමයි. ඉතා පහත් තත්වයකට වැටුණු පොලිස් සේවයක් කිසිදු පාඩමක් උගෙන ගන්නා බවක් නොපෙනෙන නිසා පොලීසිටය ප්‍රත්‍යක්ෂ නොවන පණිවුඩය, ඇත්ත වශයෙන්ම, මහජනතාව වෙත සහ විශේෂයෙන්ම තවමත් සිය විචාරශීලී මනස් අත්නැර තබාගෙන සිටින්නන් සඳහා වේ. මෙවැනි පොලිස් නිලධාරීන්ගෙන් ජනතාවට අපේක්ෂා කළ හැක්කේ කුමන ආකාරයක ආරක්ෂාවක් ද? සැබවින්ම භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර සහ වෙනත් ප්‍රකට ඝාතනයන්ගේ වින්දිතයන් බවට පත්වූවන්ට මීට වඩා කිසිවක් බලාපොරොත්තු විය නොහැක.

වඩාත්ම ගැටලු සහගත ප්‍රශ්නය වන්නේ, කාටූනයෙන් පළ කෙරෙන ඉරියව්ව මගින් පොලීසිය රෝල් මොඩල් කෙනෙක් ලෙස දැක්වෙන්නේද යන්න සහ එය එසේ නම් සමාජයේ හැම කෙනෙක්ම එම උදාහරණය අනුගමනය කරමින් පාලක පක්ෂයේ දේශපාලනඥයෙක් යැයි කියා ගන්නා ඕනෑම අයෙකු ඉදිරියේ දණින් වැටේවිද යන්නයි. පොලීසියේ මෙම දාස භාවය, සමස්ත ජනතාවගේ දාස භාවය පිළිබඳ හුදු විදහාදැක්වීමක්ද?

මේ දිනවල හොඳින් ස්ථාවර වී සිටින මාධ්‍යයන්ට වඩා වැරෙන් හඬ නැගූ අවංක කාටුන් ශිල්පියෙකු හට අපි ආචාර කළ යුත්තෙමු. එවැනි ක්‍රියාවකට ගරුකිරීමක් වශයෙන් කළ හැකි එක් දෙයක් වන්නේ මේ කාටුනය සෑම මේසයක් ඉදිරියේම තබාගෙන ශ්‍රී ලංකාව අද කුමක් බවට පත්වී ඇත්දැයි අප විසින් අපටම සිහිකැඳවා ගැනීමයි.

*(ඡායාරූපය සහ කාටුනය ඩේලි මිරර් පුවත්පතේ අනුග්‍රහය මත පළ කරන ලදී).*



# 'ආඩම්බරකාර තාත්තා'ගේ රටේ දරුවන් මියෙන හැටි



- බැසිල් ප්‍රනාන්දු විසිනි.

**රටම සසල කළ කෑගල්ල සත් හැවිරිදි දරුවාගේ ඝාතනය පිළිබඳ ආසියානු මානව හිමිකම් කොමිසම විසින් 'සත් හැවිරිදි දරුවාගේ මරණය, නොපනත්කම සහ අගතිය'යන මැයෙන් නිකුත් කළ විශේෂ ප්‍රකාශයයි මේ.**

කෑගල්ලේ පුෂ්පකුමාර විජේකෝන් නමැති සත් හැවිරිදි කුඩා දරුවා සුපුරුදු පරිදි පාසල් ගිය අතර සවස 1 ට පමණ පාසලෙන් නිවසට එන්නට පිටත් විය. පියා පාපැදියද සමග සාමාන්‍යයෙන් ඔහුව නිවසට කැඳවාගෙන ඒම සඳහා රැඳී සිටින මං සන්ධිය වෙත පැමිණි ඔහු, පියා පෙනෙන්නට නොසිටි හෙයින් නිවසට පයින් ඇවිදගෙන ඒම ඇරඹීය. එතැන සිට නිවසට ඇති දුර සැතපුමක් පමණ වේ. ඔහුගේ සය හැවිරිදි සහෝදරයා සවස දෙකට පමණ පියාට පවසා ඇත්තේ පුෂ්පකුමාර නිවසට පැමිණ නැති බවයි. පියා හනික නිවසට පැමිණි අතර ඉන්පසු ඔවුහු දරුවා සෙවීම ආරම්භ කළහ. කොතරම් සෙව්වද දරුවා සොයාගත නොහැකි වූ තැන, ඔවුහු පොලීසියට පැමිණිලි කළහ. පොලීසිය ඔවුන්ගේ පුහුණු සුනඛයන් සමග සෙවීම ආරම්භ කළේය. අත්හැර දමන ලද පාලු නිවසක් අසල සුනඛයන් නතර වූ අතර පොලීසිය නිවසට ඇතුලු වූහ. එහිදී, ඔහුගේ ම පාසල් ටයි පටියෙන් ගෙළ සිරකර, ඇඳුම් ඉවත් කර මරා දමා සිටි සත් හැවිරිදි කුඩා දරුවාගේ මළ සිරුර ඔවුන් ට හමුවිය.

මේ සිද්ධිය කෑගල්ල අවට ගම්මානවල මහත් කම්පනයක් ඇති කළේය. දරුවාගේ ගෙළ මිරිකා මරා දමන්නට පෙර ඔහුව ලිංගිකව අපයෝජනයට ලක්කරන්නට ඇතැයි මහජනයා අතර පොදු සැකයක් පවතියි.

අපයෝජනයට ලක්කිරීමෙන් පසුව දරුවෙකුව මරාදැමීම නිතර සිදුවන්නක් නොවන නමුත් ළමා අපයෝජනය වසංගත ස්වරූපයෙන් පැතිරී තිබීම හේතුවෙන් ළමා ආරක්ෂණ අධිකාරීන්, ආගමික නායකයන් සහ රාජ්‍ය

නොවන සංවිධාන මේ පිළිබඳ ප්‍රකාශ ගණනාවක් සිදුකිරීමට මගපෑදී ය. කෙසේ නමුත් ඕනෑම ආකාරයක විරෝධතාවක් ගණන් නොගෙන ඇස කණ පියාගෙන සිටින ආකාරයටම ආණ්ඩුව මේ සිද්ධිය ද එකහෙළා නොතකා හැරියේය. සත් හැවිරිදි පුෂ්පකුමාර දරුවාගේ ඛේදජනක ඝාතනයෙන් කෑගල්ලේ ජනතාව ඉගෙනගෙන තිබෙන්නේ, එය ආණ්ඩුව විසින් එබඳු විරෝධතාවන් කෙරෙහි දක්වන බලවත් නොසැලකිල්ලේ ප්‍රතිඵලයක් බවයි.

අපරාධ පාලනය කිරීමේ හැකියාව සහ අපරාධ සිදුකිරීමෙන් පසු අත්විඳින්නට ලැබෙන බරපතළ විපාක හේතුවෙන් අපරාධකරුවන් අපරාධ සිදුකරන්නට බිය වන සමාජ වටපිටාවක් ඇති කිරීමේ ශක්නුතාවය අහිමිවන තත්වයකට 18 වන සංශෝධනය හරහා ආණ්ඩුව අවතීර්ණ වී සිටියි. අපරාධකරුවන් ට නීතිය කැඩීම පිළිබඳ කිසිදු බියක් නැතිවිට ඕනෑම දෙයක් සිදුවිය හැකිය. මේ අවස්ථාවේදී සැබවින්ම සිදුව තිබෙන්නේ එයයි.

මෑතකදී, තංගල්ල හෝටලයකදී, පෙම්වතා වූ කුරාම් ෂයික් ව මරාදමන අතර බරපතළ ලෙස අපයෝජනයට ලක්කෙරුණු රුසියානු තරුණිය වික්ටෝරියා තචේවා, මේ සාහසික අපරාධය සිදුකළවුන් අත්විඳින විනිර්මුක්තිය පිළිබඳ සම්මුඛ සාකච්ඡාවකදී පැමිණිලි කළාය. ඔවුන් සමග පෙරළා සටන් කරන බව තරයේ කියා සිටියාය. එහෙත් එය පහසු සටනක් නොවේ. මෙම අපරාධයේ ප්‍රධාන සැකකරු වන්නේ තංගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වන සම්පත් චන්ද්‍ර පුෂ්ප විදානපතිරණ යි. ඔහුද දුමින්ද සිල්වා සහ වෙනත් බොහෝ අය මෙන් කිසිදු ආකාරයක ලැජ්ජාවකින් තොරව 'තමන්ගේ' අපරාධකරුවන් ආරක්ෂා කරනා රාජපක්ෂ පවුලේ අනුග්‍රහය බුක්ති විඳියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකළ 18 වැනි සංශෝධනය ආරක්ෂක පවුරක් සේ යොදාගෙන ඇති ආණ්ඩුවේ සමස්ත ප්‍රතිපත්තිය වන්නේ, අපරාධ හිතෛෂී බවයි. අපරාධ හිතෛෂී ආණ්ඩුවක් යනු, ආණ්ඩු පිළිබඳ සාමාන්‍ය වටහාගැනීම තුළ, විසංවාදය හෙවත් ප්‍රතිවිරුද්ධ බවයි. තෝමස් හොබ්ස් (1588 අප්‍රේල් 5-1679 දෙසැම්බර් 4) විසින් නිරීක්ෂණය කළ පරිදි ආණ්ඩුව පැවතෙන්නේ ජනතාව සහ පරම අධිකාරිය අතර ගිවිසුමක ආකාරයෙන් වන අතර, මෙහිදී ජනතාව එකිනෙකාට එරෙහිව සිදුකරගන්නා අපරාධවලින් ජනතාව රැකගැනීමට පරම අධිකාරිය බැඳී සිටියි. එතැන් පටන් මේ දක්වාම රාජ්‍යය පිළිබඳ සිද්ධාන්තයේ සංවර්ධනය මගින් අපරාධ නිවාරණය සහ සිය අධිකරණ බලය තුළ සිටින සෑම පුද්ගලයෙකුගේම ආරක්ෂාව සහතික කිරීම අවධාරණය වී ඇත. මේ අනුව, අපරාධ හිතෛෂී ආණ්ඩුවක් යන්න විපරීතයකි. තමන් ම වැනසෙන මාරක රෝගයකින් එය පීඩා විඳියි.




ආණ්ඩුව අපරාධ හිතෛෂී යැයි අපරාධකරුවන් ට දැනෙන විට අපරාධ සිදුකිරීම සඳහා ඔවුන්ගේ බිය නැති වී යයි. මෙයින් සාහසිකත්වය ඇතිවෙයි. අගතිකාමීන්ගේ කල හොඳ වෙයි.

මෑතකදී, තංගල්ල හෝටලයකදී, පෙම්වතා වූ කුරාම් ෂයික් ව මරාදමන අතර බරපතළ ලෙස අපයෝජනයට ලක්කෙරුණු රුසියානු තරුණිය වික්ටෝරියා තචේවා

නොපනත්කම විසින් විකෘතිකාමයඋපදවයි. ශ්‍රී ලංකාවේ අගතිතිකාමය කොතරම් දුර දිග ගොස් තිබෙන්නේද යන්න, මේ දරුවාගේ ඛේදවාචකයෙන් පැහැදිලි වෙයි. කෙසේ නමුත්, එය අගතිකාමයට පමණක් සීමා නොවේ. ශ්‍රීලංකාවේ කොටස් වෙළඳපොළෙහි හා ජීවිතයේ සෑම තලයකම සිදුවන දෙය, නොපනත්කම සහ විකෘතිකාමය අත්වැල්බැඳගෙන ආධිපත්‍යය පතුරවන ආකාරය අතර, ප්‍රතිපත්තිමය ගැටලුවක් වශයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව විනිර්මුක්තියේ ඇලී ගැලී සිටින අයුරු දක්වයි.

## නොපනත්කම සහ අගතිය අතර දේශපාලන නෑකම

නීතිය ආණ්ඩුවේ ප්‍රධාන සැලකිල්ලක් යොමුවන දෙයක් නොවන විට ප්‍රජාතන්ත්‍රවාදයට ඉතා සරල ලෙස, පැවැත්මක් නැති වේ. ප්‍රජාතන්ත්‍රවාදයේ සාරය වන්නේ ආණ්ඩුව එහි පුරවැසියන් වෙත වගකරවීමයි. රාජ්‍යයකට සිය පුරවැසියන් වෙත වගකිව හැකි එකම ක්‍රමය, නීතිය හරහා පමණි. නියත වශයෙන්ම, වගකීම්සහගත පුරවැසිභාවයේ පරීක්ෂාව, ප්‍රජාවක් එකට බැඳ තබාගන්නා නීති පිළිපැදීමයි. නමුත් රාජ්‍යයම අපරාධ හිතෛෂී වන විට, සමාජයේ නීතියට තැනක් නැති වෙයි. එහි ප්‍රතිඵලය කොටස්වලට කැඩී බිඳී යාමයි.




මෙකී භේද භින්න වීම ශ්‍රී ලංකාවේදී අවබෝධකරගනු ලබන්නේ හැමවිටම වාර්ගික සම්බන්ධතා සම්බන්ධයෙන් පමණි. 1956 භාෂා ප්‍රතිපත්තිය සහ එයින් පසු ඇතිවූ වාර්ගික කෝලාහලවල සිට වාර්ගික වශයෙන් බිඳී ගිය ජාතියක් යන්න පොදු තේමාවක් විය. කෙසේ නමුත් සියල්ලන් ම විසින් මේ තාක් කල් නොතකා හැර තිබෙන දෙය වන්නේ, නීතිය උත්ථම්භනය කිරීමට රාජ්‍යය අපොහොසත් වීම හේතුවෙන් එයටත් වඩා ගැඹුරු භේදභින්න වීමක් සිදුවී තිබෙන බවයි.

මේ භේදය, කුඩා ගම්වැසි ප්‍රජාවන් පවා ඇතුළත් ව සෑම ප්‍රජාවක්ම බෙදා වෙන් කර දමයි. මේ සත් හැවිරිදි දරුවාගේ ඝාතනය සම්බන්ධයෙන් කෑගල්ල ජනතාව මේ වන විට අත්දකිමින් සිටින දෙය, සියලු බැඳීම්වලින් ගැළවී ගිය සදාචාරය සහ එකිනෙකාගේ සමාජ ආරක්ෂාව යි. තමන්ගේ ම අසල්වාසීන් පිළිබඳ අවිශ්වාසය හේතුවෙන් දෙමාපියන්ට සිය දරුවා පාසලට යැවීමට භය වන විට, ඉතාම නරකම සමාජ අර්බුදය එයින් හැඟවේ.

මෙබඳු තත්වයක් තුළ මැතිවරණය වැනි ප්‍රජාතාන්ත්‍රික පරිචයන් ට අරුත් ගැන්විය හැක්කේ මොනවාද? නීතියක් නැති සමාජයක් තුළ නිදහස් සහ සාධාරණ මැතිවරණ පැවැත්වීමට හැකි නොවේ. මැතිවරණ සාධාරණත්වය



හමුදා කඳවුරක් තුළ වූ මිනී වළකින් ඇඹිලිපිටිය දරුවන්ගේ සිරුරු ගොඩගන්නා විට එතැන සිටි එක් අම්මා කෙනෙක් එම අපරාධ කළවුන් පිළිබඳ පැවසුවේ "සත්තුන්ටත් වඩා අන්තයි" යනුවෙනි.

පුෂ්පකුමාරගේ දෙමාපියන් සමග මේ වදන්ම තෙපළන තවත් දස දහස් සංඛ්‍යාවක් දෙනා එක්වී අද දින එයම පවසනු ඇත. අසූ ගණන්වලදී ශ්‍රී ලංකාව පිළිබඳ ඕලන්ද මාධ්‍යවේදියෙකු ('ඝාතන දේශය') යනුවෙන් වාර්තා චිත්‍රපටයක් තැනීය. ආණ්ඩුව අපරාධ හිතෛෂී වන තාක් දුරට එම මාතෘකාව සදා ගැළපෙයි.

පිළිබඳ සියලු සහතික වීම් බක තපස් කතාවලට වඩා වැඩියමක් නොවේ. ආණ්ඩුව මෙබඳු දේ සංවිධානය කරන්නේ, හුදෙක්ම ජනතාව මුළා කරන සෙල්ලමක් ලෙස සහ ව්‍යවස්ථාදායකය සඳහා යම් ආකාරයක ඡායාමාත්‍රයක් නිර්මාණය කිරීම සඳහා පමණක්ම ය. නීතියක් නොමැති කම හෙවත් නොපනත්කම විසින් හැම දෙයක්ම කෙළසා දමයි. මිනිස් ශරීරයක රුධිර සෛලවලට වැළඳී ඇති ලේ පිළිකාවක් මෙන් ක්‍රියාකරයි. අද අප සිටින්නේ එබඳු තැනක ය.

ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ මහජන විරෝධතා පැන නැගිය යුත්තේ කුමක් සඳහාද යන්න නොපනත්කමේ ගැටලුවයි. මේ සිද්ධියෙන් පෙන්වා දෙන පරිදි මෙකී බියකරු සත්වයා පරදවන තෙක් පවුලක් ආරක්ෂිත නොවේ. කෙසේ නමුත්, වික්ටෝරියා කචේවා වැනි පුද්ගලයන් වටහාගනිමින් සිටින පරිදි, මේ බියකරු සත්වයා පැරදවීම පහසු කාර්යයක් නොවේ. අපරාධ හිතෛෂී ආණ්ඩුවක් එම සත්වයාගේ පැවැත්ම සහතික කිරීමට අපරාධම යොදාගනියි. කෙසේ වෙතත් දශක ගණනක් මුළුල්ලේ මුහුණ දී සිටින ගැඹුරු භේද භින්නතාවය සුවපත් කර ගැනීමට නම් මේ ආකාරයේ තත්වයකට මුහුණ දීම සඳහා ජනතාවම විසඳුම් සොයාගත යුතු වේ. භයානක දැවැන්ත සතුන් ගැන ද උන් පරාජය කළ වීරයන් ගැන ද මිත්‍යා කථාන්දරයන් හි විස්තර වේ. ඒවා මගින් සංකේතාත්මකව පෙන්වා දෙන දෙය නම්, ශ්‍රී ලංකාව දැන් මුහුණ දී සිටින ආකාරයේ තත්වයයි. ආරක්ෂකයා විය යුතු ආණ්ඩුවම ජනතාවගේ ආරක්ෂා අහිමි කරන බියකරු සත්වයා බවට පත් ව සිටියි.

හමුදා කඳවුරක් තුළ වූ මිනී වළකින් ඇඹිලිපිටිය දරුවන්ගේ සිරුරු ගොඩගන්නා විට එතැන සිටි එක් අම්මා කෙනෙක් එම අපරාධ කළවුන් පිළිබඳ පැවසුවේ "සත්තුන්ටත් වඩා අන්තයි" යනුවෙනි. පුෂ්පකුමාරගේ දෙමාපියන් සමග මේ වදන්ම තෙපළන තවත් දස දහස් සංඛ්‍යාවක් දෙනා එක්වී අද දින එයම පවසනු ඇත. අසූ ගණන්වලදී ශ්‍රී ලංකාව පිළිබඳ ඕලන්ද මාධ්‍යවේදියෙකු ('ඝාතන දේශය') යනුවෙන් වාර්තා චිත්‍රපටයක් තැනීය. ආණ්ඩුව අපරාධ හිතෛෂී වන තාක් දුරට එම මාතෘකාව සදා ගැළපෙයි.



# අපි සහ අද කාලේ රාක්ෂයෝ

හඬනු මැන මාගේ පෙම්බර දේශය
හඬනු මැන.
හඬ ගා අසනු මැන
මන්දැයි ඉඩ නොදෙන්නේ රාක්ෂයන්ට
වනසා පොඩිපට්ටම් කරනට ආලෝකය.

බලන්න අර උඩ වසා නැති වෑන් තුන
එළඹෙන ඝන අන්ධකාරේ
හිතාමතාම
එකම දුර පරතරයක් පවත්වාගන්නා හැටි.

උන් සෙමෙන් ඇදේ.

පෙරමුණේ වාහනේ
ගෙන යන්නේ කඳවුරක තරුණ සිරකරුවන්
සහ සොල්දාදුවන් ටික දෙනෙක්.

ඒ එක එකා
සිරකරුවෙක් බැගින් අල්ලා
උඩ දමති හරියට
ළමයින් බැලුම්බෝල උඩ දමන්නා සේ.

දක්ෂ කුරුමාණම්කාරයෙක්
ගනියි සිය ඉලක්කය
සූර ඇඟිලි ගෙනයමින්.


තෙවැනි වෑන් රියෙන්
දුවගෙන එන සොල්දාදුවන් ටික දෙනෙක්
පෙට්‍රල් දමා ගිනි තියති,
තුවාළ ලත් තරුණයන්ට.
වෑන් තුන නැවතත් ගමනේ
එකම පරතරයක් පවත්වා ගනිමින්
ඊළඟ සිරකරුව බැලුමක් කර උඩ දමන තෙක්.

භූමිතෙක් වැක්කෙරෙන විට
වෑන් රිය ආපස්සට යයි
ඉතිරි වී ඇති එකම සිරකරුත් රැගෙන.

මාතලේ සමූහ මිනී වළක් හෑරුවා.
එයින් සිරුරු එකසිය පණහක
කොටස් ගොඩගත්තා.

බොහොමයක් අතර සමහරෙක්
උතුරේ, දකුණේ සහ නැගෙනහිර.

මේවා තමයි අලුත් රකුසන්ගේ වැඩකිඩ
නූතන භෞතික විද්‍යාවෙත් පුරාණ පාරභෞතික විද්‍යාවෙත්
දීගයෙන් මැවුණු.




නූතන රකුසෝ වැඩිපුර දුෂ්ටයි
ඔළු නවයක් ඇති විෂ මකරාටත් වඩා
මෙඩූසා ට හෝ මිනොටෝර්ටත් වඩා.

තීසියස්, පර්සියස් සහ හර්කියුලිස්
දුර්වල වැඩියි
අලුත් කසායවලින් උපන්
මේ රකුසන් හීලෑ කරන්නට
ඔවුන්ට බැරි තරම්.

ඇතැම්විට සියලු සාගරවල ගැඹුරේ,
සහ සාගර වන් මිනිස් සිත්වල උපන්.
කැලතිය යුතුය ඔවුන්ව නැවත
නැවතත්....

හොඳ අලුත් කසායක් හැදෙන තෙක්
හොඳ බලයෙන් යුක්තව
නූතන රකුසන්
ගොම ගෑවී නැසී යන්නට හැකි තරම්
බලයක් ලැබෙන තෙක්.

හඬන්න මගේ දයාබර දේශය, හඬන්න.
තෙරක් නොපෙනෙන මහා ශෝකය
නැති වී යන තෙක් හඬන්න.

අලුත් යෝධයන් නැගේවි
හෙලනීය යෝධයන්ගෙන් වෙනස් වූ
ඔවුන් අත්කර ගනීවි අපේ මානසික බලය
අපේ සාමූහික හිරිහැර දියකර හරිනට.

- බැසිල් ප්‍රනාන්දු විසිනි



*බැසිල් ප්‍රනාන්දු සිය පළමු කාව්‍ය සංග්‍රහය වෙළුම A New Era to Emerge යනුවෙන් 1972 වර්ෂයේදී පළ කළේය. එතැන් පටන් ඔහු විසින් ඉංග්‍රීසි බසින් කාව්‍ය සංග්‍රහ කිහිපයක් සහ සිංහල බසින් කාව්‍ය සංග්‍රහ දෙකක් පළ කර තිබේ. ඔහුගේ කාව්‍යයන් ශ්‍රී ලංකාවේ සහ අන්තර්ජාතික පද්‍ය සංග්‍රහයන් කිහිපයක පළ වී ඇත. ආසියානු සහ බටහිර භාෂා ගණනාවකට ඔහුගේ කාව්‍යයන් පරිවර්තනය විය. සුන්දරමෛත්‍රී යනුවෙන් ඔහුගේ කාව්‍ය සංග්‍රහයක් මලයාලම් බසට ද නැගුණේය. 1983 වර්ෂයේදී ඔහු සහ රිචඩ් සොයිසා, මහාචාර්ය යැස්මින් ගුණරත්න විසින් ප්‍රකාශිත New Ceylon Writings හි කවිපන්තිය වෙනුවෙන් පළමු ත්‍යාගය දිනාගත්තේය.*
*බැසිල් ප්‍රනාන්දුගේ කවි වෙතට*
*http://www.basilfernando.net/modules.php?name=Content&pa=list_pages_categories&cid=15 ඔස්සේ පිවිසිය හැකිය.*





# සා ර ධ ර් ම කෝ...?

- බැසිල් ප්‍රනාන්දු විසිනි.

අන්තර්ජාතික නීතීඥ සංගමය, 'නීත්‍යානුකූල භාවයේ අර්බුදය' යන මැයෙන් සිය වාර්තාවේ විධායක සංක්ෂිප්තය නම්කරමින් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් සඳහා පහත නිර්දේශ ඉදිරිපත් කරයි.

මෙකී නිර්දේශ ශ්‍රී ලංකා බලධාරීන් ගණන් ගනු ලබන්නේ කෙබඳු බරපතළ ආකාරයකින්ද, ඒවා අතරින් වහාම ක්‍රියාත්මක කරන්නේ කෙබඳු නිර්දේශ ද යන කරුණු පොදු රාජ්‍ය මණ්ඩලය විසින් තක්සේරු කළ යුතු අතර විශාල ප්‍රවේශමකින් යුතුව ඒවා සලකා බැලිය යුතුය.

*(1) බලතල බෙදීම, නීතියේ ආධිපත්‍යය, යහ පාලනය හා ඔවුන්ගේ ප්‍රඥප්තියේ සඳහන් මානව හිමිකම් ඇතුළත් හරයාත්මක අගයන් සහ මූලධර්මයන්ට ඔවුන් ගරුකරන්නේද යන්න.*




*(2) මීළඟ පොදු රාජ්‍ය මණ්ඩලයීය ප්‍රධානීන්ගේ රැස්වීම ශ්‍රී ලංකාවේ පවත්වනු ලැබුවහොත් සහ ඉදිරි වසර දෙක සඳහා මූලාසන කාර්යාලය ලෙස ශ්‍රී ලංකාව කටයුතු කරන්නේ නම් එයින් පොදු රාජ්‍ය මණ්ඩලයේ කීර්තිය වැඩිවනු ඇත්ද නැතිනම් ඔපයෙන් අඩුවනු ඇත්ද යන්න.*

අන්තර්ජාතික නීතීඥ සංගමය පොදු රාජ්‍ය මණ්ඩලයෙන් ඉල්ලා සිටින්නේ, ශ්‍රී ලංකාවේ තත්වය සමාලෝචනයකට ලක්කර පොදු රාජ්‍ය මණ්ඩලයීය ප්‍රඥප්තියේ සඳහන් මානව හිමිකම්, බලතල බෙදීම හා නීතියේ ආධිපත්‍යය ඇතුළත් හරයාත්මක අගයන් ට ශ්‍රී ලංකාව ගරු කරන්නේ යැයි පොදු රාජ්‍ය මණ්ඩලයට තෘප්තිමත් විය හැකිද යන්න විමසා බලන ලෙස ය.

පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල් අතර සම්බන්ධතා තිර කරන හරයාත්මක අගයයන් ගැන ශ්‍රී ලංකාවේ ස්ථාවරය කුමක්දැයි අන්තර්ජාතික නීතිඥ සංගමයට සහතික වීමට නොහැකි බව පෙනී යන අතරතුර තමන් ඔය කියන කෙහෙල්මල් 'හරයාත්මක අගයන්' තමන් ගණන් නොගන්නේ යැයි ශ්‍රී ලංකා ආණ්ඩුව කෑ මොර දෙමින් කියයි.

ගතවූ කාලය සැලකිල්ලට ගන්නා විට අප්‍රේල් මස මුල් සතිය තුළ පමණක්, එකී හරයාත්මක අගයන් සම්බන්ධයෙන් දරන මතය කුමක්දැයි ප්‍රකට සිදුවීම් හතරක් මගින් ශ්‍රී ලංකාව සිය දේශීය ජනයාටත් විශාල වශයෙන් සෙසු ලෝකයා හටත් පෙන්වා දුන්නේය. එකී සිදුවීම් හතර වන්නේ,

*1. නීතිපතිවරයාගේ උපදෙස් මත අමාත්‍ය මර්වින් සිල්වාගේ පුත් මාලක සිල්වා සහ සෙසු හයදෙනෙක්, කොළඹ හිල්ටන් රෙසිඩන්සීස් හි මේජර් චන්දන ප්‍රදීප් සූසාන් හට පහරදීම සඳහා වූ චෝදනාවලින් නිදහස් කෙරිණි. තමන්ට පහරදුන් බවටත් හමුදාව විසින් තමාට ලබාදුන් ගිනි අවිය වූදිතයා සොරකම් කළ බවටත් මේජර් ප්‍රදීප් පැමිණිලි කළේය.*

*2. පැපිලියාන ෆැෂන් බග් සාප්පුවේ වූ වෙළඳභාණ්ඩවලට සහ එයට අයත් වාහනවලට දැඩි අලාභ හානි සිදුකිරීම වෙනුවෙන් චෝදනා ලබාසිටි බෞද්ධ භික්ෂූන් වහන්සේලා කිහිපනමක් ඇතුළු පුද්ගලයන් 17 දෙනෙක්, සාප්පුවේ හිමිකරු සමග එකඟතාවයකට එළඹීමේ පදනම මත මුදා හරින ලදී. අධිකරණ අමාත්‍යවරයා එම නිදහස් කිරීමට විරෝධය පාමින් ලිපියක් යැවූ අතර බීබීසී සම්මුඛ සාකච්ඡාවකදී සඳහන් කළේ එම එකඟතාවය යම් බලපෑමක් මත එළඹුණු එකක් වූ බව ය.*

*3. කහවත්ත කොටකෙතන එකම පවුලේ මව සහ දියණිය ඝාතනය කිරීම සම්බන්ධව වසරක පමණ කාලයක් රිමාන්ඩ් භාරයේ තබාගත් ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ හිටපු මන්ත්‍රී ලොකුගමහේවගේ ධර්මසිරි සහ ඔහුගේ සහායකයා වූ සනත් 'චූටිමල්ලි' නන්දන, නීතිපති උපදෙස් මත මුදාහරින ලදී.*


මහේස්ත්‍රාත් දිසා විනිසුරු රැසකට ස්ථාන මාරු

Home » Court » මහේස්ත්‍රාත් දිසා විනිසුරු රැසකට ස්ථාන මාරු

දිවයින පුරා උසාවි වල මහේස්ත්‍රාත්වරුන් රැසකට ස්ථාන මාරුවීම් ලැබී ඇතැයි වාර්තා වනවා. ඒ අනුව කොළඹ අලුත්කඩේ ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා ලෙස සේවය කළ රශ්මි සිංගප්පුලි කඩුවෙලට යවා ඇති අතර අලුත් කඩේ අංක 4 අධිකරණයේ ප්‍රසන්න අල්විස් මහතාවත් මාරු කර ඇති අතර අලුත් කඩේ අංක 5 ටිකිරි ජයතිලක මහතා ගම්පහට මාරු කර ඇත. අලුත් කඩේ අංක 6 අධිකරණයේ සඳුන් විතාන මහතා පානදුරට යවා ඇත(ඔහු දුමින්ද සිල්වා පරීක්ෂා කිරීමට අවශ්‍ය බව දැන්වූ මහේස්ත්‍රාත්වරයායා) අලුත් කඩේ අංක 8 අධිකරණයේ කෝසල සේනාධීර රුවන් වැල්ලට මාරු කර ඇත.

මේ අතර අනුරාධපුර දිසා විනිසුරුවරිය ලක්මාලි හේවාවසම් මහනුවරටත් ගම්පහ දිසා විනිසුරු ඉන්දික අත්තනායක අනුරාධපුරටත් ගල්කිස්ස අතිරේක මහේස්ත්‍රාත් රුචිර වැලිවත්ත පානදුරටත් මාතර අතිරේක දිසා විනිසුරු තිළිණ ගමගේ කොළඹ කොටුව මහෙස්ත්‍රාත් ලෙසත් පත් කර ඇත. අවිස්සාවේල්ල අතිරේක දිසා විනිසුරුවරිය දර්ශිකා විමලසිරි මහරටත් පානදුර අතිරේක දිසා විනිසුරු වසන්ත ජිනදාස කඩුවෙලටත් මාරු කර ඇත.

සාමාන්‍යයෙන් එක ස්ථානයක සේවා කාලය වසර 3 ක් සම්පූර්ණවීමෙන් පසු මෙවැනි වෙනස්කම් සිදුකරන නමුත් මෙම ඇතැම් වෙනස්කම් සිදු කර ඇත්තේ එසේ සම්පූර්ණවීමට ප්‍රථම බවද වාර්තා වනවා.

*4. අගවිනිසුරු ආචාර්ය ශිරානි බණ්ඩාරනායක මැතිනිය දෝෂාභියෝගය මගින් ඉවත්කිරීමෙන් පසුව මේ වන විට පහළ අධිකරණ විනිසුරුවරුන් විශාල සංඛ්‍යාවකට ස්ථාන මාරුවීම් ලබාදීම සඳහා කටයුතු පිළියෙළ වෙමින් පවතියි. දූෂණ චෝදනා මත වැඩ තහනම් කළ කොළඹ අතිරේක දිසා විනිසුරු අරවින්ද පෙරේරා නැවත පත්කරනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා සේවය අත්හිටවූ විනිසුරුවරයෙක් නැවත සේවයේ පිහිටුවීම සඳහා අධිකරණ සේවා කොමිසමට බලපෑම් එල්ල වී ඇතැයි අධිකරණ සේවා කොමිසමේ හිටපු ලේකම් මංජුල තිලකරත්න පැමිණිලි කර තිබේ.*

ඉහත සඳහන් කළ වඩාත්ම මෑතකාලීන සිදුවීම්, නීතියේ ආධිපත්‍යය, අධිකරණයේ ස්වාධීනත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදය වැනි හරයාත්මක අගයයන් ගර්භාවෙන් යුතුව හෙළාදැකීම නතර කිරීමට ආණ්ඩුව කිසිම ආකාරයකින් සූදානමින් නැති බව අතිශය පැහැදිලිව විදහා දක්වන සිද්ධි විශාල සංඛ්‍යාවකින් යුත් ලැයිස්තුවක එක් කුඩා කොටසක් පමණකි.

සංහිඳියාව සහ වගවීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ රෙගුලාසිය මුහුණ දී තිබෙන ගැටලුව වන්නේ, පොදු රාජ්‍ය මණ්ඩලය සහ අන්තර්ජාතික ප්‍රජාව විසින් අවධාරණය කරන, එම සියලු අන්තර්ජාතික සම්බන්ධතා පදනම් ව ඇති හරයාත්මක අගයන් පිළිබඳ සිය වගවීම ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ප්‍රත්‍යක්ෂ කළ යුතු වන විට, ශ්‍රී ලංකාව සිය සැකසුමෙන්ම මෙකී සියලු හරයාත්මක අගයන් අත්හැරදැමීම පිණිස කැපවී ක්‍රියාකිරීමයි.

මෙකී හරයාත්මක අගයන් සහ ශ්‍රී ලංකා ආණ්ඩුව අතර ඇති පරතරය, පොළොවේ සිට සඳ වෙත ඇති දුර සා විශාල බව ශ්‍රී ලංකාවේ ජනයා දනිති.

සංහිඳියාව සහ වගවීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ රෙගුලාසිය මුහුණ දී තිබෙන ගැටලුව වන්නේ, පොදු රාජ්‍ය මණ්ඩලය සහ අන්තර්ජාතික ප්‍රජාව විසින් අවධාරණය කරන, එම සියලු අන්තර්ජාතික සම්බන්ධතා පදනම් ව ඇති හරයාත්මක අගයන් පිළිබඳ සිය වගවීම ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ප්‍රත්‍යක්ෂ කළ යුතු වන විට, ශ්‍රී ලංකාව සිය සැකසුමෙන්ම මෙකී සියලු හරයාත්මක අගයන් අත්හැරදැමීම පිණිස කැපවී ක්‍රියාකිරීමයි.

මෙකී හරයාත්මක අගයන් සහ ශ්‍රී ලංකා ආණ්ඩුව අතර ඇති පරතරය, පොළොවේ සිට සඳ වෙත ඇති දුර සා විශාල බව ශ්‍රී ලංකාවේ ජනයා දනිති. කෙසේ නමුත් මේ බව, එනම් ශ්‍රී ලංකාවේ පාලනය ව්‍යූහාත්මක වශයෙන් මේ වන විට පදනම්ව තිබෙන්නේ එක්සත් ජාතීන්, පොදුරාජ්‍ය මණ්ඩලය සහ අන්තර්ජාතික ප්‍රජාව විසින් අවධාරණය කරන හරධර්ම පද්ධතියකට වඩා ඉතාම ප්‍රතිවිරුද්ධ වෙනත් පද්ධතියක් මත බව අන්තර්ජාතික ප්‍රජාව තවම ග්‍රහණය කරගෙන නැත.



# අයියෝ නීතිපති.... !
# අයියෝ නීතිපති.... !

නීතිපතිවරයා ස්ත්‍රී දූෂණ සහ ළමා අපයෝජන පිළිබඳ සංඛ්‍යාලේඛන එකතු කිරීමට සැරසෙන බවට වාර්තා වේ. එය සිදුවන්නේ එය සිදුවිය යුතුව තිබූ කාලයට වඩා බෙහෙවින් ප්‍රමාද වී ය. මෙබඳු කෘෘර අපරාධ පිළිබඳ වාර්තා නිසි ලෙස පවත්වාගෙන යාමක් ශ්‍රී ලංකාව විසින් නොකරන බව අපි කණගාටුවෙන් යුතුව නිරීක්ෂණය කරමු.

මාධ්‍ය වාර්තාවලට අනුව, පරීක්ෂණය සහ දත්ත එක්රැස් කිරීම සිදුවන්නේ ස්ත්‍රීන්ට සහ ළමුන්ට එරෙහිව සිදුවන අපරාධ පිළිබඳ කටයුතු කරන රජයේ ආයතන වන අධිකරණ අමාත්‍යාංශය, ළමා සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය හා පොලීසියේ කාන්තා සහ ළමා ආරක්ෂණ බියුරෝව විසිනි.

සංඛ්‍යාලේඛණ එක්රැස් කිරීමට, පොලිස් ස්ථානවලට වාර්තා වන පරිදි කාන්තාවන් හා ළමුන් හට හිරිහැර කිරීමේ සිද්ධි ඇතුළත් ය. මෙම යෝජනාව පිළිබඳ කතා කරමින් නීතිපති පාලිත ප්‍රනාන්දු පැවසුවේ තොරතුරු එක්රැස් කළ වහාම කාන්තාවන් හා ළමුන් ට හිරිහැර සිදුකිරීමට එරෙහිව නව නීති සකසනු ඇති බවයි.

මෙය, වසර කිහිපයකට පෙර ඇතැම් සිවිල් සංවිධාන විසින් කවියට නැගූ ස්ත්‍රී දූෂණය සහ ළමා අපචාර පිළිබඳ ජනප්‍රිය සිංහල සටන් පාඨයක් සිහියට නංවයි. එය ලියැවී තිබෙනුයේ ආයාචනයක විලාසයෙනි.

අයියෝ! නීතිපති අයියෝ නීතිපති
මැරයෝ ඇවිත් දැරියෝ දූෂණ කරති
මිනී මරති වධහිංසා පමුණුවති
මොනවා කරන්නටදැයි ජනයෝ අසති

ඔව්, නීතිපතිතුමනි, ස්ත්‍රී දූෂණ සහ ළමා අපචාර වළක්වාලීමට සමත්වනු ඇතැයි දුප්පත් සහ අහිංසක ජනතාව දශලක්ෂ ගණනක් ඔබ දෙස බලා සිටිති. ඔබ පැවසූ දෙය වහාම සහ ඵලදායී ලෙස ක්‍රියාවට නංවනු ඇතැයි ඔවුහු බලාපොරොත්තු වෙති.

නමුත් මේ අලුත් යෝජනාව සාදරයෙන් පිළිගැනීමට පෙර, මෙවැනි අපරාධවලින් කොපමණ සංඛ්‍යාවක් පොලිස් වාර්තාවල සටහන් වන්නේද, කොපමණ සංඛ්‍යාවක් අධිකරණයට යන්නේද සහ ඒවායින් කීයක් වරදකරුවන් ට දඬුවම් පැමිණවීමෙන් අවසන් වන්නේද යන්න පිළිබඳ කතා කිරීම අත්‍යවශ්‍ය ය. ශ්‍රී ලංකාවේ අධිකරණ වාර්තා පෙන්වා දෙන්නේ ස්ත්‍රී දූෂණ හා ළමා අපචාරවල වරදකරුවන් ට දඬුවම් පැමිණවීමේ ප්‍රතිශතය, වෙනත් ඕනෑම අපරාධයක් මෙන්ම ඉතාම වේදනාකාරී ලෙස අඩු මට්ටමකම පවතින බවයි. පැමිණිලි නිසි ලෙස සටහන් කර නොගැනීම, සාක්ෂි එක්රැස්කර ගැනීමට අසමත් වීම සහ ප්‍රධාන වශයෙන්ම සමාජයේ අපකීර්තියට ලක්වේ යැයි හැඟීම නිසා අති බහුතරයක් සිද්ධිවලදී වින්දිතයන් විසින් නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට තිබෙන අකමැත්ත ඇතුළත් විවිධ හේතු නිසා මෙය සිදුවේ. ඔවුන් ට එය අධිකරණයේ නිකරුණේ කල් ගත කිරීමකි. පීඩාකාරී කාර්පටිපාටීන්වලට මුහුණ දීමකි. තවත් විටෙක, තමන් ට මුහුණදීමට සිදුවූ ඛේදනීය අත්දැකීම, ප්‍රසිද්ධියේ කියාසිටීම සහ හෙළිකිරීම මගින් වින්දිතයා දෙවරක් විපතේ හෙළීමකි. (Double Victimization)

මේ සියල්ලට ම පසුව ඔවුන්ට කිසිදු සානුකම්පිත බවක් නැති හෝ මද අනුකම්පාවක් පමණක් ඇති සුපුරුදු පරිසරයටම ආපසු ගොස් ඕපාදූප හෝ නින්දා අපහාසවලට ලක්වීටම ඔවුන් ට සිදුවේ.

මේ අනුව තොරතුරු එක් රැස් කිරීමට අමතරව, පැමිණිලි නිසි ලෙස වාර්තාවන්නේද, නිසිලෙස විමර්ශනය වන්නේද සහ වරදකරුවන් අධිකරණයට පමුණුවා දැඩි දඬුවම් ලබන්නේද යන්නද සොයාබැලීම අත්‍යාවශ්‍ය ය.

වඩාත්ම වැදගත් කරුණ වශයෙන්, අධිකරණ අමාත්‍යාංශය, ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය සහ පොලිස් දෙපාර්තමේන්තුව හරහා ස්ත්‍රී දූෂණ හා ළමා අපචාරවල වින්දිතයන් වෙත සමාජය දක්වන ආකල්පයේ වෙනසක් ඇතිකිරීම අත්‍යවශ්‍ය වේ.

DailyMirror - Opinion



# රාජදාසලාගේ මෙහෙවි රට

මේක මහ පුදුම රටකි.
කොතරම් පුදුම රටක්දැයි කියන්නේ නම්, දැන් දැන් මේ රට, ජනවර්ග දෙකක් පමණක් ජීවත් වන රටක් බවට පත්ව තිබේ.
එක වර්ගයක් නම් රාජපක්ෂලා ය.
අනෙක් වර්ගය උන්ට ගැතිකම් සහ දාසකම් කරන රාජදාසලා ය.
රාජපක්ෂලා රටට ආදරය කරන්නේලු. ඒ නිසා රට කන්නේලු.

එවිට රාජදාසලා හුරේ දමන්නේලු.

අතිගරු උතුමා ප්‍රශ්න කළ නොහැකි දෙවියාය. එතුමා රටේ නීත්‍යානුකූල අගවිනිසුරු කාන්තාව හිතුමතයේ දොට්ට දමන්නට කටයුතු කළ අතර එතුමාගේ එක් පුත්‍රයෙක් සිය සුජාත බව මොනවට ප්‍රකට කරමින් නීතියේ යුවතිය සිය උපන්දින කේක්ගෙඩිය මත අයිසින් කර කපාගෙන කෑවේය.






මේ අතර අතිගරු උතුමාගේ තවත් සුජාත පුත්‍රයෙක් රගර් තරගයක දිනුම තමන්ට නොදුන් නිසා විනිසුරුවරයාට පහර දුන් අතර තමන් තමන්ටම පහර දී ගත් බව නොකියා නීතියට අනුව 'චැලෙන්ජ්' කරන්නට ගොස් රාජ උදහසට පත්වූ එම විනිසුරුවරයා මේ වන විට පණ බයෙන් සැඟවී සිටියි.

නීතිපති උතුමා සිය අලුත්ම වැඩකිඩ සමගින් කළ එළියට ආවේ ඔය අතර ය. මුළු රටම බියවැද්දූ රත්නපුර කහවත්ත කොටකෙතන කාන්තා ඝාතන අතරින් මව සහ දියණිය කෙළසා මැරූ රාජපාක්ෂික චූදිතයා, උන් හිටිගමන් නිදහස් කළේ එතුමා ය. ඒ විතරක් නම් මදෑ... රූපිකාවක් සමග මෝටර් රථය පණ ගන්වාගෙන මාලක සිල්වාත් නීතියෙන්ම නිදහස් වී කොහේදෝ ගියේය. ලැයිස්තුව තව දිග අතර, සිය මොළයෙන් ඉතිරිවී තිබෙන සුළු ප්‍රමාණය පවුලේ අය සමග ගැවසීමෙන් වැඩෙන නිසා ගෙදර යාමට අධිකරණයේ අවසර පැතූ දුමින්ද සිල්වා, ඔහුගේ අයියාගේම පුවත් සේවයට අනුව 'හාස්කමකින්' සුව වී පසුදිනම සුබ නැකතින් ගෙදර ගියේය. දැනට එය නීතිපතිතුමාගේ වැඩක් නොවුණත්, ඉදිරියේදී එතුමා මෙතුමා නිසා ද කාර්ය බහුල වීමට ඉඩ තිබේ. අතිගරු උතුමාට නොකළ හැකි හාස්කමක් නැත. ඒ හාස්කම් කොතරම් ප්‍රබලදැයි කියන්නේ නම්, කොටකෙතන හිටපු මන්ත්‍රී ධර්මසිරි සහ මාලක නිදහස් වූ හැටි තමන්වත් නොදන්නා බව කියා සිටියේ ආණ්ඩුවේම ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙකි.



මේ සියලු හුටපට අස්සේ, රාජපක්ෂලා නොවන, රාජදාසලා ද නොවන සංජානනයක් ඇති මිනිසුන් අති සුළුතරයක් ද මේ රටේ තවමත් සිටිති. *මේ වන විට වාරණයට ලක් ව තිබෙන ලංකාවේ ජනප්‍රියම පුවත් වෙබ් අඩවියක* මාලකලා ධර්මසිරිලා නිදහස් වූ පුවත පිළිබඳ එබඳු පාඨකයෝ අදහස් දක්වා තිබුණෝය. ඒ සියලු අදහස් අතරින් වැඩිම ජනමතය දිනාගත් පාඨක වැකිය වූයේ මෙයයි. *"නීතිපතිතුමාගේ අම්මා මා ආදරයෙන් මතක් කළ බව කියන්න...!"*





# පොලීසිය වධකාගාරයක්



## ආසියානු මානව හිමිකම් කොමිසමේ නිර්මාතෘ/විධායක අධ්‍යක්ෂ බැසිල් ප්‍රනාන්දු මහතා පොලිස් වධ හිංසාව පිළිබඳ ලබාදුන් විශේෂ සම්මුඛ සාකච්ඡාව

**ප්‍ර : පොලිස් වධ හිංසාව නීති විරෝධී කියල ඔබ කොහොමද කියන්නෙ...?**

පොලිස් වධ හිංසාව නීතියෙන් තහනම් කෙරුව දෙයක්. ලංකාවේ පොලිස් වධ හිංසාවට විරුද්ධ ව නීතියක් තියෙනවා. ඒ තමයි 1924 අංක 22 දරණ පනතෙන් ඕනෑම පොලිස් නිලධාරියෙක් හෝ ඕනෑම රජයේ නිලධාරියෙක්, හමුදා නිලධාරියෙක් හෝ එස්ටීඑෆ් එකේ නිලධාරියෙක් හෝ රහස් පොලීසියේ නිලධාරියෙක් විසින් වධ හිංසාවක් සිදුකළහොත් එම පුද්ගලයාව අවුරුදු හතක සිර දඬුවමකටත් රුපියල් 10 000 ක දඩයකටත් යටත් කළ යුතුයි කියලා ලංකාවෙ නීතියෙ සඳහන් වෙනවා. නඩු හයකදි විතර එහෙම අයට දඬුවම් කරලත් තියෙනවා. ඉතා පැහැදිලිවම ලංකාවෙ ව්‍යවස්ථාවෙනුත් පොලිසිය හා වෙනත් රජයේ ආයතනවලින් සිදුකරන වධ හිංසාවන් තහනම් කරල තියෙනවා. එවැනි වධ හිංසා කළ කෙනෙකුට විරුද්ධ ව ශ්‍රේෂ්ඨාධිකරණයේ මානව හිමිකම් නඩු ගොනුකරලා ඔහුට විරුද්ධ ව දඬුවම් පැමිණවීමට ඇති හැකියාව ප්‍රකාශයට පත් කරල තියෙනවා. ඒ වගේම ලංකාව නොකඩවාම ජාත්‍යන්තරය සහ සෑම ස්ථානයදීම කියා සිටිනවා මේ අපරාධය ලංකාවෙ රජයේ නිලධාරීන්ට කරන්නට කිසිම අවස්ථාවක ඉඩ දෙන්නෙ නෑ කියලා. ඒක තමයි ආණ්ඩුව මේක ගැන සිදුකරන ප්‍රකාශය. ඉතින් මේ සියලුම දෙයට අනුව පොලීසිය විසින් වධ

හිංසා කිරීම අපරාධයක් ය කියන එක ගැන කිසිම කෙනෙකුට කිසිම සැකයක් ඇති කරගන්න කිසිම හේතුවක් ඇත්තෙ නෑ. නමුත් මේ ප්‍රශ්නය අහන්න හේතුව වෙන්න ඇත්තෙ, ඉතින් එය අපරාධයක් නම්, මේ පොලිස් ස්ථාන ඇතුළෙ, හැම පොලිස් ස්ථානයක් ඇතුළෙදි වගේම මේ මිනිස්සුන්ට පහර දෙන්නෙ මොකද කියලා. එතන තමයි ප්‍රධානම ප්‍රශ්නෙ තියෙන්නෙ. පොලිස් නිලධාරීන් කියන්නෙ නීතිය ක්‍රියාත්මක කිරීමට ඉන්න නිලධාරීන්. එතකොට කොහොමද මේ පොලිස් ස්ථාන ඇතුළෙම නීතිය කඩන්නෙ? කොහොමද ඉහළ නිලධාරීන් මේවට ඉඩ දීල තියෙන්නෙ? ඉතින් මෙතන තියෙනවා ගැටලුවක්. ඒ ගැටලුව තමයි, ඒ ගොල්ලන්ගෙ විශ්වාසයක් තියෙනවා, අපරාධ මර්දනය කරන්න බෑ කියල ගහන්නෙ නැතිව. වධ හිංසා පමුණුවන්නෙ නැතිව කවුරුවත් ඇත්ත කියන්නෙ නෑ කියලා. ඇත්ත කියෝගන්න නම් ගහන්න ඕනෙ කියලා. එතකොට මෙතන ලොකු පරස්පරවිරෝධීතාවක් තිබෙනවා, නීතියෙන් කියනවා මේක කරන්න බෑ කියලා. නිලධාරීන් තුළ මුල් බැහැගත්ත මතයක් තියෙනවා මේක නැතිව බෑ කියලා. එතකොට මේ නීතිය ගැන තියෙන විශාල ගැටලුව විසඳන්න කවුරුවත් ඉදිරිපත් වෙන්නෙ නෑ. රජය ඒ ගැන නිහඬව ඉන්නවා. අධිකරණය ඒ ගැන අරන් තියෙන ක්‍රියාමාර්ගත් සෑහීමකට පත්වෙන්න බෑ. ඒ අතරෙ ඉතාම බරපතළ විදිහට නීතිය කඩ වෙන්න පොලිස් ස්ථාන ඇතුළෙදිම ඉඩ දීල තියෙනවා. ඉතින් ඒකයි තියෙන ප්‍රශ්නය. එහෙම නැතිව මේක නීති විරෝධී ද නීතියට පටහැණි ද කියන එක නෙවෙයි. ඒක හරිම පැහැදිලියි. නමුත් ඇයි නීතිය මේ අවස්ථාවෙදි ක්‍රියාත්මක කරන්නෙ නැත්තෙ..? ඇයි මේ වගේ වධ හිංසාවට ඉඩ දීල තියෙන්නෙ...? දැන් මෙතැනදි තමයි ගැටලුව මතුවෙන්නෙ, මිථ්‍යා මතයක් තියෙනවා, මිනිස්සුන්ට ගහලා අපරාධ අඩුකරන්න පුළුවන් කියලා. දැන් ලංකාවෙ අවුරුදු සීයකට වැඩි කාලක් ඉඳල ගහනවනෙ. ඉතින් අපරාධ අඩුවෙලා තියෙනවද? පොලිසිය ගහන එකෙන් අපරාධ අඩුවෙනව නම් ලංකාවෙ ගහන ප්‍රමාණය අනුව අපරාධ නැතිවෙලා තියෙන්න එපැයි. නමුත් මේ ගහන එකෙන් ලෝකෙ කොයි තැනක අපරාධ නැති කරල නෑ.



කඩයක මස් කපන්න තියෙන පුහුණුව තරම්වත් පොලිසියෙ රාජකාරි කරන්න පුහුණුවක් දෙන්නෙ නෑ.

මස් කඩයට ආව මිනිහා මස් කපන මිනිහා දිහා බලාගෙන ඉඳල පුහුණු කරනව වගේ පොලිසියට බැඳෙන කෙනාට මිනිස්සුන්ට ගහන කෙනා දිහා බලාගෙන ඉඳල පුහුණුකරන තත්වයක් තමයි, ලංකාවෙ තියෙන්නෙ.

අපරාධ නැති කරන ක්‍රමය, අපරාධ පරීක්ෂණ ක්‍රමවේදය පිළිබඳ නිසි පුහුණුව ඇති පොලිස් නිලධාරීන් ඇති කරලා ඒ නිලධාරීන් ට ඒවා විද්‍යානුකූල ව පිළිගත හැකි ක්‍රමවලට කිරීමට ඉඩදීම. ලංකාවෙ මේ දෙකම නැහැ. එහෙම පුහුණුවුණු නිලධාරීනුත් නැහැ. මස් කඩයක මස් කපන්න තියෙන පුහුණුව තරම්වත් පොලිසියෙ රාජකාරි කරන්න පුහුණුවක් දෙන්නෙ නෑ. මාස තුන හතරක අභ්‍යාස විද්‍යාල පුහුණුවක් කියල තියෙනවා. ඒකෙදි ලබාදෙන දේශනාවලින් කිසිම වැදගත්කමක් නැහැ එදිනෙදා වැඩකටයුතුවලට. මස් කඩයට ආව මිනිහා මස් කපන මිනිහා දිහා බලාගෙන ඉඳල පුහුණු කරනව වගේ පොලිසියට බැඳෙන කෙනාට මිනිස්සුන්ට ගහන කෙනා

දිහා බලාගෙන ඉඳල පුහුණුකරන තත්වයක් තමයි, ලංකාවෙ තියෙන්නෙ. කොයිම විදිහකින්වත් බුද්ධිමය ආකාරයකට, නූතන ලෝකයට පිළිගන්න පුළුවන් විදිහකට, අපරාධ නැති කිරීමේ ක්‍රමවේදයකට අනුව වැඩ කිරීමේ පුහුණුවක් ඔවුන්ට ලබාදීලත් නැහැ. යම්විදිහක පුහුණුවක් තියෙන අයට එහෙම කරන්න ඉඩකඩ දීලත් නැහැ. අපරාධ වැඩිවෙන්නෙ මේ නිසයි.

"මිත්‍යා මතයක් තියෙනවා, මිනිස්සුන්ට ගහලා අපරාධ අඩුකරන්න පුළුවන් කියලා. දැන් ලංකාවෙ අවුරුදු සීයකට වැඩි කාලක් ඉඳල ගහනවනෙ. ඉතින් අපරාධ අඩුවෙලා තියෙනවද? පොලිසිය ගහන එකෙන් අපරාධ අඩුවෙනව නම් ලංකාවෙ ගහන ප්‍රමාණය අනුව අපරාධ නැතිවෙලා තියෙන්න එපැයි."



අපරාධ වැඩිවීමේ වගකීම තියෙන්නෙ මේ ගුටිකන දුප්පත් මිනිස්සුන්ට නෙවෙයි. ඒකෙ වගකීම තියෙන්නෙ ආණ්ඩුවට. ලොකු අපරාධකාරයන්ට ගහන්නෙ නෑ. විශාල ප්‍රමාණයෙන් අපරාධ කරල ආව මිනිස්සුන්ට ගහන්නෙ නෑ. ළඟදී ජනතා විමුක්ති පෙරමුණේ රැස්වීමකට බෝම්බ ගහල තිබුණනෙ. දෙන්නෙක්ව මැරිල තිබුණනෙ. දැන් ඒ මනුස්සයට අල්ලගෙන ගැහුවද? ඒ වැරැද්ද කෙරුව බව කියන අපරාධකාරයට විරුද්ධව වරෙන්තු විශාල ගණනක් තියෙනවා. නමුත් ඔහු සුඛෝපභෝගී ජීවිතයක් ගත කරමින්, පොලීසියෙ නිලධාරීන්ගෙනුත් ආචාර ලබාගෙන හිර ගෙවල්වලට පවා නිකම් ගිහිල්ල මිනිස්සුන්ව බලල එන තත්වයකින් ජොලියෙ ඉඳල තියෙනවා. ඉතින් ලොකු අපරාධ කරන හැම කෙනෙක්ම හොඳට ජොලියෙ ඉන්නවා. නමුත් අහිංසකයෝ ටිකක් අල්ලගෙන. කවුද ගුටි කන තරමක් ගුටි කන්නෙ? අන්තිම දුප්පත් මිනිස්සු. සියයට අනූවකට වඩා කිසිම අපරාධයකට සම්බන්ධකමකුත් නැති මිනිස්සු. කොහොමද අපරාධයකට සම්බන්ධයක් නැහැයි කියන්නෙ? ඒ ගොල්ලන්ට විරුද්ධ ව අවසානයට නඩුදාල ඔප්පු කෙරුව නඩුවක් නැහැ. තමන්ට ගැහුව බව අධිකරණයෙදි කිව්ව ගමන් පොලිස් නිලධාරීන් ඒ ගොල්ලන්ගෙ බේරීම සඳහා කටයුතු කරනව මිසක් ඒ නඩුවටවත් යන්නෙ නෑ. ඒ නිසා මෙතන නීතිය පිළිබඳ ප්‍රශ්නයක් නෙවෙයි තියෙන්නෙ. නීතිය හොඳ නෑ කියල හිතාගෙන ඉන්නවා. පොලීසියෙ ඉහළ නිලතල සහ පොලීසියෙ වැඩ කටයුතු, ලංකාවෙ තියෙන නීතියට අනුව වැඩකරන්න බෑ, ඒව හොඳ නෑ කියාගන්න කට්ටියට බාර දීල තියෙනවා. එතකොට නීතිය ප්‍රතික්ෂේප කිරීම ගැන ප්‍රශ්නය මිසක් නීතිය නැතිකම ගැන ප්‍රශ්නයක් නෙවෙයි මෙතන තියෙන්නෙ.

## ප්‍රඃ මේ පවතින පොලිස් වධ හිංසාවට හේතුවෙන්නෙ මොන වගේ කරුණුද?

හේතු වෙන්නෙ මම අර මුලින් කිව්ව වගේම අපරාධ පරීක්ෂණය පිළිබඳ නිසියාකාර පුහුණුවක් නැතිකම. දැන්, වෛද්‍යවරුන්ව, ගණකාධිකාරිවරුන්ව පුහුණු කරනව වගේ, ගුරුවරුන්ව පුහුණු කරනව වගේ අපරාධ විමර්ශනයත් පුහුණුවකින් පසුව කළ යුතු රස්සාවක්. නමුත් මෙච්චර වැදගත් දෙයකට හරියට පුහුණුවක් නැහැ. මාස තුන හතරකට අභ්‍යාස විද්‍යාලයකට අරිනවා. නමුත් පුහුණුව ලැබෙන්නෙ එතැනින් නෙවෙයි. පොලිසියට ආව දා ඉඳලා අනිත් අය කරන විදිහ බලාගෙන ඉඳල කරන්න කියන තත්වය ඇති කරනවා. ඉහළ නිලධාරීන්, ස්ථානාධිපතිවරු, ඒ වගේම ASP පට්ටම් දරන අය මේ ගහන ඒව බලාගෙන ඉන්නවා. වෛද්‍යවරු වැඩකරන කොට ඉහළ නිලධාරීන් බලන් ඉන්නවා මේ වෛද්‍යවරු වැඩ කරනවද කියලා. ඉස්පිරිතාලෙ වැඩකරනව නම් එයා ගැන බලන්න කෙනෙක් ඉන්නවා. ඒ මාර්ගයෙන් නිසි විද්‍යාත්මක ක්‍රමයකට ඒක කරනවද කියල බලනවා. පොලීසියෙ එහෙම නැහැ. මස් කඩයේ සම්ප්‍රදාය තමයි පවතින්නෙ. ඉතින් ඒ විද්‍යාත්මක ක්‍රමය නැති කම සහ ඒවාට ඉඩ නොදෙන කම, ඒවට අවශ්‍ය පහසුකම් නොදෙන කම, ඒව දන්න පුද්ගලයන්ට ඉස්මත්තට එන්න

නොදෙන කම වගේ දේවල් නිසා පවතින තත්වයක් මේ වධ හිංසාව නොමැති කම කියන්නෙ. ඒ කියන්නෙ නොපැවතිය යුතු තත්වයක්.

## ප්‍රශ්නය: පොසිල් වධ හිංසාව නැති කරනව නම් ඒක මොන විදිහටද කරන්න ඕනෙ?




පොලීසියෙ තියෙනවා ඒ අයගෙ දෙපාර්තමේන්තු නියෝග කියල දෙයක්. පොලීසිය හරි හැටියට වැඩකරන්න ඕනෙ ක්‍රමය ඒ දෙපාර්තමේන්තු නියෝගවල සම්පූර්ණයෙන්ම තියෙනවා. මිනිස්සුන්ව අත්අඩංගුවට ගත්තම සලකන්න ඕනෙ මොන විදිහටද, පොලිසියෙ ඇතුළෙදි රඳවාගන්නකොට කරන්න ඕනෙ මොනවද? කූඩුවක ඉන්න කෙනෙක්ව බලාගන්නෙ කොහොමද? පොලිසියක් ඇතුළට ගියාට පස්සෙ අතවත් නොතියා පරිස්සම් කරන්නෙ කොහොමද? මේ සියලුම දේවල් අකුරට දිගට ලියපු පොතක් ඔය පොලිසිවල තියෙනවා. ඒක ක්‍රියාත්මක කිරීමට යුතුකම තියෙන්නෙ ඉහළ නිලධාරීන්ට.

ඒක හරිම ලේසියි නේ. වධ හිංසාව නැති කරන්න නම් ASP මහත්තුරු එයාලගෙ රස්සාව හරියට කරන්න ඕනෙ. වැඩිම වගකීම තියෙන්න ඔය ASP මහත්තුරුන්ට. පොලීසියෙ තියෙනවා ඒ අයගෙ දෙපාර්තමේන්තු නියෝග කියල දෙයක්. පොලීසිය හරි හැටියට වැඩකරන්න ඕනෙ ක්‍රමය ඒ දෙපාර්තමේන්තු නියෝගවල සම්පූර්ණයෙන්ම තියෙනවා. මිනිස්සුන්ව අත්අඩංගුවට ගත්තම සලකන්න ඕනෙ මොන විදිහටද, පොලිසියෙ ඇතුළෙදි රඳවාගන්නකොට කරන්න ඕනෙ මොනවද? කූඩුවක ඉන්න කෙනෙක්ව බලාගන්නෙ කොහොමද? පොලිසියක් ඇතුළට ගියාට පස්සෙ අතවත් නොතියා පරිස්සම් කරන්නෙ කොහොමද? මේ සියලුම දේවල් අකුරට දිගට ලියපු පොතක් ඔය පොලිසිවල තියෙනවා. ඒක ක්‍රියාත්මක කිරීමට යුතුකම තියෙන්නෙ ඉහළ නිලධාරීන්ට. ඉතින් ඉහළ නිලධාරීන් ඒ වැඩේ කරන්නෙ නෑ. ඒ ගොල්ලොත් මේ සියලුම වැරදිවලට සම්බන්ධ වෙනවා. ඉතින් අර වැටත් නියරත් කුඹුර කා නම් කිව්ව වගේ එතකොට ඉතින් කරන්න දෙයක් නෑ. මේ ඉහළ නිලධාරීන්ගේ වැඩකිරීමට මහජන මතයේ මැදිහත්වීමක් විශාල වශයෙන් අවශ්‍යයි. මහජන මතය මතයි අද සියල්ල සිද්ධ වෙන්නෙ.

අපිට මේ මස්කඩේ ජාතියෙ පොලිසි අවශ්‍ය නැහැ. අපිට අවශ්‍ය වෙන්නෙ යම් විද්‍යාත්මක ක්‍රමයකට මේ පුහුණු වෛද්‍යවරු වැඩකරන ක්‍රමයට-බුද්ධියෙන්-ඥාණවන්තව වැඩකරන-නිසි පියවරවල් අනුගමනය කරන-පොතේ හැටියට වැඩ කරන දක්ෂ නිලධාරීන් තමයි අවශ්‍ය කියන මහජන මතය ගොඩනැගිය යුතු වෙනවා වගේම පහර දෙන හැම අවස්ථාවකදීම මහජනයා මැදිහත් වෙලා ඒක නතර කළ යුතු වෙනවා. පොලිස් ස්ථානවලට ගිහින් හෝ නතර කළ යුතු වෙනවා. විරුද්ධත්වය ප්‍රකාශ කිරීමෙන් නතර කළ යුතු වෙනවා. ඒ වගේම අධිකරණ සහ වෙනත් පැමිණිලි ක්‍රම භාවිතා කරල නතර කළ යුතු වෙනවා. ඒ වගේ මහජන මැදිහත්වීමකින් තමයි පටන් ගන්න තියෙන්නෙ. පටන් අරගෙන මහජනයා මතයක් හදන්න ඕනෙ මේ මස්කඩේ ක්‍රමයට ගෙන යන පොලිසි ක්‍රමය නැති කරලා බුද්ධිමය පොලිස් ක්‍රමයක් ඇති කරන්න කියලා."

# පොලීසියට මරන්නට බැරි වූ

# ජෙරාඩ් පෙරේරා



සැකකරුවෙකු අත්අඩංගුවේදී හෝ පොලිස් භාරයේදී මිය යාම සඳහා නීති භාෂාවේ ව්‍යවහාර වන යෙදුම "රැකවරණ මනුෂ්‍ය ඝාතනය" (Costodial Death) යන්නයි. එහෙත් මොන රැකවරණයක්ද..? රැකවරණයක් ලැබේ නම් ඝාතනය වන්නේ කොහොමද...? ඇත්තෙන්ම සිදුවන්නේ වධකයන්ට සහ ඝාතකයන්ට නීතියෙන් රැකවරණය ලැබීම නොවේද...? නිර්දෝෂී භාවයේ පරම පූර්ව නිගමනය අනුව "වරදකරුවෙකු බව ඔප්පු කරන තෙක් කිසිවෙකු වරදකරුවෙක් නොවේ". එහෙත් වැරදීමකින් අත්අඩංගුවට ගෙන, මුල පටන්ම වරදකරු සේ සලකා වධ හිංසා පැමිණවීම නිසා මරණාසන්න වූ සහ මරණයේ එළිපත්තේ සිට අසීරුවෙන් බේරාගත් පසු මහ දවාලේ මරා දැමූ ජෙරාඩ් පෙරේරාගේ කතාන්දරය, වත්මන් ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යයේ ඛේදවාචකය සහ ආසියානු මානව කොමිසම වධ හිංසා වින්දිතයන් වෙනුවෙන් ගෙන යන අරගලයේ නූතන පිළිබිඹුවකි.

*"ඉස්සෙල්ල හිටියෙ මහත්තයයි මායි දරුවො තුන්දෙනයි. අපි පවුලක් හැටියට ගොඩක් සන්තෝසයෙන් ජීවත් වුණා. දැන් ඉතින් මම දෙමව්පියො ගාව ඉන්නෙ."* පද්මා පෙරේරා හිස් අහස වෙත හිස් බැල්මක් හෙළමින් කීවාය.

2002 වසරේදී පද්මා පෙරේරා ගේ සැමියා වන ජෙරාඩ් පෙරේරා මිනීමැරුමක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනිණි. ඒ සඳහා සැමියා සේවය කරන ස්ථානයේ දුරකථන අංකය දෙන ලෙස පද්මා පෙරේරා ට බල කෙරුණේය. ඇයව වාහනයකට දමාගත් පිරිසක් විසින් ඇයගේ හිසට අනිමින් පවසා ඇත්තේ *"උඹේ මිනිහ තුන්දෙනෙක්ව මරලා. අපිට මිනිහව ගෙනියන්න ඕනෙ.."* යනුවෙනි.



ජෙරාඩ් පෙරේරා

මේ අතර සරල මිනිසෙකු සහ දයාබර තාත්තා කෙනෙකු වූ ජෙරාඩ් පෙරේරා මේ කිසිවක් නොදැන සුපුරුදු පරිදි රැකියාවට ගොස් ගෙදර එමින් සිටියේය. ඔහු එළවළු මල්ලක් ද රැගෙන බස්රියෙන් බැස්සේ සුපුරුදු පරිදි සිය නිවසට යන්නට ය. එහෙත් ඔහුව කඩිමුඩියේ පොලිස් ජීප් රථයට නංවා ගැනුණේය. ඉන්පසුව තමාට සිදුවූ දෑ ජෙරාඩ් පෙරේරා මිය යන්නට පෙර කියා සිටියේ මෙසේ ය.


''වැලිකඩෙන් ජාඇල හන්දියට ජීප් එක හරවලා බැනියමෙන් ඇස් දෙක ගැටගැහුවා. එදා ඉරිදා දවසක්. රෑ වෙද්දි ආරංචි වුණා වත්තල හන්දියෙ තුන්දෙනෙක් මරල තියෙනව කියලා. "උඹේ නම ජෙයරාජ් ද නැතිනම් රවීද?" කියල පොලීසියෙ අය ඇහුවා. පොලිසියෙදි අත්දෙක පිටිපස්සට බැඳල අයිනකට අරන් ගියා. ඒ අරන් යන ගමනුත් ගහනවා. ඇස් දෙකත් බැඳල තිබුණෙ. යකඩ පොල්ලක් වගේ එකකින් කකුල්වලටත් ගහලා මෙට්ටයක් වගේ එකක උස්සල තියල ලණුව අරගෙන උඩක ගැට ගැහුවා."

කරුණු හරි හැටි සොයාබැලීමකින් තොරව ජෙරාඩ් ව අත්අඩංගුවට ගත් පොලිස් නිලධාරීන් විසින් ඔහුගේ පාපොච්ඡාරණයක් ලබාගැනීම සඳහා ඔහුට වධ දීම ආරම්භ කළහ. එහිදී ලබාදුන් දහසක් වධ හිංසා අතරේ, වධකයන් අතර ඉතා ජනප්‍රිය ක්‍රමයක් වන "පලස්තීන ක්‍රමයට එල්ලීම" හෙවත් පලස්තීනියන් හැඟින් ද විය.

**''උඩ එල්ලල මගෙ අත් දෙක කැරකුවා. මට තේරුණා මගෙ අත් දෙක ගැළවිලා වගේ යනව කියලා. දරාගන්න බැරි තරම් වේදනාවක් ඇති වුණා. මම එහෙමම පැය බාගයක් විතර හිටියා."**

සිය ආදර සැමියාව පොලිසිය ට ගෙන යාම ගැන මහත් සේ වික්ෂිප්තව සහ බියපත්ව සිටි පද්මා, එදින සවස ජෙරාඩ් සොයා පටාචාරාවක සේ පොලීසියට ගියාය. එහිදී ඇයට දක්නට ලැබුණේ කුමක්ද...?

''එදා හවස වත්තල පොලිසියට ගියාම මහත්තයගෙ අයියයි තවත් එක්කෙනෙකුයි එයාව වත්තම් කරගෙන ආවා. එයාගෙ අත්දෙක පණ නැතිව කඩන් වැටිලා. මූණ හොඳටම ඉදිමිලා තිබුණා.මුළු ශරීරයම ඉදිමිලා තිබුණා."



පලස්තීනියන් හැඟින් (පලස්තීන ක්‍රමයට එල්ලීම)

පසුදින සවස පහට පමණ ජෙරාඩ් ව පොලිස් ස්ථානාධිපති වෙත කැඳවිණි. "අපිට වැරදීමක් වෙලා තියෙනවා. ඔයාව හෙට උසාවියෙන් ඇප දීල යවනවා'' යැයි පොලිස් ස්ථානාධිපති සුරවීර කීය.

මේ ආකාරයට නොකළ වරදකට වධකයන්ගේ අමානුෂික වධ බන්ධන ආශාවන්ට ගොදුරු වූ ජෙරාඩ් සිටියේ කෙළින් සිටගත හැකි තත්වයකවත් නොවේ. ඔහුව වහාම රෝහල් ගත කෙරිණි. "වහාම නවලෝක රෝහලට ගෙන ගිය විට දැනගන්නට ලැබුණා, අත් දෙක කැඩීම නිසා තැලුණු ලේ, වකුගඩුවලට බැහැල තියෙනවා. ඒ නිසා ජෙරාඩ් ගෙ ජීවිතේ අනාරක්ෂිතයි කියලා. ඉතා ඉක්මනින් මෙයාව ඩයලයිසිස් කළොත් බේරගන්න පුළුවන් කියලා. ඒකට ලක්ෂ ගානක් යනවා.මට එච්චර මුදලක් නෑ. ඒත් හිඟාකාල හරි මගෙ මහත්තයව බේරගන්න ඕනෙ කියලා මම දොස්තර මහත්තුරුන්ට කිව්වා" පද්මා පෙරේරා කියන්නීය.

ශ්‍රේෂ්ඨාධිකරණය, පොලිස් නිලධාරීන් විසින් ජෙරාඩ් ගේ මූලික අයිතිවාසිකම් කඩ කර ඇති බව එකහෙළා පිළිගත්තේය.

එපමණක් නොවේ. ඔහුට ලබාගත හැකි හොඳම ප්‍රතිකාරය සඳහා අයිතියක් ඇති බව ද පිළිගත්තේය.

මෙම හොඳම ප්‍රතිකාරය ලබාගත හැක්කේ රටේ පුද්ගලික රෝහලකින් නම් ඒ සඳහා පවා වධ හිංසා වින්දිතයාට අයිතියක් ඇති බව අධිකරණය කීවේය.

එහිදී අදාළ වෛද්‍ය බිල ගෙවිය යුත්තේ අධිකරණයයි.

එබඳු ස්ථාවරයක් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රකාශයට පත් කළ ප්‍රථම අවස්ථාව මෙයයි.

ඩයලසිස් කරන අතරම ජෙරාඩ් ට සිහිය නැති විය. ආසියානු මානව හිමිකම් කොමිසමට මේ වන විට මේ සිද්ධිය පිළිබඳ දැනගන්නට ලැබී තිබුණේය. පොලිස් වධ හිංසාව වසංගතයක් සේ පැතිරී ඇති රටක මානව හිමිකම් සුරැකීමේ බරපතළ ප්‍රායෝගික අභියෝගයට ආසියානු මානව හිමිකම් කොමිසම නොපැකිළ මැදිහත් වුණේය.

ආසියානු මානව හිමිකම් කොමිසම මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුවට සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ විශේෂ වාර්තාකරුට දිගින් දිටගම ලියමින්, රෝගියාගේ ජීවිතාධාර පද්ධති අක්‍රිය නොකරන ලෙස ඉල්ලා සිටියහ. ආසියානු මානව හිමිකම් කොමිසමේ නීතිඥ රසික සංජීව වීරවික්‍රම ජෙරාඩ් පෙරේරා වෙනුවෙන් මූලික අයිතිවාසිකම් අයදුම්පතක් අප්‍රමාදී ව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ගොනු කළේය.

ශ්‍රේෂ්ඨාධිකරණය, පොලිස් නිලධාරීන් විසින් ජෙරාඩ් ගේ මූලික අයිතිවාසිකම් කඩ කර ඇති බව එකහෙළා පිළිගත්තේය. එපමණක් නොවේ. ඔහුට ලබාගත හැකි හොඳම ප්‍රතිකාරය සඳහා අයිතියක් ඇති බව ද පිළිගත්තේය. මෙම හොඳම ප්‍රතිකාරය ලබාගත හැක්කේ රටේ පුද්ගලික රෝහලකින් නම් ඒ සඳහා පවා වධ හිංසා වින්දිතයාට අයිතියක් ඇති බව අධිකරණය කීවේය. එහිදී අදාළ වෛද්‍ය බිල ගෙවිය යුත්තේ අධිකරණයයි. එබඳු ස්ථාවරයක් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රකාශයට පත් කළ ප්‍රථම අවස්ථාව මෙයයි.

මේ නිසා ජෙරාඩ් පෙරේරා නඩුව මානව හිමිකම් දෘෂ්ටිකෝණයෙන් බලන විට ශ්‍රී ලංකාවේ මානව හිමිකම් නීති ක්ෂේත්‍රයේ ඓතිහාසික සන්ධිස්ථානයකි.

ප්‍රතිකාරවලින් මාස හතරක් යන තෙක් ජෙරාඩ් ට අත් දෙක එසවීමට පවා නොහැකි විය.

මූලික අයිතිවාසිකම් නඩුවෙන් ජයග්‍රහණය කළ ජෙරාඩ් තමන් ට වධ හිංසාකළ පොලිස් නිලධාරීන් ට එරෙහි වධ හිංසා නඩුවේ ප්‍රධාන සාක්ෂිකරු ද විය. මේ වධ හිංසා නඩුව වත්තල පොලීසියට මේ වන විට මහත්ම හිසරදයක් වී තිබුණේය. මීගමුව

මහාධිකරණයේ වධ හිංසා නඩුව ආරම්භ වීමට නියමිතව තිබුණේ 2004 දෙසැම්බර් 2 වැනිදා ය.

''හවස පොලිස් නිලධාරීන් කිහිප දෙනෙක් මහත්තය හම්බ වෙන්න ඇවිල්ල කිව්වා ලක්ෂ තුනක් දෙන්නම් මේ නඩුව ඉල්ලා අස් කරගන්න කියලා. "මේක මානව හිමිකම් එකේ නඩුවක්. මට ඒ ගොල්ලන්ව පාවල දෙන්න බෑ. මට මෙච්චර උදව් උපකාර කළ අය. ඒගොල්ලො කැමති නම් මමත් ඒකට කැමති වෙන්නම් කියල කිව්වා." ජෙරාඩ් පෙරේරා මානව හිමිකම් කොමිසම තමන් වෙනුවෙන් කළ අරගලයට හදවතින්ම කෘතවේදී වූ සුන්දර මිනිසෙකු විය. පොඩි මිනිසෙකු වුවත් ඔහුට තමන් හමුවට පැමිණ යාප්පු වන්නට හදන පාපීන් ඉදිරියේ පිටකොන්දක් ඇති නියම අභීත පුරුෂයෙකු සේ ඔවුන්ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. චූදිත පොලිස් නිලධාරීන් නියෝජනය කරන නීතීඥයා, ආසියානු මානව හිමිකම් කොමිසමේ නීතීඥ රසික සංජීව හමුවීමට පැමිණියේ ඉන්පසුව ය. "පොලිස් නිලධාරීන් සල්ලි ගෙවන්න ලෑස්තියි. ගැටලුව සමථයකට පත්කරගන්න පුළුවන්ද?" ඔහු ද ඇසුවේය. ආසියානු මානව හිමිකම් කොමිසමේ මගපෙන්වීම මත නඩුව තවදුරටත් මෙහෙයවිණි.



ආසියානු මානව හිමිකම් කොමිසම සමග එක්ව සිය සැමියාගේ මරණය වෙනුවෙන් නොබියව සටන් කළ දිරිය ගැහැනිය පද්මා පෙරේරා සිය දරුවන් සමග

එහෙත් සාක්ෂිකරුවන්ට කිසිම ආරක්ෂාවක් නැති රටක අහේතුවට උපන් පුංචි ගෙදරක ජීවත් වුණු අහිංසක මිනිසාට ආරක්ෂාවක් තිබුණේ නැත. පොදු ප්‍රවාහන සේවා යොදාගනිමින් ඔහු දිනපතා රැකියාවට ගියේය. නමුත් පොලිස් නිළධාරීන් ට වාහන තිබේ. ආරක්ෂාව ද තිබේ. දිනය 2004 නොවැම්බර් 22 වැනිදා ය. වධ හිංසා නඩුවට තවත් ඇත්තේ දින 10 කි. ජා ඇළ-කොටුව බස්රියේ ගමන් ගනිමින් සිටියදී ජෙරාඩ් යන බසයටම නැගි තුවක්කුකරුවෙක්, මහ දවාලේ බස්රිය ඇතුළේම ජෙරාඩ් ට වෙඩි තබා ඝාතනය කළේය. මාබෝල හන්දියේදී මෙම වෙඩිතැබීම සිදුකිරීමෙන් පසුව ඝාතකයන් විසින් සාක්ෂි මකා දමා තිබේ.

''නිසි පරිදි සිදුකරන අපරාධ විමර්ශනය බලය අයුතු ලෙස යොදාගන්නා පුද්ගලයන්ට විශාල ප්‍රශ්න ඇති කරනවා ඔවුන්ට දූෂිත වෙන්නට අවශ්‍ය නම්. දූෂණය විමර්ශනය කිරීම සඳහා ඔබට හොඳ පොලීසියක් අවශ්‍ය වෙන්නේ නැහැ. එනිසා දූෂණය විමර්ශනය කරන්නට ඔබට අවශ්‍ය නැති නම් ඔබට නිසි ලෙස අපරාධ විමර්ශනය කරන්නටත් බැහැ. ඒ අනුව අපහරණයට ලක්වූ සමස්ත ක්‍රමය පවතින්නේ එය පාලනය කරන අයගේ වාසිය සඳහායි. මේක තමයි වධහිංසාව පිළිබඳ ගැටලුවේ හරය."

- බැසිල් ප්‍රනාන්දු, ආසියානු මානව හිමිකම් කොමිසමේ විධායක අධ්‍යක්ෂ

'A proper criminal investigation will create ot of problems for people who abuse power. If they want to be corrupted, you don't want a good police to investigate corruption. So, if you dont want corruption to be investigated, you can not also investighate murder properly. So the whole abuse system exists for the benefit of all those who rule. That is the heart of the issue of torture.'


-Basil Fernando – Executive Director of Asian Human Rights Commission


වසර හය හතකට පසු වධ හිසා නඩුවේ තීන්දුව ලැබුණේය. මීගමුව මහාධිකරණ විනිසුරුවරියගේ 2008.04.21 දිනැති තීන්දුව මගින් චූදිතයන් නිදොස් කෙරිණි. ජෙරාඩ්ගේ වැන්දඹුව පද්මා කඳුළු සැලුවාය. එහෙත් ආසියානු මානව හිමිකම් කොමිසම සමග එක්ව ඇය දිරිය බිරිඳක් ව සටනට මුහුණ දුන්නාය. ඇය සිය ජෙරාඩ් වෙනුවෙන් තීන්දුව ගැන අභියාචනා කළාය. චූදිත පොලිස් නිලධාරීන්ගේ තර්කය වී තිබුණේ ජෙරාඩ් ව පොලිස් ස්ථානය වෙත ගෙන යාමේදී ඔහු ජීප් රථයෙන් පැන දුවන විට බොරලු පොළොව මත පෙරළීම නිසා ඔහුට තුවාළ සිදුවූවා මිස තමන් ඔහුට වධ හිංසා නොකළ බවයි. අභියාචනාධිකරණයේ කේ. ටී. චිත්සිරි ගරු විනිසුරු එහිදී තීන්දුව ප්‍රකාශයට පත් කරමින් <u>සෙසු කරුණු අතර</u> මෙසේද සඳහන් කළේය.

> *....මෙකී සියලු ගැටලු සලකා බැලීමේදී, වින්දිතයා පොලිස් භාරයෙන් පැන ගිය බවට 1 වැනි, 2 වැනි හා 3 වැනි විත්තිකරුවන් කළ සඳහන සහ වින්දිතයා කිහිප වරක් බිම ඇද වැටුණු බව බලාත්මක කිරීමට 1 වැනි විත්තිකරු විසින් තොරතුරු පොතේ (අයිබීපී) ඇතුළත් කළ සටහන අසත්‍ය බව මගේ මතයයි. ඔවුන්ගේ ඉහත කථාන්දරය බොරු පොදියක් මිස වෙනත් දෙයක් නොවේ. ඔවුන් මෙම බොරුව කීවේ ඇයි? මෙම ව්‍යාජ සටහන නොයෙදුවේ නම් වින්දිතයා ට සිදුවූ තුවාළ සම්බන්ධයෙන් පැහැදිලිකිරීමක් ලබාදිය නොහැකි බව ඔවුහු දැන සිටියහ. මේ අනුව මෙම බොරුව සඳහා වන පෙළඹවීම වන්නේ වරදකාරී බව වටහාගැනීම සහ සත්‍යයට බිය වීමයි. පී.එස්. රත්නායක හා මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු විසින් ලබාදුන් සාක්ෂිවලින් ද 1 වැනි, 2 වැනි හා 3 වැනි විත්තිකරුවන් විසින් කළ සඳහන් ව්‍යාජ බව පැහැදිලි ව පෙනේ. මෙම බොරුව ඉතා වැදගත් ගැටලුවක් සමග සම්බන්ධිත ය. අධිකරණයේදී හෝ සාක්ෂියකදී හෝ ලුහුඬු ප්‍රකාශයකදී පැවසූ බොරුවක බලපෑම කුමක්ද? මේ ප්‍රශ්නය ට පිළිතුර රජු එ. ලූකස් (1981)2 ඕබ ඊසෘ 1008 හි 1011 හිදී අගවිනිසුරු ලේන් සාමිවරයා (බඳරා ඕබැ කෂ) විසින් ලබාදුන් නඩු තීන්දුවෙහි දැකගත හැකිය. එහිදී අගවිනිසුරු මෙසේ පවසයි. "*

*අධිකරණයේදී පවසනු ලබන බොරුව සනාථ කිරීම ට සමත්වීම පළමුවැනුව මනා ලෙස සිතාමතා සිදුකරන්නක් විය යුතුය. දෙවැනුව, එය වැදගත් ප්‍රශ්නයක් හා සම්බන්ධ විය යුතු ය. තුන්වැනුව, බොරුව කීම සඳහා වන පෙළඹවීම වරදකාරිත්වය වටහාගැනීමක් සහ සත්‍යය වෙත ඇති බියක් විය යුතු ය. යම්කිසි හේතුවක් නිසා හෝ ලැජ්ජාව නිසා හෝ සිය පවුල්වලින් නින්දිත හැසිරීම් වසං කිරීමේ උත්සාහයක් නිසා වැනි අවස්ථාවලදී මිනිසුන් ඇතැම්විට බොරුකියන බව, යෝග්‍ය නඩුවලදී ජූරිය ට සිහි කැඳවිය යුතු ය. සිව්වැනුව, අපසහායකත්වය සනාථ කරන්නා විසින් පිළිගැනීම හැරුණු විට සාක්ෂියක් මගින් හෝ ස්වාධීන සාක්ෂිකරුවෙකුගේ සාක්ෂියකින් එම සඳහන බොරුවක් බව පැහැදිලි ව පෙන්විය යුතු ය."*

කාරණය පැහැදිලි විය. වධ දුන් බව වසං කරනට පාපීන් බොරු කියූ බවද සනාථ විය. අවසානයේ පස්වැනි සහ හයවැනි විත්තිකරුවන් හැර සෙසු විත්තිකරුවන් සිව්දෙනාගේ නිදොස් කිරීම අවලංගු විය. ඔවුන් නැවත නඩු විභාගයට ලක්කිරීමට තීන්දු විය. නීතිය වල්වැදී නිවාඩු ගොස් සිටින රටක 2012 වර්ෂයේ අගභාගයේදී ලැබුණු මේ නඩු තීන්දුව විජයග්‍රහණයකි. නමුත් සටන තවම අවසන් නැත. අභියාචනා තීන්දුව ප්‍රකාරව ඔවුන් නැවත නඩු විභාගයකට ලක් කළ පසු අලුත්ම ප්‍රවණතාව පරිදි නීතිපති ඔවුන් ව නිදහස් නොකරාවිද? පාපීන් නීතියෙන් අවසාන රිංගා යාමත් සිදුකරාවිද..? අපි බලා සිටිමු.



# අපි ඔහු පුදමු හිමිකම් ගැන බලවේගෙන්...

**1** ජෙරාඩ් නමැති හිතවතෙකුට කළ හදිය
හොඳ හැටි කියන්නට මාගේ කට මදිය
මර්දන හස්තයෙන් ඔහු නැති කළ විදිය
සිහිකර හඬයි කැලණියේ මහ නදිය

**2** උපතින් හැඳල හයියක් ඇති තරුණ රට
බයක් නොමැති හිතවත්කම ඇත සැමට
සිනාවක් මුවේ උපතින් උරුම කොට
පින්වත් තරුණයා අමතක නොවේ මට

**3** මරණ තුනක් වුණ දිනදී වත්තලදී
පොලිසියට අග මැද මුල වැරදී
මොළයක් නැතිව කටයුතු කරනා විටදී
නීතිය මැකී භීතිය මතුවුණ තැනදී

**4** දරුවන් අරන් පාසල් ගිය මව නවතා
සැරකර රියක් ඇතුළට ගෙන බොරු පවසා
දුරකතනයෙන් හිතවත් සැමියා අමතා
යක්ෂ රැලක් ගොදුරක් සොයනා විලසා

**5** ආදර හිතින් කඩිමුඩියේ පැමිණි පියා
මගදී අල්ලාගෙන මේ හොරු අරන් ගියා
බාල්කයක එල්ලා ඇස් වසා තියා
පොල්ලෙන් පහර දුනි තොරතුරු අසා පියා

**6** හසරක් නොදැන කිසි අපරාධයක් ගැන
අසරණ තිදරු පියෙකුට කළ හැටිය වින
දොස්තරවරුන් කඩිමුඩියෝ වැට ලැවුණා
වකුගඩු කඩා වැටිලා යයි නියම වුණා

**7** තත්ත්වය නරක් වී දින දින ම
සිහිසන් නැතිව ඔහු සිටියා සිටි තැන ම
නැගිටින එකක් නෑ යන බිය හැම තැන ම
අනේ කියා ඇඬුවා මුළු ලක් බිම ම

**8** යාළුවො නොමැත ඔහු අතහැර දැමුවේ
බිරිඳත් ළඟම සිටියා පවුරක් විලසේ
දොස්තරවරුන් වෙහෙසුණි රෑ හා දවසේ
එළියක් නැවත ආවා පසළොස් දවසේ

**9** සුවවුණ පසුව කම්පාවී බිය නොවැදී
යුක්තිය සොයන්නට ඔහු දැන් මගට බසී
අධිකරණයේ උදහස පොලිසියට වදී
හිමිකම් කඩකලැයි එහිදී කියන ලදී

**10** වධහිංසාව කර ඇත පෙත්සම් කරු ට
දඬුවම දිය යුතුය මේ කළ පොලිසිය ට
තරවටුවක්වත් කර පොලිසියේ ලොක්කා ට
ලිව්වා තීන්දුව දිග කොළ ගණනක ට

**11** නීතිපතිගේ උපදෙස් පිට අවනඩුව
සොයා බලන්නට පත් කළ දක්ෂ අය
සැකයක් නැතිව දැන හිංසා කරපු අය
දමාලා මාංචුව
මවිතෙට පත් කළා මීගමු උසාවිය

**12** වැරදිකාරයන් අල්ලන පොලිසිය
මෙදා නැංගා විත්ති කූඩුවට
අපරාධ නඩුවකට මූණ දෙන්නට
හත් අවුරුද්දයි නඩුව ඔප්පු වුණෝතින්

**13** අපරාධ කරපු ලොක්කෝ
දැන් බොහොම හයවෙලා
ඔහු පසුපසින් ආවා
නඩුවට නෑවිත් ඉඳලා

**14** අපිව බේරාගනින් සල්ලි දෙන්නන් කියලා
ඒක බාර නොගත් හින්දා
හොඳටම ප්ලෑන් කරලා
යන එනමන් බලලා
කාර් එකකින් පස්සෙන් එලවලා
බස් එකකදි වෙඩි තිබ්බා

**15** එලෙසින් නිහඬ කළ නොහැකිවූ ඔහු හඬ ට
ලෝකය කිපී නිදි නැති විය ලොකු අය ට
පරීක්ෂණේ රට හැම තැන පැතිරි විට
පව් කළ එවුන් හසුවූවා නීතිය ට

16 රජකම් කළත් කළකම් පලදෙන බැවිනි
කාකි ඇන්ද මුත් නීතියෙ ගැට ගැසිනි
ජනමතයයි කියා දෙයකුත් ඇති බැවිනි
මිදීමට නොහැක කාටත් කළ පවිනී

17 නොනැවත නැගුණහොත් හඬ මහ ආවේගෙන්
වධහිංසාව නැති කළ හැක ලංකාවෙන්
ජීවත් වී මොටද බිය මුසු සංකාවෙන්
අපි ඔහු පුදමු හිමිකම් ගැන බලවේගෙන්

බැසිල් ප්‍රනාන්දු

*චීන ගෙදර කිරිල්ලිගේ ගීතය කාව්‍ය සංග්‍රහයේ 27-29 පිටු*



අසාධාරණ
නීතිවලට
අකීකරු වීම
සඳහා

මිනිසාට
සදාචාරාත්මක
වගකීමක් තිබේ

- මාටින් ලූතර් කිං
( කණිෂ්ඨ )

**ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අවසානයේ රටටම ශාපයක් බවට පත්විය. එය තැනුවෝ එය ප්‍රංශ සහ ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ගේ සංකලනයක් යැයි පැවසූහ. නමුත් සිය අලුත්ම ග්‍රන්ථය වන 'ගයිජස්ගේ මුද්ද 'මගින් බැසිල් ප්‍රනාන්දු කියා සිටින්නේ 1978 ආණ්ඩුක්‍රමය ඒ කිසිවක් නොවන නෛතික විප්‍රකාරයක් බව ය.**

# 1978 ආණ්ඩුක්‍රමය හෙවත් නෛතික විප්‍රකාරය

- බැසිල් ප්‍රනාන්දු විසිනි.

1948 වර්ෂයේ නිදහස ලැබීමේදී ශ්‍රී ලංකාවේ සංස්ථාපනය වූ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ජෝන් ලොක් සහ ජීන්-ජැක් රූසෝ ගේ සම්ප්‍රදායන් මත පදනම් වූවක් විය. බ්‍රිතාන්‍යයේ දේශපාලන සම්ප්‍රදායය පවා හැඩගැන්වුණේ අවබෝධයේ සම්ප්‍රදායය මත ය. මෙකල විසූ සියලු ශ්‍රී ලාංකේය දේශපාලන නායකයෝ ද මෙම සම්ප්‍රදාය උගත් අය වූහ. 1948 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ කෙටුම්පත්කරු වූ අයිවර් ජෙනිංග්ස් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා නීතිය පිළිබඳ ප්‍රකට බ්‍රිතාන්‍ය විශේෂඥයෙක් විය.

1972 දී සභාග රජය 'ස්වස්ථානික ආණ්ඩුක්‍රමයක්' පිළිබඳ කතා කළ විට, එයින් අදහස් වූයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව වෙන්ව යන යටත් විජිතවාදී පාලකයාගෙන් ලැබුණක් නොව ශ්‍රී ලාංකේය ජනතාව විසින් තෝරාපත්කර ගත් නියෝජිතයන් විසින් සාදාගත් එකක් විය යුතු බව මිස එයට වඩා වැඩි යමක් නොවීය. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතික්ෂේප කිරීමේ අදහසක් එහි ව්‍යංගාර්ථයෙන් හෝ ගැබ්ව නොතිබිණි. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයක ව්‍යූහයට යම්තාක් දුරකට නියත වශයෙන්ම අතපෙවූ ඇතැම් නීති නවීකරණය කිරීමේ සමහර පරිශ්‍රමයන් හැරුණුවිට පදනම් ලියවිල්ලේ මූලික රාමුව ගළවා නොදැමීම ට එහි සැකිල්ල නිර්මාණය කළෝ ප්‍රවේශම් සහතග වූහ.

නමුත් 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ගමන් ගත්තේ මෙම මූලික රාමුව සම්පූර්ණයෙන් ම ගළවා දමන සහ අවබෝධාත්මක සම්ප්‍රදාය ද සපුරා අත්හැර දමන මාර්ගයක ය. නීතිය ඉදිරියේ සමානාත්මතාවය යන සංකල්පීය ගුණය පවා විධායක ජනාධිපතිවරයා සියල්ලන්ටම ඉහළින් තැබීම මගින් අත්හැර දමන ලදී. මෙකී තරගකාරී පිරිවැද්දුමේ වැඩිදුර තොරතුරු මෙයින් ඉදිරියට තිබෙන පරිච්ඡේද වලදී සාකච්ඡා කෙරේ. උත්තරීතර නීතියක අදහස රැගත් මෙම ලියවිල්ලට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යැයි කියූවද එය නියත වශයෙන් ම නීතියට විරුද්ධ වූ අත්තනෝමතිකත්වය පිළිගත් ප්‍රකාශනයක් විය. නීතියේ පදනම එය විසින් ම ඉවත් කරගෙන තිබේ.

රාජ්‍යය අවනීතික කළ ලියවිල්ල වන්නේ එයයි.

රූසෝ නීතියේ බැඳීම ගැන කතා කළේ නීතියේ බැඳීම ලේ බැඳීම තරමටම සමාන ලෙස ප්‍රබල බව කියමිනි. පුරවැසියන් එකිනෙකා සමග බැඳ තබනා නෛතික බැඳීම වන්නේ නීතියයි. 1978 වර්ෂය, ජාතිය ජාතියක් ලෙස බැඳ තබාගත් නොපෙනෙන හුය ඉවත් කිරීම සනිටුහන් කළේය.

රූසෝ නීතියේ බැඳීම ගැන කතා කළේ නීතියේ බැඳීම ලේ බැඳීම තරමටම සමාන ලෙස ප්‍රබල බව කියමිනි.

පුරවැසියන් එකිනෙකා සමග බැඳ තබනා නෛතික බැඳීම වන්නේ නීතියයි.

1978 වර්ෂය, ජාතිය ජාතියක් ලෙස බැඳ තබාගත් නොපෙනෙන හුය ඉවත් කිරීම සනිටුහන් කළේය.

එයින් ප්‍රතිඵල වූ ශ්‍රී ලංකාවේ පැවතගෙන එන වියවුල නිරන්තරයෙන් ම විවිධාකාර අරගල හා ත්‍රස්තවාදය වෙත ආරෝපණය වෙයි. එබඳු වියවුල් අතරින් වඩාත් වැදගත් ම වියවුල එය වී තිබියදීත් එය ලිහාදැමීම වෙත මේ තාක් කාලයකට අවධානය යොමු වී නැත.

## *1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව : එහි පදනම සදෝෂීය.*

ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රසිද්ධ කර වසර 30 කට අධික කාලයක් ඉක්ම ගොස් තිබේ. එය 1958 දී චාල්ස් ඩි ගෝල් විසින් බිහිකළ ආණ්ඩු ක්‍රමය ලෙස ද ප්‍රකට ප්‍රංශ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ආදර්ශයට ගනිමින් තැනුවක් බව නැවත නැවතත් ප්‍රකාශ කර තිබේ. ආණ්ඩුක්‍රම පණ්ඩිතයන් හා දේශපාලකයන් වැනි අය දිගු කාලයක් මුළුල්ලේ මේ"ඩි ගෝලියානු ආණ්ඩුක්‍රමය' පිළිබඳ වීණාව වාදනය කර ඇත්තේ මෙකී වැරදි ව්‍යවහාරය සහ නොගැළපෙන නම ඇදහිල්ලේ නියාමිතයක් බවට පත්කරමිනි. මෙම පරිශීලනය බොහෝකොටම යෙදෙනුයේ, 1958 ආණ්ඩු ක්‍රමය යටතේ ප්‍රංශ ජනාධිපතිගේ තත්වය ට සාපේක්ෂ ව 1978 ආණ්ඩු ක්‍රමය මගින් නිර්මාණය කළ විධායක ජනාධිපති ධූරය සම්බන්ධයෙනි.

සමූහාණ්ඩුවේ ජනාධිපති සම්බන්ධයෙන් ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළමු පේළි ද්විත්වය (5 වගන්තිය) මෙසේ ය.

'සමූහාණ්ඩුවේ ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිපැදීමට වගබලාගනු ඇත. ස්වකීය බේරුම්කරණයන් මගින්, මහජන අධිකාරීන් නිසි පරිදි ක්‍රියාත්මක වන බවට ද රාජ්‍යය පවත්වාගෙන බවට ද ඔහු විසින් සහතික වනු ඇත.'

එය 1958 දී චාල්ස් ඩි ගෝල් විසින් බිහිකළ ආණ්ඩු ක්‍රමය ලෙස ද ප්‍රකට ප්‍රංශ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ආදර්ශයට ගනිමින් තැනුවක් බව නැවත නැවතත් ප්‍රකාශ කර තිබේ.

ආණ්ඩුක්‍රම පණ්ඩිතයන් හා දේශපාලකයන් වැනි අය දිගු කාලයක් මුළුල්ලේ මේ"ඩි ගෝලියානු ආණ්ඩුක්‍රමය' පිළිබඳ වීණාව වාදනය කර ඇත්තේ මෙකී වැරදි ව්‍යවහාරය සහ නොගැළපෙන නම ඇදහිල්ලේ නියාමිතයක් බවට පත්කරමිනි.

ප්‍රංශ සමූහාණ්ඩුවේ ජනාධිපතිවරයාගේ මූලික ක්‍රියාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිපදින බවට වගබලාගැනීම බව පැහැදිලි ව සඳහන් වන්නේ එසේ ය. එසේම මහජන අධිකාරීන් නිසි පරිදි ක්‍රියාත්මක වීමට සැලැස්වීම සහ රාජ්‍යය පවත්වාගෙන යාම ඔහුගේ හෝ ඇයගේ ප්‍රාථමික රාජකාරිය වේ. 1958 ප්‍රංශ ආණ්ඩු ක්‍රමය ස්ථාවරභාවයේ යුගයක් පෙරටුකොට ගෙන ගමන්කිරීම සඳහා ප්‍රශංසනීය වන්නේ එහෙයිනි.

ප්‍රංශය ආණ්ඩුක්‍රම ඉතිහාසය අතින් ලෝකයේ සෙසු සියලු රටවල් අතර ඉදිරියෙන් ම සිටින්නකි. ආණ්ඩු ක්‍රමයක නූතන අදහස, ඇමරිකා එක්සත් ජනපදය සමග එක්ව මුලින් ම භාවිතයට ගත් රටවල් අතරට ප්‍රංශය ද අයත්

වේ. නමුත් 1787 ඇමරිකානු ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අදටත් බලාත්මක වනවිට 1791 ප්‍රංශ ආණ්ඩු ක්‍රමය වසරක කාලයක් සඳහාවත් බලපැවැත්වුණේ නැත. සමූහාණ්ඩු සංකල්පය ට එළඹෙන තෙක් ආණ්ඩු දුසිම් ගණනක් එකකට පසු එකක් වශයෙන් මාරු වූ අතර ප්‍රංශය ට ස්ථාවර ආණ්ඩුවක් ගෙන ආවේ පස්වැනි සමූහාණ්ඩුව විසිනි.

## වියවුල

එසේ නම් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් ශ්‍රී ලංකාව ට ස්ථාවර භාවය ගෙන නොආවේ කෙසේද? මෙම ආණ්ඩු ක්‍රමය ක්‍රියාවට නැංවුණේ ශ්‍රී ලංකා ඉතිහාසයේ වඩාත් ම බිහිසුණු දාමරිකකම්, ඝාතන සහ උතුරු නැගෙනහිර මෙන්ම දකුණේ ද 'අතුරුදන්වීම්' සිදුවූ වඩාත්ම වියවුල් සහගත යුගයකදී යැයි එවිට නිසැක වශයෙන් ම පැවසෙනු ඇත. එසේම ජාතික ආයතන මේ යුගයේදී වඩාත් ම දුර්වල ව පැවති බව ද පැවසෙනු ඇත. ඉදින්, ප්‍රංශ ආණ්ඩුක්‍රම මොඩලය ශ්‍රී ලංකාව ට බලපා ඇත්තේ කෙසේද? නොඑසේ නම් එය රැවටිලි සහගත ප්‍රකාශයක් පමණක් ද? එය එසේ නම්, ආණ්ඩු ක්‍රමයන් ද්විත්වය සමාන වන්නේ මතුපිටින් බැලූ විට පෙනෙන යම් දෘෂ්ටිකෝණයන්ගෙන් පමණක් ද? වඩාත් වාස්තවික හා මූලික මට්ටමේදී මේවා නෛසර්ගික ලෙස ම වෙනස් ද?

මෙයට පිළිතුර ගැබ් ව තිබෙනුයේ සමහර විටෙක තවත් ප්‍රශ්නයක වන්නට පුළුවන. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිපදින බව ට වගබලාගැනීම ට ශ්‍රී ලංකාවේ ජනාධිපති හට යුතුකමක් තිබේද? ප්‍රංශ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කර තිබෙන පරිදි එය ප්‍රංශ ජනාධිපති ගේ මූලික යුතුකමකි. ශ්‍රී ලංකාවේ ජාතික පොලිස් කොමිසමේ සභාපති රංජිත් අබේසූරිය ගේ නිරීක්ෂණ යටතේ මෙය සලකා බලා තිබෙනවා විය හැකිය. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සභාව වසරකටත් වඩා වැඩි කාලයක් මුළුල්ලේ ක්‍රියාකාරී ව නොපවතින බව ද මෙමගින් අධිකරණවල නඩු විශාල වශයෙන් ගොඩගැසීම සඳහා බලපෑ මහාධිකරණ විනිසුරන් පත්කිරීම ට අසමර්ථ භාවයක් ප්‍රතිඵල වී තිබෙන බව ද ඔහු නිරීක්ෂණය කළේය.

ජාතික පොලිස් කොමිසමේ සභාපතිවරයා තවදුරටත් ප්‍රකාශ කළේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ක්‍රියාකාරී නොවීම මගින් වර්තමාන IGP වරයා 2011 වසරේ ඔක්තෝබරයේ විශ්‍රාම යාමේ වයස ට ළඟාවූ විට නව නිලධාරියාගේ පත්වීම ට ද බලපෑමක් එල්ලවිය හැකි බවයි. එයට හේතුව නව පොලිස්පතිවරයෙකු ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නම් කළ යුතු වන නිසා ය. ඔහු මෙසේ ද කියා තිබේ. *"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා දායක සභාව අක්‍රිය වී වසරක් පමණ ගතව තිබෙන අතර මහජන පරිපාලනයේ අවිධිමත් භාවයන් බහුලව ව්‍යාප්ත ව ඇත. යහපත් පරිපාලනයක් සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් අත්‍යවශ්‍ය වේ."* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාවේ අක්‍රිය භාවයේ ප්‍රතිඵලයක් වශයෙන් මහජන අධිකාරීන් හි ක්‍රියාත්මක භාවයේ ඇති ව තිබෙන මෙකී භයානක අවහිරය විසඳන්නේ කවුද?

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිපදින බවට වගබලාගැනීම ජනාධිපතිවරයාගේ යුතුකම නම් එබඳු අවහිරයක් පැන නොනැගෙන බව සාක්ෂාත් කිරීමේ වගකීම ජනාධිපතිවරයා වෙත පැවරේ. තවද එබඳු අවහිරයක් පැන නගියි නම් එය වහාම විසඳාලීම ද ඔහුගේ වගකීම වේ. නියත වශයෙන් ම මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පදනම් වී තිබෙනුයේ ප්‍රංශ මොඩලය මත නම් මෙකී අනුල්ලංඝනීය යුතුකම ඉටුකිරීමට අපොහොසත් වීම ජනාධිපතිවරයාගේ මූලිකතම කාර්යයක් ඉටුකිරීම ට අපොහොසත් වීමකි. කෙසේවෙතත්, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා හට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන ක්‍රියාව ට නැංවේදැයි වගබලාගැනීම ට එබඳු බැඳීමක් නොමැති බව සඳහන් කිරීම සමාන වන්නේ, එය මූලික වශයෙන් ම ප්‍රංශ මොඩලය ට වෙනස් වන බව කීමට ය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මෙකී සියලු මූලික අංගයන් ප්‍රංශ මොඩලයෙන් වෙනස් ය.

මෙවිට ප්‍රශ්නය වන්නේ, ප්‍රංශ මොඩලය සමග එය සමාන ය යන දැවැන්ත බොරුව නිර්මාණය කළේ කවුරුන්ද යන්නයි.

තවද වඩාත් ම වැදගත් දෙය වන, මේ බොරුව චිරස්ථාපිත කළේ මන්ද යන්නයි.

ස්වකීය රටෙහි ප්‍රමුඛ නීතිය පිළිබඳ නීතිඥයන්ගේ සහ නීති ශිෂ්‍යයන්ගේ සකල පරම්පරාව ම මේ බොරුව ඉගෙන නොගත්තහුද?

මෙම සාවද්‍ය සංකල්පය මත පදනම් ව අධ්‍යාපන ආයතන විසින් සිය අධ්‍යාපනය ඉදිරියටත් තවත් ශිෂ්‍ය පරම්පරා සඳහා ලබානොදෙනු ඇත්ද?

## ආණ්ඩු ක්‍රමයේ ඇපකරු කවුද?

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිසි ලෙස ක්‍රියාත්මක වන්නේදැයි වගබලාගැනීම ට තමන් ට වගකීමක් නැතැයි ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා කීවේ නම් එවිට ප්‍රශ්නය වන්නේ මෙයයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිසි පරිදි ක්‍රියාත්මක වන බවට ඇපකරු වන්නේ කවුද?

එම ඇපකරු පාර්ලිමේන්තුව විය නොහැක්කේ, ජනාධිපතිවරයා ට සිය හිදිසි කල්පනාවක් හේතු කොට ගෙන පාර්ලිමේන්තුව විසුරුවා දැමිය හැකි වන නිසා ය. කිසිවක් පිළිබඳ කිසිදු ක්‍රියාමාර්ගයක් පාර්ලිමේන්තුව ට තනි ව ගත නොහැක. විධායක බලය අත්‍යන්තයෙන් ම ජනාධිපති මත රැඳී පවතියි. දැන්, මේ සම්බන්ධයෙන් පවා, ප්‍රංශය හා ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති හා පාර්ලිමේන්තුව අතර පවත්නා සම්බන්ධතාවය සමාන යැයි මුළාවක වැටී ඇති බව පෙනේ. කෙසේ වෙතත් මෙය ද, ආණ්ඩු ක්‍රම විශාරදයෙකු වන ඔලිවර් ඩුහමල් විසින් දක්වන පරිදි යථාර්ථයෙන් ඔබ්බෙහි වන දෙයකි.

ආණ්ඩුක්‍රම නීතියේ සම්භාව්‍ය වර්ගීකරණයන් විසින් හඳුනාගෙන ඇති පරිදි, ප්‍රංශ රජය පාර්ලිමේන්තුව ට පිළිතුරු දියයුතු හෙයින් ප්‍රංශයේ පවතින්නේ පාර්ලිමේන්තු ක්‍රමයකි. කෙසේ වෙතත් මහජන මතය අනුව, ජනාධිපතිවරයා ව ඍජු ලෙස ම ජනතාව විසින් පත් කරන හෙයින් ප්‍රංශයේ පවතිනුයේ ජනාධිපති ක්‍රමයකි. විශේෂඥයෝ මේ නිසා ප්‍රංශ ක්‍රමය කලවමක් ලෙස අර්ථදක්වති. එයට හේතුව, නීති විශාරද මවිරිස් ඩුවගර් විසින්, වැඩි අභිමානයක් එයට පවරා දෙමින් එයට "අර්ධ ජනාධිපති" ක්‍රමයක් යැයි පවසන තෙක්ම එය සම්ප්‍රදායික සංකල්පනාවන් සමග මිශ්‍ර වී පැවති නිසා ය.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

මෙකී ආණ්ඩු ක්‍රමයන් ද්විත්වය අතර පවතින තුන්වැනි වැදගත් වෙනස්කම වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවන් හි වෙනසයි. ප්‍රංශයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව (French Conseil Constitutionnel) බලවත් අධිකරණමය ව්‍යූහයකි. එය විධායකයේ මෙන්ම ව්‍යවස්ථාදායකයේ ශාඛාවලින් ද ස්වාධීන ය. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක භූමිකාව සඳහා ක්‍රමානුකූල ව කැටයම් කරන ලද්දකි.

ජර්මනියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය සහ ප්‍රංශයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් පිළිබඳ අධිකරණමය බලය පවතින ලෝකයේ ශ්‍රේෂ්ඨතම අධිකරණමය අධිකාරීන් අතර වේ.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මූලික වශයෙන් වැදගත් තිලයන් සඳහා පත්කිරීම් සම්බන්ධ ව කටයුතු කරන පරිපාලන ව්‍යූහයකි. එය කිසිදු ආකාරයකින් අධිකරණමය ව්‍යූහයක් නොවේ. එපමණක් නොව, ජනාධිපතිවරයා ට හෝ සෙසු අවිනිශ්චිතතාවයන් ට (සාමාජිකයන් පත් නොකිරීම වැනි) එය කඩාකප්පල් කිරීම ද කළ හැකි ය. වර්තමානය වන

විට මෙම සභාව එබඳු කඩාකප්පල්කිරීමක් අත්දකිමින් සිටියි. ප්‍රංශයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ට සමාන අධිකරණමය ආයතනයක් ශ්‍රී ලංකාවේ නොමැත. මෙකී ඌනතාවය, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ එකී ප්‍රංශ පිටපත අතර පවතින මූලිකතම වෙනස්කම් අතරින් එකකි.

**මහජන අධිකාරීන්**

මහජන අධිකාරීන්ගේ නිසි ක්‍රියාකාරිත්වය ද ප්‍රංශ ජනාධිපතිවරයා විසින් සහතික කළ යුතු ය. (ගෝලියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 5 වැනි වගන්තිය) නමුත් ශ්‍රී ලංකාවේ මහජන අධිකාරීන්ගේ නිසි ක්‍රියාකාරිත්වය සහතික කරන්නේ කවුරුන්ද?


අද වන විට, සම්පූර්ණ මහජන පරිපාලනය ම පවතිනුයේ බිඳ වැටෙන තත්වයක ය. පොලිස් ක්‍රමය, මැතිවරණ, මහජන සෞඛ්‍යය සහ අධ්‍යාපනය මෙන්ම ජීවිතයේ සෙසු ක්ෂේත්‍ර හා සම්බන්ධ මහජන පරිපාලනය පවතිනුයේ අරාජික තත්වයක ය. පාලක පක්ෂයේ සහ විරුද්ධ පක්ෂයේ සාමාජිකයන් ද ඇතුළු ව සෑම කෙනෙක් ම පාහේ, මහජනතාව සහ මාධ්‍යය විසින් හුවා දක්වන මෙම කරුණ සමග එකඟ වෙති. සාමාන්‍ය පුරවැසියාගේ දෛනික පැමිණිල්ල වනුයේ මහජන අධිකාරීන්ගේ ක්‍රියාකාරිත්ය තමන්ගේ යහපත සඳහා නොව තමන්ගේ හානිය සඳහා වන බවයි. මේ අතර ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුළ ද මෙකී මහජන අධිකාරීන්ගේ නිසි ක්‍රියාකාරිත්වය සහතික කරන කිසිවෙක් නොමැත.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මෙකී සියලු මූලික අංගයන් ප්‍රංශ මොඩලයෙන් වෙනස් ය. මෙවිට ප්‍රශ්නය වන්නේ, ප්‍රංශ මොඩලය සමග එය සමාන ය යන දැවැන්ත බොරුව නිර්මාණය කළේ කවුරුන්ද යන්නයි. තවද වඩාත් ම වැදගත් දෙය වන, මේ බොරුව චිරස්ථාපිත කළේ මන්ද යන්නයි. ස්වකීය රටෙහි ප්‍රමුඛ නීතිය පිළිබඳ නීතිඥයන්ගේ සහ නීති ශිෂ්‍යයන්ගේ සකල පරම්පරාව ම මේ බොරුව ඉගෙන නොගත්තහුද? මෙම සාවද්‍ය සංකල්පය මත පදනම් ව අධ්‍යාපන ආයතන විසින් සිය අධ්‍යාපනය ඉදිරියටත් තවත් ශිෂ්‍ය පරම්පරා සඳහා ලබානොදෙනු ඇත්ද? ජාතියේ වඩාත් ම සුවිශේෂී අංගයක් වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ මෙබඳු බරපතළ වැරදි තොරතුරක් මත, රටෙහි සකල ප්‍රජා අධ්‍යාපනය ම පදනම් ව නොමැත්තේද? මෙකී ගැටලුවල ට පිළිතුරු සැපයීම ට උත්සාහයක් තිබේ නම් රටේ සම්පූර්ණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විවාදය ම වෙනස් දෘෂ්ටියකින් දැකීම ට ජනතාව පටන් ගනු ඇත.

කෙසේ වෙතත් වඩාත් වැදගත් වන්නේ ජාතික පොලිස් කොමිසමේ සභාපතිවරයා විසින් නගන ලද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මේ වන විට අක්‍රිය ව පැවතීම සහ එබඳු අක්‍රියවීමක් ක්‍රියාවට නැංවීම පිළිබඳ ප්‍රායෝගික ප්‍රශ්නයන් ය. එබඳු අක්‍රියවීමක් නතර කර ගැනීමේ වගකීම කිසිවෙකු විසින් දැරිය යුතු ය. යම්කිසි නිලයක් විසින් මෙකී වගකීම ආරෝපණය කරගන්නා තෙක් රටේ ආයතනවලට නිසි පරිදි ක්‍රියාත්මක විය නොහැකිය. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ආණ්ඩුවක් පවතියි නම්, විසඳිය යුතු වඩාත් ම වැදගත් ව්‍යවස්ථානුකූල ගැටලුව මෙය විය හැකිය.

- *ලබන කලාපයට*

- *1978 ආණ්ඩුක්‍රමය පිළිබඳ සාකච්ඡාවක් සඳහා බැසිල් ප්‍රනාන්දු ලියූ "ගයිජස්ගේ මුද්ද" කියවන්න.*


ගයිජස්ගේ මුද්ද
ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
Gyges' Ring by Basil Fernando
සිංහල අනුවාදය දැන් වෙළඳපොළේ

ශ්‍රී ලංකාවේ බෙදාහැරීම:ස්ටැම්ෆර්ඩ් ලේක්



# තත්ත්ව වාර්තාව

## අගවිනිසුරු ආචාර්ය ශිරානි බණ්ඩාරනායකට එරෙහි දෝෂාභියෝගය හා

# ශ්‍රී ලංකාවේ අධිකරණ ස්වාධීනත්වය පිළිබඳ අර්බුදය

### හැඳින්වීම

අගවිනිසුරු ආචාර්ය ශිරානි බණ්ඩාරනායක මහත්මිය දෝෂාභියෝග යෝජනාවක්[1] මගින් එම ධුරයෙන් ඉවත් කිරීමට මහින්ද රාජපක්ෂ ආණ්ඩුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග ආශ්‍රයෙන් මතු වූ ගැටලුකාරී තත්ත්වය මේ වන විට ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණයේ බලතුලනය පිළිබඳ තීරණාත්මක අර්බුදයක් දක්වා වර්ධනය වී තිබේ.

රටේ උත්තරීතර නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 125 වන ව්‍යවස්ථාව අනුව එය අර්ථ නිරූපනය කිරීමේ බලය ඇති එකම හා අනන්‍ය ආයතනය වනුයේ ශ්‍රේෂ්ඨාධිකරණයයි. එහෙත් මෙම අර්බුදයේදී දෝෂාභියෝගයට අදාල ව්‍යවස්ථා ප්‍රතිපාදනයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් අර්ථ නිරූපනය[2] සහ රිට් ආඥාවක් (සර්ටියෝරාරි නියෝගයක්) මගින් අගවිනිසුරුවරිය සම්බන්ධයෙන් අභියාචනාධිකරණය ලබාදී ඇති තීන්දුවද නොතකා[3] ව්‍යවස්ථාදායකය කටයුතු කරන ලදී. ඒ සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකය ඉදිරිපත් කළ තර්කය වූයේ ජනතා පරමාධිපත්‍ය හිමි තමන් උත්තරීතර බැවින් තමන්ගේ ස්වාධීනත්වයට බලපෑම් කිරීමට කිසිදු ආයතනයකට හැකියාවක් නොමැති බවයි. කෙසේ වෙතත් ව්‍යවස්ථාදායකයේ එම ක්‍රියාමාර්ගයත් සමඟ රාජ්‍යයක් සතු කරගන්නා වූ බලය ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ වශයෙන් කොටස් තුනකට බෙදිය යුතු බවත්, ඒ බලය එකිනෙකින් වෙන්ව, ස්වාධීනව පැවතිය යුතු බවත් කියැවෙන සංවරණ හා තුලන සිද්ධාන්තය අකර්මන්‍ය වී ශ්‍රී ලංකාවේ අධිකරණය විධායකය හා ව්‍යවස්ථාදායකය යටතේ පාලනය වන ද්විතීයික ආයතනයක් බවට පත්ව තිබේ.

රාජ්‍යයක මනා පැවැත්ම සඳහා මෙම සංවරණ හා තුලන ක්‍රියාදාමයත්, මෙම ප්‍රධාන කුළුණු තුනෙහි අන්‍යෝන්‍ය සම්බන්ධතාවයත් ඉතා වැදගත්ය. ඉන් එක් කුළුණකට හානි සිදුවන විට එම බලපෑම සෙසු කුළුණු කෙරෙහිද, එසේම සමස්ථ ව්‍යුහය කෙරෙහිද අහිතකර ලෙස බලපායි.

TRANSPARENCY INTERNATIONAL SRI LANKA

1. පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 187, වෙළුම 1, පිටු අංක 3-10
2. අංක 358/2012 හා 3/20/2012 පෙත්සම් අනුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගාමිණී අමරතුංග, කේ. ශ්‍රී පවන් හා ප්‍රියසාද් ඩෙප් යන විනිසුරුවරුන්ගේ තීරණය
3. අභියාචනාධිකරණයේ (C. A. ) 411/2012 දරන නඩුවේ 2013-01-07 දින ප්‍රකාශයට පත් කරන ලද තීන්දුව හා එම තීන්දුව පිළිනොගන්නා බවට නියෝජ්‍ය කතානායක චන්දිම වීරක්කොඩි මහතා 2013 ජනවාරි 08 වන දින ජනමාධ්‍යයට කරන ලද ප්‍රකාශ (2013

රටක ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය පමණක් නොව රාජ්‍ය අංශය, නීතිය ක්‍රියාත්මක කරන ආයතන, විගණකාධිපති, ජනමාධ්‍ය වැනි සෙසු කුළුණු ද සුපිළිපන්, විනිවිදභාවයෙන් හා වගවීමෙන් යුතුව පවත්වාගෙන යෑම එම රටෙහි "ජාතික සුපිළිපන් ව්‍යුහයක්" ඇතිකරගැනීමේ කාර්යයේදී වැදගත් මෙහෙවරක් ඉටු කරයි. එසේම මෙම ආයතන විධිමත් හා ස්වාධීන ලෙස ක්‍රියාත්මක වන විට බලය අයුතු ලෙස යෙදවීම, අයථා ක්‍රියා හා සියලු ආකාරයේ සම්පත් අයුතු ලෙස යොදාගැනීම් ආදියෙන් යුත් 'දූෂණය' අවම වී එමගින් රටවැසියන්ට යහපාලනයේ වඩාත් ඵලදායී ප්‍රතිඵල අත්කර ගැනීමට අවකාශ හිමි වේ.

විශේෂයෙන්ම රටක අධිකරණ පද්ධතිය මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ද ප්‍රජාතන්ත්‍රීය අගයන් තහවුරු කිරීමට මෙන්ම විධායක ක්‍රියාමාර්ගවල නෛතිකභාවය සමාලෝචනයට ලක් කිරීමට ද බැඳී සිටින අතර[4] ජාතික සුපිළිපන් ව්‍යුහයක් තුළ එය වඩාත් ප්‍රබල කාර්යභාරයක් ඉටු කරයි.

එබැවින් මෙම තත්ත්ව වාර්තාවේදී වැඩි අවධානයක් යොමුකර ඇත්තේ අගවිනිසුරු ශිරානි බණ්ඩාරනායක මහත්මියට එරෙහි දෝෂාභියෝගයේ සඳහන් චෝදනා හා එම චෝදනා විභාගයට ගැනුණු ක්‍රමවේදයේ පැවති මතභේදාත්මක ස්වරූපයට වඩා ඒ ආශ්‍රයෙන් පැන නැගී ඇති බලතුලනයේ ගැටලු හා එම ගැටලු විසඳාගැනීමේ වැදගත්කම පිළිබඳවය.

## අගවිනිසුරුවරියට එරෙහි දෝෂාභියෝගයේ පසුබිම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 ව්‍යවස්ථාවට අනුකූලව ආචාර්ය ශිරානි බණ්ඩාරනායක මහත්මිය ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාර පදවියෙන් ඉවත් කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 117 දෙනෙකුගේ අත්සනින් ඉදිරිපත් වූ දෝෂාභියෝග යෝජනාව ප්‍රධාන චෝදනා 14 කින් සමන්විත විය. ඒ සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා ස්ථාවර නියෝග 78 අ (2) යටතේ අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා මහතාගේ සභාපතිත්වයෙන් යුත් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් කතානායකවරයා විසින් පත් කරන ලදී. 2012 නොවැම්බර් 14 දින, පත් කරන ලද එම සභාවට නිමල් සිරිපාල ද සිල්වා, ඒ ඩී සුසිල් ප්‍රේමජයන්ත, වෛද්‍ය රාජිත සේනාරත්න, ඩිලාන් පෙරේරා, විමල් වීරවංශ, නියොමාල් පෙරේරා (ආණ්ඩු පක්ෂයේ) සහ ජෝන් අමරතුංග, ලක්ෂ්මන් කිරිඇල්ල, විජිත හේරත්, ආර් සම්පන්දන් යන (විපක්ෂයේ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 11 දෙනා අයත් වූහ.

2012 නොවැම්බර් 14 දින සිය චෝදනා විභාගය ආරම්භ කළ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව දෝෂාභියෝග චෝදනා 14 න්[5] 1-5 දක්වා චෝදනා පමණක් විභාග කොට එයින් චෝදනා 3 කට (1, 4 හා 5 වැනි චෝදනාවලට) අගවිනිසුරුවරිය වැරදිකාරිය බවට තීරණය කළේය.[6]

අගවිනිසුරුවරිය වැරදිකරු බවට අවසන් තීරණය ගත් දෙසැම්බර් 8 වැනි දා පැවති කාරක සභාවේ විපක්ෂ නියෝජිතයින් කිසිවෙකු නොවූ අතර එය මුළුමනින්ම ආණ්ඩු පක්ෂ නියෝජිතයින්ගෙන් පමණක් සමන්විත විය. එම කාරක සභාව නියෝජනය කළ විපක්ෂ මන්ත්‍රීවරු සිව්දෙනා "අගවිනිසුරුවරියට එරෙහි චෝදනා විමර්ශනය කෙරෙන ආකාරය පිළිබඳව තමන්ට සෑහීමකට පත්විය නොහැකි බවත්, එම කමිටුව ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව විශ්වාසයක් නොමැති නිසා තමන් ඉන් ඉවත් වන බවත්" ප්‍රකාශ කරමින් දෙසැම්බර් 06 වන දින සිට කාරක සභාවට සහභාගී වීම වර්ජනය කළෝය.

අගවිනිසුරුවරිය ට එරෙහි දෝෂාභියෝගයේ තීන්දු ඇතුළත් නිල වාර්තාව මේ වනවිට පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 187 වශයෙන් වෙළුම් දෙකකින් යුක්තව පළ කොට තිබේ. එම වාර්තාව පිටු 1575 කින් සමන්විතය.

ආරම්භයේ සිටම මෙම දෝශාභියෝග ක්‍රියාවලියෙහි පැවති දෝෂ සහිත ස්වභාවය හේතුවෙන් එය දේශීය හා ජාත්‍යන්තර තලයේ ප්‍රකට නීති විශාරදයින්, ආගමික නායකයින්, බුද්ධිමතුන්, දේශපාලනඥයින්, සිවිල් සමාජ ක්‍රියාකාරීන් හා පුරවැසි ප්‍රජාවගේ දැඩි විවේචනයට හේතු විය.

අගවිනිසුරුවරියට එරෙහිව මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ඉදිරිපත් කරන ලද චෝදනා විශේෂයෙන්ම 'දූෂණය' හා බැඳුණු ප්‍රබල කරුණු ලෙස බැලූ බැල්මට පෙනෙන්නට තිබුණත් එම ක්‍රියාවලියේ තිබූ දේශපාලන ස්වරූපය නිසා රට තුළ සැලකිය යුතු පිරිසකට ඒ පිළිබඳ සැක සංකා මතු වී තිබිණි. පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව පිළිබඳ සිය නීතීඥයින් මඟින් ප්‍රතිචාර දක්වමින්[7] අගවිනිසුරුවරිය එහි අධිකරණ බලය හා අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමට ඇති බලය ප්‍රතික්ෂේප කළ අතර තමන්ට එරෙහි සියලු චෝදනාද ප්‍රතික්ෂේප කළාය. එසේම තමන්ට එරෙහි චෝදනා සම්බන්ධයෙන් තිබෙන ලේඛන ලබාදෙන ලෙස ඉල්ලා සිටියාය. එම ප්‍රශ්නය දෙස මධ්‍යස්ථව බැලූ බොහෝ පාර්ශව ඉල්ලා සිටියේ අගවිනිසුරුට එරෙහි චෝදනා ගැන විනිවිදභාවයෙන් යුත් සාධාරණ විභාගයක් අවශ්‍ය බවය. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ස්ථාවරය[8] වූයේ ද රටක් වශයෙන් ශ්‍රී ලංකාව පිළිගෙන ඇති ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව අගවිනිසුරුවරියට සාධාරණ විනිශ්චයකට ඉඩසලසා දිය යුතු බවය.

> **"රටක අධිකරණ පද්ධතිය මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ද ප්‍රජාතන්ත්‍රීය අගයන් තහවුරු කිරීමටද එසේම විධායක ක්‍රියාමාර්ගවල නෛතිකභාවය සමාලෝචනයට ලක් කිරීමට ද බැඳී සිටින අතර ජාතික සුපිළිපන් ව්‍යුහයක් තුළ එය වඩාත් ප්‍රබල කාර්යභාරයක් ඉටු කරයි"**

දෝෂාභියෝගය ආරම්භයේදී අගවිනිසුරුවරිය සිය නීතිඥවරුන් මාර්ගයෙන් පාර්ලිමේන්තු කාරක සභාව හමුවේ පෙනීසිටිය ද අනතුරුව "තමන්ගේ විත්තිවාචකය සකස් කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදී නොමැති බවත්, කාරක සභාවේ කටයුතුවලදී අනුගමනය කරනු ලබන ක්‍රියා පටිපාටිය පිළිබඳව තමන්ට දැනුම් දී නොමැති බවත් පවසමින් චෝදනා විභාග පටිපාටියට විරෝධය පළ කරමින් තවදුරටත් කාරක සභාවේ කටයුතු සඳහා සහභාගී නොවී ඉවත් වීමට තීරණය කළ බව" දැනුම් දුන්නාය.[9]

දෝෂාභියෝග චෝදනාව විභාග කරන පාර්ලිමේන්තු කාරක සභාවට පිළිගත් කාර්ය පටිපාටියක් නොමැති වීමත්, චෝදනාවලට අදාළ සාක්ෂිකරුවන්ගේ හා ලේඛනවල ලැයිස්තුවක් ඉදිරිපත් නොවීමත්, චෝදනාවලට පිළිතුරුදීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා නොදීමත්, ඔප්පුකිරීමේ භාරය

4. National Integrity System Assessment Sri Lanka 2010, TISL, p-19
5. පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 187, වෙළුම 1, 8-10 පිටු
6. පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 187, වෙළුම 2, 1574,1575 පිටු
7. පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 187, වෙළුම 2, පිටුව 1327
8. TISL ආයතනය ජනාධිපතිවරයාට, කතානායකවරයාට හා පක්ෂ නායකයින් වෙත යැවූ විවෘත ලිපිය www.tisrilanka.org/?p=10271
9. පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 187, වෙළුම 2

(Burden Of Proof) ගැන ප්‍රමිතියක් නොතිබීමත් විශේෂයෙන්ම නඩු විභාගයේ විවෘතභාවයක් නොතිබීමත්, මේ පිළිබඳ අදහස් පළ කළ නීති විශාරදයින්ගේ හා සිවිල් සමාජයේද දැඩි විවේචනයට හේතු වී තිබිණි.

මේ අතර අගවිනිසුරුවරියට එරෙහි දෝෂාභියෝගයේ සඳහන් චෝදනා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් ඉදිරියේ විමසීමට ඇති අයිතිය අභියෝගයට ලක් කරමින්, පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති යෝජනාවෙහි අඩංගු අපචාර හා අශක්නුතා පිළිබඳ චෝදනා අධිකරණයක් මගින් විමර්ශනය කළ යුතු කරුණු නිසා එම චෝදනා විභාග කිරීම පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ සාමාජිකයින් 11 දෙනාට තහනම් කරන රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා පෙත්සම්කරුවෝ 7 දෙනෙක් අභියාචනාධිකරණය ඉදිරියට ගියෝය.[10] එම පෙත්සම් සලකා බැලූ අභියාචනාධිකරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 125 වැනි වගන්තියට අනුකූලව එම ව්‍යවස්ථාවේ 107(3) වැනි වගන්තිය පිළිබඳව අර්ථ නිරූපනයක් ලබාගැනීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමැසීය.

එහිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්ථ නිරූපන බලය උපයෝගී කරගනිමින් ශ්‍රේෂ්ඨාධිකරණය[11] පෙන්වා දුන්නේ "නෛතික රීතිය පදනම් කොට ගත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකින් පාලනය වන රාජ්‍යයක උසාවියකට, විනිශ්චය සභාවකට හෝ වෙනත් මණ්ඩලයකට පුද්ගලයෙකුගේ අයිතිවාසිකම් කෙරෙහි බලපාන තීරණයක් ගැනීමට එම උසාවියට, විනිශ්චය සභාවට හෝ මණ්ඩලයට නීතියෙන් පැවරුණු බලයක් නැත්නම් අධිකාරී බලයක් හිමි නොවන" බවයි.

"එවැනි උසාවියකට, විනිශ්චය සභාවකට හෝ මණ්ඩලයකට නෛතික බලයක් පැවරිය හැක්කේ "නීතියක්" වන පාර්ලිමේන්තු පනතක් මගින් මිස පාර්ලිමේන්තුවේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යෑම සඳහා සැකසී තිබෙන නීතිය නොවන රෙගුලාසි හෙවත් ස්ථාවර නියෝග මගින් නොවේ. ආණුඩුක්‍රම ව්‍යවස්ථාවේ "නීතිය" යන්නට නිර්වචන දක්වන 170 වෙනි වගන්තියෙහි සඳහන් අර්ථ නිරූපනය අනුව "ස්ථාවර නියෝග" යනු නීතියක් නොවේ." යැයිද එහිදී ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දුන්නේය.

> **"අගවිනිසුරුවරියට එරෙහිව මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ඉදිරිපත් කරන ලද චෝදනා විශේෂයෙන්ම 'දූෂණය' හා බැඳුණු ප්‍රබල කරුණු ලෙස බැලූ බැල්මට පෙනෙන්නට තිබුණත් එම ක්‍රියාවලියේ තිබූ දේශපාලන ස්වරූපය නිසා රට තුළ සැලකිය යුතු පිරිසකට ඒ පිළිබඳ සැක සංකා මතු වී තිබිණ"**

අනතුරුව අගවිනිසුරු ශිරානි බණ්ඩාරනායක මහත්මිය තමන්ට එරෙහිව පාර්ලිමේන්තු කාරක සභාව දෙන ලද තීන්දුවට එරෙහිව සර්ටියෝරාරි (රිට්) ආඥාවක් ලබාගැනීම සඳහා අභියාචනාධිකරණය ඉදිරියට ගිය අතර අභියාචනාධිකරණය විසින්, අගවිනිසුරුවරියට එරෙහිව පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව දෙන ලද තීන්දුව 2013 ජනවාරි 3 දින නිශ්ප්‍රභා කරනු ලැබීය.

ඒ අනුව ජනවාරි 7 වැනිදා පැවැති පක්ෂ නායක රැස්වීමේදී දෝෂාභියෝග යෝජනාව පිළිබඳ විවාදය පැවැත්වීම ගැන විපක්ෂය විරෝධය පළකළ අතර පක්ෂ නායක රැස්වීමේ ඒකමතිකභාවයකින් තොරවම[12] එම විවාදය පැවැත්වීමට ආණ්ඩුව තීරණය කළේය.

අගවිනිසුරුවරිය ධූරයෙන් ඉවත් කිරීමේ යෝජනාවට අදාළ පාර්ලිමේන්තු විවාදය, ඡන්ද විමසීම හා ජනාධිපතිවරයා විසින් අගවිනිසුරුවරිය ඉවත් කිරීමේ තීරණය ක්‍රියාත්මක වනුයේ මෙම අධිකරණ තීන්දු දෙකම බලාත්මකව තිබෙන පසුබිමක් තුළය.

## ජනතා පරමාධිපත්‍යය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වැනි වගන්තිය අනුව පරමාධිපත්‍යය හිමිව ඇත්තේ ජනතාවටය. ඊට පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය අයත්ය.

එසේම එම පරමාධිපත්‍යය බලය අත්හල නොහැකිය. ජනතාවට හිමි පරමාධිපත්‍යය ක්‍රියාත්මකවීමද, භුක්තිවිඳීමද සිදුවිය යුතු ආකාරය ව්‍යවස්ථාවේ සිව්වැනි වගන්තිය මඟින් විස්තරකර තිබේ. ඒ අනුව ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ජනතාව විසින් තෝරාපත්කරගනු ලබන මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව විසින්ද, ජනමත විචාරණයකදී ජනතාව විසින්ද ක්‍රියාත්මක කළ යුතුය. රටේ ආරක්ෂාව ඇතුළුව ජනතාවගේ විධායක බලය ජනතාව විසින් තෝරාපත් කරගනු ලබන ජනරජයේ ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කළ යුතුය. නීතිය අනුව පාර්ලිමේන්තුව විසින්ම ක්‍රියාත්මක කළ හැකි පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද, පරිහාර හා බලතල සම්බන්ධයෙන් විනා ජනතාවගේ අධිකරණ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කොට පිහිටුවන ලද හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකාර සහ ආයතන මඟින් පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුත්තේය.

ශ්‍රී ලංකාවේ පවත්නා ලිඛිත ව්‍යවස්ථාව අනුව පරමාධිපත්‍ය ඇත්තේ ජනතාවට බවත්, ජනතාව සතු පරමාධිපත්‍ය බලය ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ වශයෙන් කොටස් තුනකට බෙදෙන බවත් ඒ අනුව පැහැදිලිය.

ශ්‍රී ලංකාව බිහිකළ කීර්තිමත් ශ්‍රේෂ්ඨාධිරණ විනිසුරුවරයෙකු ලෙස සැලකෙන විනිසුරු මාර්ක් ප්‍රනාන්දු මහතා පවසන ආකාරයට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ජනතාවට පරමාධිපත්‍ය ලබානොදෙන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පූර්ව කාරණයක් ලෙස ජනතාවට පරමාධිපත්‍ය හිමි බව හඳුනා ගනී.[13]

## පරමාධිපත්‍යය පාර්ලිමේන්තුව සතු ද?

පරමාධිපත්‍ය ජනතාව සතු නිසා, එම ජනතාව නියෝජනය කරන මහජන නියෝජිතයින්ගෙන් සැදුම්ලත් පාර්ලිමේන්තුවට ස්වාධිපත්‍ය බලය හිමි බව අගවිනිසුරුවරියට එරෙහි දෝෂාභියෝගය ආශ්‍රයෙන් මතු වූ අර්බුදයේදී ආණ්ඩු පාර්ශවයෙන් ඉදිරිපත් වූ තර්කයකි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන වගන්තියේ "ජනතා අධිකරණ බලය උසාවි හරහා පාර්ලිමේන්තුව විසින් යොදාගත යුතු බව" සඳහන් වන නිසා එමඟින් පාර්ලිමේන්තුවට අධිකරණ බලය පවරාදී ඇති බවක් හැඟෙන බවටද එහිදී තර්කයක් මතුව තිබිණි. නීති විෂයය පිළිබඳ ආචාර්ය උපාධිධාරිනියක හා ප්‍රජා අයිතිවාසිකම් ආරක්ෂණ පෙරමුණේ සාමාජිකාවක වන ආචාර්ය රීසා හමීඩ් පෙන්වා දෙන්නේ[14] "ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවට අධිකරණ ක්ෂේත්‍රයේ

10. ශ්‍රේෂ්ඨාධිකරණයේ යොමු අංක 2012/4,5,6,7,8 හා 9 අයදුම්පත්
11. එම නඩු තීන්දුව ( )
12. "සහෝදරයා වෙනුවෙන් කතානායක කඩේ ගියා" - පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් පී පෙරේරා 2013 ජනවාරි 20 රාවය 8 පිටුව
13. ප්‍රනාන්දු M. D. H. "Defacting the dragon : Weapons for fighting corruption", ධවල පත්‍රිකාව" ශ්‍රී ලංකා දූෂණයන්ට එරෙහි වැඩසටහන" ARD inc, 2007 බලන්න.
14. 2012-12-21 දාතමින් ප්‍රජා අයිතිවාසිකම් ආරක්ෂක පෙරමුණ විසින් නිකුත් කරන ලද S01/12/2012 දරන පත්‍රිකාව (Sri Lanka Gurdaian හි පළවූ ලිපියක සංස්කරණයකි.)

ඉටුකිරීමට භූමිකාවක් නොමැති බවයි." ආචාර්ය හමීඩ් වැඩිදුරටත් පෙන්වා දෙන්නේ, "අධිකරණ බලතල එම කාර්ය සඳහා පත්කරන ලද උසාවි සහ අනෙකුත් විනිශ්චය සභා හරහා යොදා ගත යුතු බව 4 වන වගන්තියේ පැහැදිලිව දක්වා ඇති අතර පාර්ලිමේන්තුව එය සෘජුවම භාවිතා කළ යුතු නැති බවයි. එසේම පාර්ලිමේන්තුවට අධිකරණ බලතල යොදාගැනීමේ ආයතන ඇති කිරීමට බලතල තිබෙන නිසාම ඊට එම බලතල තමන්වෙත පවරාගත නොහැකි බවයි. පාර්ලිමේන්තුවේ කාර්යභාරය, නිසි අයුරු යුක්තිය පසිඳුලීමේ උසාවි සහ අනෙකුත් ආයතන ඇති කිරීමටත්, එම ආයතනවලට තම කාර්ය ඉටුකිරීමට අවශ්‍ය සම්පත් ප්‍රතිපාදනය කිරීමටත් සීමාවන බවත් එය සිදුකරන්නේ මූල්‍ය සම්පත් ප්‍රතිපාදනය කරන්නාක් වැනි වෙනත් කාර්යයක කොටසක් මෙන් බවත් ආචාර්ය හමීඩ් පෙන්වා දෙයි.

මෙම තත්ත්වයෙන් බැහැරව පාර්ලිමේන්තුවට කළ හැක්කේ තමන්ගේම වරප්‍රසාදවලට සහ පරිහාරයන්ට (Immunities) බලපාන කරුණු පිළිබඳ ක්‍රියාත්මක වීම පමණි.

මෙම ගැටලුව සම්බන්ධයෙන් ආචාර්ය රීසා හමීඩ් දක්වන අවසන් නිගමනය වන්නේ, "ශ්‍රී ලංකාවේ උත්තරීතර වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවය. ජනතාව පරමාධිපති වේ. පාර්ලිමේන්තුවට රට පාලනයේදී ඉතා වැදගත් භූමිකාවක් හිමිවන නමුත් එය පරමාධිපති හෝ උත්තරීතර නොවේ." යන්නයි.

පාර්ලිමේන්තුව විසින් අධිකරණ බලය පාවිච්චි කිරීම කොතෙක් දුරට උචිතද යන කරුණ 1984 දී රාජනීතිඥ නෙවිල් සමරකෝන් මහතා අගවිනිසුරු ධූරයෙන් ඉවත් කිරීමට දෝෂාභියෝගය[15] ඉදිරිපත් වූ අවස්ථාවේදීද දීර්ඝ වශයෙන් සාකච්ඡාවට ලක් වී තිබේ. එහිදී මතු වූ ප්‍රධාන තර්කයන් වී ඇත්තේ ද ඔප්පු කරන ලද විෂමාචාරයන් සම්බන්ධයෙන් සුදුසු තීරණ ගැනීමට පාර්ලිමේන්තුවට හැකි වුවද එම "අබලතාවය හෝ විෂමාචාරය" ඔප්පු කිරීම සිදුවිය යුත්තේ අධිකරණ බලය දැරීමට සුදුසු විනිසුරු මඬුල්ලක් ඉදිරිපිටදී බවයි. නෙවිල් සමරකෝන් අගවිනිසුරුවරයා වෙනුවෙන් පෙනී සිටි රාජනීතිඥ එස්. නඩේසන් මහතා ඇතුළු නීතිඥ කණ්ඩායම එම තේරීම් කාරක සභාව ඉදිරියේ පෙනී සිටි සෑම අවස්ථාවකම පාහේ ඉහත කරුණු නැවත නැවතත් මතු කරමින් එය ව්‍යවස්ථා විරෝධී මණ්ඩලයක් බවට තර්ක කර තිබේ.

අගවිනිසුරු සමරකෝන් මහතාට එරෙහි දෝෂාභියෝග යෝජනාව විභාග කිරීමට පත්කළ තේරීම් කාරක සභාවේ, විරුද්ධ පක්ෂය නියෝජනය කළ මන්ත්‍රීවරුන් වූ සරත් මුත්තෙට්ටුවේගම, අනුර බණ්ඩාරනායක හා දිනේෂ් ගුණවර්ධන යන මහජන නියෝජිතයින්ගේද මතය වී ඇත්තේ අධිකරණමය වශයෙන් කලින් ඔප්පු කර නැතොත් "ඔප්පු නොකරන ලද අබලතාවයක් හෝ විෂමාචාරයක්" ගැන තේරීම් කාරක සභාවකට තීරණය කළ නොහැකි බවය.[16]

## තේරීම් කාරක සභා තීරණ අවසන් තීරණයද?

නීති විෂය පිළිබඳ මහාචාර්යවරයකු වූ ආචාර්ය නිහාල් ජයවික්‍රම පෙන්වා දෙන පරිදි[17] තේරීම් කාරක සභාවක නිගමන අවසානාත්මක නිගමනයක් නොවේ. එම නිගමන අධිකරණ විමර්ශනයට ලක්කිරීමේ ව්‍යවස්ථාපිත අයිතියක් පවතින බව 2002 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආණ්ඩුව නිල වශයෙන් පිළිගෙන තිබේ. ඒ, සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද මානව හිමිකම් කමිටුව විසින්, විනිශ්චයකරුවෙකුගේ හැසිරීම පිළිබඳ විභාග කිරීමට බලයක් සැපයෙන 78 ඒ නැමැති ස්ථාවර නියෝගය පිළිබඳව ප්‍රශ්න කරන ලද අවස්ථාවේය. එහිදී ශ්‍රී ලංකා ආණ්ඩුව නිල වශයෙන් ලබා දී ඇති පිළිතුරෙහි මෙසේ සඳහන් වේ. "විභාග කිරීමේ කමිටුව මඟින් ස්වභාවික යුක්තියේ නියාමයන් අනුගමනය කොට නැත්නම් එය අධිකරණ විමර්ශනයට ලක්විය යුත්තේය.

ඇත්තෙන්ම විභාග කිරීමේ කමිටුව එළැඹෙන තීන්දු අධිකරණ විමර්ශනයට ලක්කිරීම බැහැර කිරීමක් ව්‍යවස්ථාවේ අදාළ විධිවිධාන හෝ ස්ථාවර නියෝග මඟින් අපේක්ෂා නොකෙරේ. එබැවින් පාර්ලිමේන්තු තේරීම් කමිටුව නීතිය වරදවා ගන්නේ නම් හෝ ස්වභාවික යුක්ති ධර්මයේ නියාමයන් උල්ලංඝනය කරන්නේ නම් හෝ එම කමිටුවේ තීන්දු අධිකරණ විමර්ශනයට යටක් කළ හැකි බව පිළිගැනේ."

> **"පාර්ලිමේන්තුව විසින් අධිකරණ බලය පාවිච්චි කිරීම කොතෙක් දුරට උචිතද යන කරුණ 1984 දී රාජනීතිඥ නෙවිල් සමරකෝන් මහතා අගවිනිසුරු ධූරයෙන් ඉවත් කිරීමට දෝෂාභියෝගය ඉදිරිපත් වූ අවස්ථාවේදීද දීර්ඝ වශයෙන් සාකච්ඡාවට ලක් වී තිබේ එහිදී මතු වූ ප්‍රධාන තර්කයන් වී ඇත්තේ ද ඔප්පු කරන ලද විෂමාචාරයන් සම්බන්ධයෙන් සුදුසු තීරණ ගැනීමට පාර්ලිමේන්තුවට හැකි වුවද එම "අබලතාවය හෝ විෂමාචාරය" ඔප්පු කිරීම සිදුවිය යුත්තේ අධිකරණ බලය දැරීමට සුදුසු විනිසුරු මඬුල්ලක් ඉදිරිපිටදී බවයි"**

"නීතිය මඟින් ස්ථාපිත කරන ලද බලයලත් අපක්ෂපාතී, ස්වාධීන විනිශ්චය සභාවක සාධාරණ සහ ප්‍රසිද්ධ විභාග යකට සෑම කෙනෙකුටම අයිතිය ඇත්තේය" යන සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ 14 වැනි වගන්තියට තමන් එකඟ බවට එහිදී ශ්‍රී ලංකා ආණ්ඩුව ශපථ කොට තිබේ. ශ්‍රී ලංකාවේ උසස් අධිකරණයේ විනිසුරුවරුන් තනතුරෙන් ඉවත් කිරීම සඳහා යොදාගැනෙන ක්‍රමවේදයේ ඇති වැරදි සහගත ස්වරූපය අධිකරණ ස්වාධීනත්වය වෙනුවෙන් පෙනී සිටින ජාත්‍යන්තර සංවිධාන විසින් 1997 සිට පෙන්වා දී ඇති අතර ඒ සඳහා නීතියෙන් නියම කරන ලද අධිකරණ ආයතනයක් ඇති කරගැනීමේ වැදගත්කම අවධාරණය කර තිබේ. 1997 දී විනිශ්චයකරුවන් හා නීතිඥයින්ගේ ස්වාධීනත්වය සඳහා වන අන්තර්ජාතික කේන්ද්‍රය වෙනුවෙන් එක්සත් රාජධානියේ ගුඩ්හාර්ට් සාමිවරයා, ඉන්දියාවේ හිටපු අගවිනිසුරු පී. එන්. බගවතී හා දකුණු අප්‍රිකාවේ නීතිඥ පීනියස් ඇම්. මොජපෙලෝ යන තිදෙනා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ මෙසේ සඳහන් කරයි. "පාර්ලිමේන්තු ස්ථාවර නියෝග යටතේ ක්‍රියාත්මක වන පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් විසින් ජ්‍යෙෂ්ඨ විනිශ්චයකරුවෙකුගේ චෝදිත විෂම පැවැත්ම හෝ අබලතාවය ගැන විභාග කිරීම ඉතාමත් අයෝග්‍ය යැයි අපි සිතමු. එබඳු විභාග කිරීමක් පැහැදිලිවම අධිකරණ ක්‍රියාදාමයක් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(3) වගන්තිය වෙනුවට චෝදිත විෂම පැවැත්ම හෝ අබලතාවය විමර්ශනය කිරීම සහ ඔප්පු කිරීම සුදුසු අධිකරණ මණ්ඩලයකින් කළ යුතු බව දැක්වෙන වගන්තියක් යෙදිය යුතු යැයි අපි නිර්දේශ කරමු."

---

15. පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 71 (1984 සැප්තැම්බර් 05)
16. පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 71 පිටුව 12
17. 2012 දෙසැම්බර් 30 වන දින Colombo Telegraph වෙබ් අඩවියේ පළවූ Is The Anura Bandaranayaka Ruling Relevent Today? ලිපියේ සිංහල පරිවර්තනය - 2013 ජනවාරි 06 රාවය

1953 පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 3 වැනි වගන්තිය, එනම්, "පාර්ලිමේන්තුව තුළ කතා කිරීමේ සහ පටිපාටිකරණයේ නිදහස ඇත්තේය. ඒ නිදහස අභියෝගයට ලක්කිරීමට හෝ ප්‍රශ්න කිරීමට කිසිම අධිකරණයකට හෝ පාර්ලිමේන්තුවෙන් පිටස්තර වෙනත් කිසි ස්ථානයකට හෝ බලයක් නැත්තේය" යන්න පදනම් කරගනිමින් "අධිකරණ නියෝගයකට යටත් නැති වරප්‍රසාදිත තත්ත්වයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හිමිවන බවට තීන්දුවක් දුන් කතානායක අනුර බණ්ඩාරනායක මහතාම එම තීන්දුවෙහි අවසානයේ සඳහන් කර ඇති පහත තීරණය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කිරීම වැදගත්ය.

"අලුත් ව්‍යවස්ථාවක් හඳුන්වාදීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ට එරෙහිව දෝෂාභියෝග චෝදනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් හෝ පවත්නා ස්ථාවර නියෝග සංශෝධන කිරීම කෙරෙහි ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් තම අවධානය යොමු කිරීම මැනවි."

> **“ තේරීම් කාරක සභාවක නිගමන අධිකරණ විමර්ශනයට ලක්කිරීමේ ව්‍යවස්ථාපිත අයිතියක් පවතින බව 2002 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආණ්ඩුව නිල වශයෙන් පිළිගෙන තිබේ. ඒ, සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද මානව හිමිකම් කමිටුව විසින් විනිශ්චයකරුවෙකුගේ හැසිරීම පිළිබඳ විභාග කිරීමට බලයක් සැපයෙන 78 ඒ නැමැති ස්ථාවර නියෝගය පිළිබඳව ප්‍රශ්න කරන ලද අවස්ථාවේය. ”**

## ශ්‍රී ලංකාවේ අගවිනිසුරුවරිය සහ නව අගවිනිසුරුවරයා

මේ වන විට තේරීම් කාරක සභා තීරණය ක්‍රියාවට නංවමින් ජනාධිපතිවරයා විසින් අගවිනිසුරු ශිරානි බණ්ඩාරනායක මහත්මිය තනතුරෙන් ඉවත් කර ජනාධිපති නීතිඥ මොහාන් පීරිස් මහතා නව අගවිනිසුරුවරයා වශයෙන් පත්කර තිබේ. එහෙත් ශ්‍රී ලංකාවේ උපරිමාධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ තීරණය අනුව අගවිනිසුරුවරියට එරෙහිව පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව දෙන ලද තීන්දුව මේ වන විට පවතින්නේ බලරහිත තත්ත්වයකය. ඒ අනුව මේ වනවිට ශ්‍රී ලංකාවට අගවිනිසුරුවරුන් දෙදෙනෙක්ම සිටිති.

එසේම මෙම උභතෝකෝටිකයට සියලු පාර්ශවවලට පිළිගතහැකි විසඳුමක් සලසා ගන්නා තුරු ශ්‍රී ලංකාවේ අධිකරණ ස්වාධීනත්වය සහ බලතුලනය පිළිබඳ අර්බුදය දිනෙන් දිනම වර්ධනය වෙමින් පවතී.

තනතුර අහිමිවීමෙන් පසු අගවිනිසුරු ශිරානි බණ්ඩාරනායක මහත්මිය මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කළේ[18] "නීතියේ ආධිපත්‍යයේ මූලික පදනම වූ සහ මූලික නිදහස පවතින ප්‍රජාතන්ත්‍රවාදී ලෙස හඳුන්වනු ලබන මාගේ රටෙහි තවමත් නිසි ලෙස පත්කරන ලද නීත්‍යානුකූල අග්‍රවිනිශ්චයකාරවරිය තමා බවයි." එසේම තමා ඉවත් කළ සමස්ථ ක්‍රියාවලිය පිළිබඳව සංක්ෂිප්තව අදහස් දක්වමින් බණ්ඩාරනායක මහත්මිය ප්‍රකාශ කළේ "මේ ක්‍රියාදාමය තුළ අග්‍රවිනිශ්චයකාර ධුරය පමණක් නොව අධිකරණයේ ස්වාධීනත්වයද බලහත්කාරයෙන් පැහැරගෙන තිබෙන බවයි. එසේම, නීතියේ පාලනය, නීතිය අනුගමනය කිරීම හා ස්වභාවික යුක්තියේ මූලධර්ම යන සංකල්පයන් පිටමං කර ඇතිවා පමණක් නොව කෲර ලෙස විකෘති කොට ඇති බවයි."

## "පරම බලය හා පරම දූෂණය"

මීට සියවසකට ඉහතදී (1887දී) ඇක්ටන් සාමිවරයා විසින් ප්‍රකාශ කළ "බලය දූෂණයට හේතු වේ. පරම බලය පරම දූෂණයට හේතු වේ" යන කියමන සිහිපත් කරමින් මෙම අර්බුදය ගැන අදහස් දක්වන කීර්තිමත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙකු වූ (විශ්‍රාමික) සී. වී. විග්නේෂ්වරන් මහතා පෙන්වා දෙන්නේ "නීතියෙන් සංවරණ හා තුලන ක්‍රම යොදා ඇතිතේ ආභරණයක් වශයෙන් නොවන බවයි. එක තැනක බලය ඒකරාශී වීමෙන් රජයේ අනෙක් අංශ තුන අතර ඇති බලතුලනයේ සුසංයෝගයට හානි පැමිණෙන බවත්, බලයේ අසමතුලිතතාවයක් පවතින විට තවත් බලතල එතැනට ඒකරාශී වීමෙන් විනාශයක් කැඳවන බවත් විනිසුරු විග්නේෂ්වරන් ගේ අදහසයි. එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ඔහු ප්‍රකාශ කරන්නේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද 18 වන සංශෝධනයට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉඩදුන් විට ඉදිරියේදී මෙවැනි සිද්ධීන් විය හැකි බව ශ්‍රේෂ්ඨාධිකරණයේ කිහිප දෙනෙකුගේම මතය වූ බවයි.

පසුගිය දශක දෙකකට අධික කාලය තුළ අධිකරණ ස්වාධීනත්වය වෙනුවෙන් සුවිශේෂී මෙහෙවරක යෙදුනු පුවත්පතක් ලෙස සැලකිය හැකි "රාවය" පුවත්පත මෙම අර්බුදය හා වර්තමානයේ ශ්‍රී ලංකාවේ අධිකරණය මුහුණ දී සිටින ඛේදවාචකය සිය කතුවැකිය මගින් මෙසේ විග්‍රහ කර තිබේ.[19] "ආණ්ඩුව අධිකරණය යටත් කරගැනීමේ සටන කළේ කිසිම නීතියක් නැතිවය. සාධාරණයක්, සම්මතයක්, පිළිගත් කාර්ය පටිපාටියක් නැතිවය. කිසිවෙකුගේ අවවාදයකට මගපෙන්වීමකට ඇහුම්කන් නොදෙමිනි. රස්තියාදුකාරයෙකුගේ භූමිකාවට මුළුමනින්ම ආරූඪ වෙමිනි. ඒ පහත් සටනට ගොදුරු වූයේ අගවිනිසුරුවරිය පමණක් නොවේ. මුළු අධිකරණ පද්ධතියමය. ජනතාවගේ අධිකරණ බලයය.

අගවිනිසුරුවරිය නික්ම ගියාය. එහෙත් තදබල ලෙස දුර්වර්ණ වූද අවලාදයට හා අවමානයට පාත්‍රකරන ලද්දා වූද අධිකරණය ඉතිරිව තිබේ. ඉතිරිව ඇත්තේ තමන් දෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්ථ නිරූපණයන් කෙව්ටෙන් තලා බැහැර කරනු ලැබීමේ ඉරණමට පාත්‍ර වූ ශ්‍රේෂ්ඨාධිකරණයකි. තමන් නිකුත් කළ රිට් ආඥා අලුයම ලූ කෙළ පිඬක් සේ ඉවත දමනු ලැබීමේ ඉරණමට පාත්‍ර වූ අභියාචනාධිකරණයකි."

> **“ අලුත් ව්‍යවස්ථාවක් හඳුන්වාදීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ට එරෙහිව දෝෂාභියෝග චෝදනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් හෝ පවත්නා ස්ථාවර නියෝග සංශෝධන කිරීම කෙරෙහි ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් තම අවධානය යොමු කිරීම මැනවි. ”**

මෙම අර්බුදය සම්බන්ධයෙන් මේ වන විට දේශීය මෙන්ම විදේශීය සංවිධාන රැසක් ද අදහස් දක්වමින් එය විසඳා ගැනීමේ වැදගත්කම අවධාරණය කර තිබේ.

18. හිටපු අගවිනිසුරුවරිය නිකුත්කළ විශේෂ නිවේදනය (2013-01-16 "අද" පුවත්පත)

19. 2013 ජනවාරි 20 රාවය කතුවැකිය

ස්වාධීන විනිශ්චයකාරවරුන් සහ නීතිඥයින්ගේ සැදුම්ලත් "අන්තර්ජාතික ජූරි කොමිසම" ප්‍රකාශකර ඇත්තේ "මෙම දෝෂාභියෝග ක්‍රියාවලිය සහ අගවිනිසුරුවරිය ඉවත් කිරීම අන්තර්ජාතික සම්මුතීන්, අධිකරණයේ ස්වාධීනත්වය හා නියමිත ක්‍රියාවලියෙන් තොරව සිදුවී ඇති බවයි. අන්තර්ජාතික සම්මුතීන්ට අනුව විනිසුරුවරයෙකු ඉවත් කිරීමේදී නිසි ක්‍රියාවලියක් අනුගමනය කරමින් නඩු විමසීමක් කළයුතු වුවත් මෙහිදී අගවිනිසුරුවරියට සාධාරණ නඩු විභාගයක් ලැබී නොමැති බවද ජූරි කොමිසම අවධාරණය කර තිබේ.

දෝෂාභියෝග ක්‍රියාවලිය සම්බන්ධයෙන් තම රජයේ දැඩි අවධානය යොමු වී ඇති බව ප්‍රකාශ කරන බ්‍රිතාන්‍ය රජය පවසන්නේ අගවිනිසුරු ශිරානි බණ්ඩාරනායක මහත්මියට එරෙහි දෝෂාභියෝගය ගෙන ඒම සඳහා අනුගමනය කරනු ලැබූ ක්‍රියාවලිය අධිකරණයේ ස්වාධීනත්වය සහ පොදු රාජ්‍ය මණ්ඩලයේ මූලධර්ම උල්ලංඝනය කරමින් සිදුවී ඇති බවයි.[20]

> "අන්තර්ජාතික සම්මුතීන්ට අනුව විනිසුරුවරයෙකු ඉවත් කිරීමේදී නිසි ක්‍රියාවලියක් අනුගමනය කරමින් නඩු විමසීමක් කළයුතු වුවත් මෙහිදී අගවිනිසුරුවරියට සාධාරණ නඩු විභාගයක් ලැබී නොමැති බවද අන්තර්ජාතික ජූරි කොමිසම අවධාරණය කර තිබේ."

## නිගමන හා යෝජනා

ඉහත කරුණු සලකා බලන විට අගවිනිසුරුවරියට එරෙහි දෝෂාභියෝගය විභාග කළ ක්‍රමවේදය හා එම ක්‍රියාවලිය අවසානයේ රට තුළ මතුව ඇති බල තුලනය පිළිබඳ ප්‍රශ්නය රටක් වශයෙන් වහා විසඳා ගත යුතු ගැටලුවක් බව පෙනේ.

ජාත්‍යන්තර සම්මුතීන්ට බැඳී ඇති රටක් ලෙස දෝෂාභියෝග ක්‍රියාවලියට එරෙහිව ජාත්‍යන්තරයෙන් මතු වෙමින් පවතින විරෝධතාවයට සාර්ථක පිළිතුරක් ලබාදීමට මේ දක්වා ශ්‍රී ලංකා රජය සමත් වී නැත.

එම නිසා ශ්‍රී ලංකාවේ අධිකරණයේ ස්වාධීනත්වය හා නීතියේ ආධිපත්‍ය ක්‍රියාත්මක වන ආකාරය සම්බන්ධයෙන් එල්ල වී ඇති අපවාදය දුරලීම සඳහා රජයක් ලෙස පහත කරුණු පිළිබඳව වහා ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාවය වඩ වඩාත් ඉස්මතුවෙමින් පවතී.

1) අගවිනිසුරුවරියට එරෙහි දෝෂාභියෝග ක්‍රියාවලියේදී ව්‍යවස්ථාදායකය, විධායකය මෙන්ම අධිකරණයෙන්ද වරදක් සිදුවී ඇත්දැයි සොයා බලා මින් මතු එවැනි වරදක් සිදුවීමට ඇති ඉඩකඩ වැළැක්වීමට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා දේශීයව සහ විදේශීයව පිළිගත් පුද්ගලයින්ගෙන් සැදුම්ලත් මහජන කොමිෂන් සභාවක් වැනි ස්වාධීන විමර්ශන ක්‍රියාවලියකට යා හැකිය.

2) අගවිනිසුරුවරියට එරෙහිව එල්ලවී තිබූ චෝදනා සම්බන්ධයෙන් අපක්ෂපාතී විනිශ්චය සභාවකට මුහුණදීමට අවස්ථාව සලසා දී තමන් පිළිබඳ සාධාරණ විනිශ්චයක් ලබාගැනීමට අගවිනිසුරුවරියට අවස්ථාවක් සලසා දිය යුතුය. එය රටක් වශයෙන් ශ්‍රී ලංකාව පිළිගෙන ඇති සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ 14 වැනි වගන්තිය ඇතුළුව අන්තර්ජාතික සම්මුතීන්ට අනුකූලව, ස්වාධීනව සිදුවිය යුතුය.

3) උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විෂම පැවැත්ම හෝ අබලතාවය පිළිබඳ චෝදනා විමර්ශනය කිරීමට හා තීන්දු ගැනීම සඳහා 2000 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත මගින් යෝජනා කර තිබූ ආකාරයේ ''පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් කවර හෝ රටක ඉහළම අධිකරණයේ විනිශ්චයකාර ධූරයන් දරන හෝ දැරුවාවූ තැනැත්තන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් ස්ථාපිත කළයුතු බවට විධිවිධානයක් ක්‍රියාවට නැංවිය යුතුය.

20. www.gov.uk බ්‍රිතාන්‍ය රජයේ නිල වෙබ් අඩවිය.

**ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා යනු දූෂණය මැඩලීම සිය මූලික අරමුණ කරගනිමින් ක්‍රියාත්මක වන ලොව ප්‍රමුඛතම ජාත්‍යන්තර සංවිධානයක් වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල්හි ශ්‍රී ලාංකික නියෝජිතායතනයයි. ලොව පුරා රටවල් රැසක ශාඛා සියයකට අධික ප්‍රමාණයක් ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් සමස්ත ජාලයම විනිවිදභාවය, වගවීම හා යහපාලන ප්‍රතිපත්ති ප්‍රවර්ධනය වෙනුවෙන් කැප වී සිටී.**

**පාලනය කෙරෙහි ජනතාවගේ අවබෝධය ඉහළ නංවමින් හා ඔවුන්ගේ සහභාගීත්වය වර්ධනය කරමින් මහජන සහය ඇතිව දූෂණයෙන් තොර සුපිළිපන් රටක් බිහිකර ගැනීම අපගේ ඉලක්කයයි.**

මෙම තත්ත්ව වාර්තාව පිළිබඳ ඔබගේ අදහස්

ප්‍රතිපත්ති හා පර්යේෂණ අංශය,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා,
අංක 06, 37 වන පටුමග, රැජින පාර,
කොළඹ 03

ලිපිනයට හෝ *research@tisrilanka.org*
වෙත දන්වා එවන්නේ නම් අතිශයින් කෘතඥ වෙමු.

2013 පෙබරවාරි

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
සුපිළිපන් දේශයක් උදෙසා

# එදා

සහ

# අද



ආධාර දෙන රටවලට අපි ගිහින් කිව්වෙ තමුන්නාන්සෙලට පුලුවන් නම් මේ මේ ඒව කපන්න කියා කියන්න...

මේ රටේ මිනිස්සුන්ගෙ **මානව අයිතිය** රකින්නැයි කියන එකත් මේ **ආණ්ඩුවට කියන්නය** කියන එකයි.

එසේ නම් ආධාර දීමේදී එය **කොන්දේසියක් වශයෙන්** දාන්නය කියන එක **වැරදිද** කියා මම තමුන්නාන්සේලාගෙන් අහනවා..

-මහින්ද රාජපක්ෂ - 1990. 10. 25 හැන්සාඩ්
- පිටු අංක 424



## නීතිය නිවාඩුවේ

සරුංගලේ නූල කැඩිලා
හුළඟේ යනවා වගේ
ලංකා ජනරජ ව්‍යවස්ථාවේ නූල් හැලිලා
කොළ හුළඟේ පාවෙනවා
'මම යකෝ රජ'
උඹලා ගූ කොල්ලෝ
කවුරු කවුරුත් වලිගේ අකුලාගෙන
ඇත් වෙලා උඩ බලාගෙන ඉඳලා
ඉඳලා හිටලා බුරනවා
නීතිය නිවාඩුවේ
කවුරුත් නීතියෙන් නිදහස් වෙලා
අවුල් වූ පාරක් වගෙයි රට
වැඩි දෙනෙක් මහ පාරේ
'යකෝ අපි රජවරු' ටික දෙනෙක් කියනවා




- බැසිල් ප්‍රනාන්දු